PR 6768

# අඳ ගොවීන්ගේ වර්ථමාන තත්ත්වය පිළිබඳ අධ්‍යයනය

ආර්. එල්. එන් ජයතිස්ස
චතුර සෙව්වන්දි විජේතුංග



HARTI

National Science Foundation
30 APR 2015
NSLRC
Colombo

# අද ගොවීන්ගේ වර්තමාන තත්ත්වය පිළිබඳ අධ්‍යයනය

**ආර්.එල්.එන්. ජයතිස්ස**

**චතුර සෙව්වන්දි විජේතුංග**

සිංහල පර්යේෂණ වාර්තා: අංක 48 2011 ඔක්තෝබර්

හෙක්ටර් කොබ්බෑකඩුව ගොවි කටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනය
114, විජේරාම මාවත,
කොළඹ 07.

ප්‍රථම මුද්‍රණය : 2011 ඔක්තෝබර්

© හෙක්ටර් කොබ්බෑකඩුව ගොවි කටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනය

සියලුම හිමිකම් ඇවිරිණි

ISBN : 978-955-612-130-8

පරිගණක ගත කිරීම : ඒ.පී. උදේනි කරුණාරත්න
මනෝජා තුෂාරි

පිටු සැකසුම හා කවර නිර්මාණය : ඒ.පී. උදේනි කරුණාරත්න

# පෙරවදන

අඳ ගොවියා යනු දුරාතීතයේ සිට ගොවිජන ක්ෂේත්‍රය තුළ රැඳී සිටි අතිශය වැදගත් කෘෂි පාර්ශ්වකරුවෙකි. 20 වන ශත වර්ෂයේ මැද භාගය වන විට අඳ ගොවි ජීවිකාව දුක් ගැහැටවලින් පිරුණු අස්ථිර එකක් බවට පත්ව තිබුණි. එකල අඳ ගොවීන් විශාල සංඛ්‍යාවක් සිටි අතර ඔවුහු ආහාර නිෂ්පාදනය වැනි අතිශය වැදගත් කාර්යක නියැළී සිටියහ. ඉඩම් හිමියන්ගේ අත්තනෝමතික පාලනයට හා විවිධ දුෂ්කරතාවන්ට මුහුණ දී සිටි අඳ ගොවීන්ගේ ජීවන වෘත්තියට සුරක්ෂිතභාවයක් ලබාදීම මගින් රටේ ජාතික ආහාර නිෂ්පාදනය ඉහළ නැංවීම 1958 අංක 01 දරණ අඳ ගොවි පනත හඳුන්වාදීමේ අරමුණ විය.

අඳ ගොවි පනතේ නීතිමය රැකවරණය යටතේ සුරක්ෂිත වූ අඳ ගොවි ක්‍රමය 2000 වර්ෂය දක්වා අඛණ්ඩව ක්‍රියාත්මක වෙමින් පැවතිණි. මේ වන විට විවෘත ආර්ථික ක්‍රමය හඳුන්වාදීම හා වී වගාව සම්බන්ධයෙන් රාජ්‍ය ප්‍රතිපත්තීන් අරඹයා සිදු කළ වෙනස්වීම් ආදිය නිසා මෙම ක්ෂේත්‍රය සම්බන්ධ සමාජ ආර්ථික පසුබිමෙහි බොහෝ වෙනස්කම් සිදු වෙමින් තිබුණි. නව ආර්ථික පසුබිම යටතේ සමාජයේ විවිධ ජීවන මාර්ග විවරව තිබූ අතර ඒ ඔස්සේ ඉඩම් හිමියන්ගේ පවුල් මෙන්ම අඳ ගොවීන්ගේ පවුල්ද ආර්ථික හා සාමාජීය වශයෙන් බොහෝ වෙනස්කම්වලට ලක්ව තිබුණි.

මේ අනුව අඳ ගොවි ක්‍රමය යටතේ වී වගාව නවීකරණය කිරීමේ අපේක්ෂාවෙන් හා 1958 අංක 01 දරණ අඳ ගොවි පනතේ සිට 2000 දක්වා ගත වූ කාලය තුළ අඳ ගොවි ක්‍රමය පිළිබඳව විවිධ විද්වතුන් හා විශේෂඥ කණ්ඩායම් විසින් සකසනු ලැබූ වාර්තා හා නිර්දේශද සලකා බලමින් 2000 අංක 46 දරණ ගොවිජන සංවර්ධන පනත කෙටුම්පත් කරන ලද අතර එහි අඳ ගොවිතැන සම්බන්ධව නව නීති ඇතුළත් කිරීමට පියවර ගෙන තිබුණි. මෙම නව පනතින් බලාපොරොත්තු වූ අපේක්ෂා කිසිවක් අඳ ගොවි ක්ෂේත්‍රය තුළ ඉටු නොවුන අතර අඳ ගොවිතැන සම්බන්ධ ප්‍රශ්න රාශියක් පැන නැගීම පමණක් සිදු විය. මෙම පසුබිම යටතේ පවතින තත්ත්වය අඳ ගොවීන්ගේ පවුල්වලට මෙන්ම ඉඩම් හිමියන්ටද අවාසිසහගත වන අතර එය ජාතික ආහාර නිෂ්පාදනයටද සෘජුව බලපායි.

මෙම ගැටළු සහගත තත්ත්වය මගහරවා අඳ ගොවීන් හා ඉඩම් හිමියන් යන දෙපාර්ශ්වයම තෘප්තියට පත්වන හා රටේ වී නිෂ්පාදනය තවදුරටත් ඉහළ නැංවීමට සහාය වන ආකාරයේ නව අඳ ගොවි පනතක් නිර්මාණය කිරීම සම්බන්ධයෙන් අඳ ගොවීන්ගේ, ඉඩම් හිමියන්ගේ හා ගොවිජන ක්ෂේත්‍රයේ නිලධාරීන්ගේ අදහස් ලබාදීමත්, එම කාර්යයේදී මෙම අධ්‍යයනය වර්තමාන අඳ ගොවීන්ගේ හා ඉඩම් හිමියන්ගේ සමාජ ආර්ථික තත්ත්වය පිළිබඳව අවබෝධය ලබා ගැනීම උදෙසා ප්‍රතිපත්ති සම්පාදකයන්ට හා විද්‍යාර්ථීන්ට මනා පිටුවහලක් සපයනු ඇතැයි යන්නත් මගේ හැඟීමයි.

**නීතිඥ ලලිත් කාන්ත ජයසේකර**

**අධ්‍යක්ෂ**

# ස්තුතිය

මෙම අධ්‍යයනය කාලීන අවශ්‍යතාවයක් සහිත කඩිනමින් අවසන් කළ යුතු අධ්‍යයන ක්ෂේත්‍රයක් ලෙස හඳුනා ගනිමින් එය ක්‍රියාවට නැංවීමේලා මඟ පෙන්වමින් මෙන්ම අවශ්‍ය මූල්‍ය හා ආයතනික ප්‍රතිපාදන ලබා දෙමින් අප ධෛර්යමත් කළ හෙක්ටර් කොබ්බෑකඩුව ගොවි කටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනයේ අධ්‍යක්ෂ නීතිඥ ලලිත් කාන්ත ජයසේකර මහතාට අපගේ හෘදයාංගම ස්තුතිය පුද කරමු.

පර්යේෂණ යෝජනාව සකස් කරන අවධියේ සිට ප්‍රශ්නාවලි සැකසීම හා ක්ෂේත්‍ර සමීක්ෂණය දක්වා වූ කාලය තුළ අවැසි මාර්ගෝපදේශකත්වය සැපයීමෙන්ද වාර්තාව ලියා අවසන් වූ පසු එය කියවා බලා පැවති අඩුපාඩු පෙන්වා දීමෙන් වාර්තාව වැඩි දියුණු කරගැනීමට අවශ්‍ය මගපෙන්වීම් සිදු කිරීමෙන් හා ප්‍රකාශනයක් ලෙස එළිදැක්වීමට අවශ්‍ය උපදෙස් නිහතමානීව ලබා දුන් නියෝජ්‍ය අධ්‍යක්ෂ (පර්යේෂණ) ආචාර්ය එල්.පී. රූපසේන මහතාටත්, පර්යේෂණ යෝජනාව සකස් කළ අවධියේ සිට ක්ෂේත්‍ර සමීක්ෂණය සිදු කිරීම හා වාර්තාව සකස් කිරීමේදී පසු විපරමින් හා කෙටුම්පත කියවා බලා අඩුපාඩු පෙන්වා දෙමින් වාර්තාවේ අඩුපාඩු අවම කිරීම සඳහා වෙහෙසී සිය කාලය කැප කළ කෘෂිකාර්මික ප්‍රතිපත්ති හා ව්‍යාපෘති ඇගයීම් අංශයේ අංශ ප්‍රධාන අධි පර්යේෂක ජේ.කේ.එම්.ඩී. චන්ද්‍රසිරි මහතාටත් ස්තුතිය පළ කිරීම යුතුකමකි.

මෙම අධ්‍යයනයේ අවසන් කෙටුම්පත සකස් කිරීමෙන් පසු නිර්ලෝභීව එය කියවා බැලීම සඳහා බාරගෙන වාර්තාව සංවර්ධනය කිරීම සඳහා වඩාත් අර්ථවත් යෝජනා ලබාදෙමින් තම කාලය කැප කළ මාතර දිස්ත්‍රික් හිටපු ගොවිජන සේවා නියෝජ්‍ය කොමසාරිස් ජේ. දික්මාදුගොඩ මහතාටද අපගේ අවංක ආදර ස්තුතිය පළ කිරීමට මෙය අවස්ථාව කර ගනිමු.

අවසන් කෙටුම්පත කියවා බලා අඩුපාඩු පෙන්වාදී වාර්තාව වැඩිදියුණු කිරීමට අවශ්‍ය මගපෙන්වීම් සිදු කළ මහාචාර්ය අයි. සිරිවීර මහතාටද අපගේ ප්‍රණාමය හිමි වේ.

මෙම අධ්‍යයනයේ ක්ෂේත්‍ර කටයුතු සඳහා ගොවිජන සහභාගීත්වය ලබා දෙමින් එය සාර්ථකව සිදු කිරීමට සහයෝගය ලබාදුන් හම්බන්තොට දිස්ත්‍රික්කයේ අම්බලන්තොට, මාමඩවල. මාතර දිස්ත්‍රික්කයේ කඹුරුපිටිය හා හක්මණ අනුරාධපුර දිස්ත්‍රික්කයේ හිදෝගම හා ඇලයාපත්තුව යන ගොවිජන සේවා මධ්‍යස්ථානවල ගොවිජන සංවර්ධන නිලධාරීන් හා කෘෂිකර්ම පර්යේෂණ නිෂ්පාදන සහකාරවරුන් තොරතුරු සැපයූ අඳගොවීන් හා ඉඩම්හිමියන් වෙතද අපගේ ගෞරවනීය ස්තුතිය හිමි වේ.

මෙම ක්ෂේත්‍ර සමීක්ෂණයේදී දත්ත සහ තොරතුරු සපයාදී අධ්‍යයනය සාර්ථක කරගැනීමට සහයෝගය ලබාදුන් පර්යේෂණ නිලධාරීන් වන එච්.එම්.ජේ.කේ. හේරත්, එස්.එම්.ඒ. සමරකෝන්, ඉන්දිකා ප්‍රියදර්ශනී, බී.ඒ.ඩී.එස්. බමුණුආරච්චි සහ සංඛ්‍යාන නිලධාරි සන්ධ්‍යා සේනානායක යන මහත්ම මහත්මීන්ටත් අපගේ ස්තුතිය පිරිනැමේ.

දත්ත විශ්ලේෂණ කටයුතු සිදු කළ සංඛ්‍යාන හා දත්ත සැකසුම් ඒකකයේ ඒකක ප්‍රධාන එම්.එල්.ඩී. සෙනරත් මහතා ඇතුළු කාර්ය මණ්ඩලයටත් අපගේ ස්තුතිය පිරිනැමේ.

වාර්තාව ප්‍රකාශයට පත් කිරීමේ කටයුතු සිදු කළ ප්‍රකාශන ඒකකයේ ප්‍රධාන, පුජිත ද මැල් මහතාටත්, කළමනාකරණ සංස්කරණ කටයුතු සිදු කළ ප්‍රවෘත්ති හා ප්‍රකාශන නිලධාරිණී වත්සලා ගමගේ මහත්මියටත්, වාර්තාව මුද්‍රණය කිරීමේ කටයුතු මැනවින් ඉටු කර දුන් මුද්‍රණ අංශයේ කාර්ය මණ්ඩලයටත් අපගේ ස්තුතිය පිරිනැමේ.

ආර්.එල්.එන්. ජයතිස්ස

චතුර සෙව්වන්දි විජේතුංග

## සංක්ෂේප

ශ්‍රී ලංකාවේ අඳ ගොවි ක්‍රමය සම්බන්ධ දීර්ඝ ඉතිහාසයක් ඇ
ගොවිතැන හා සම්බන්ධ ක්‍රියාවලිය නීතිමය රාමුවක් යටතට
පැවත ආ අඳ ගොවිතැන සම්බන්ධ ප්‍රබලතම ගැටළුව නිර්මාණ
සංවර්ධන පනත ඉදිරිපත් කිරීමත් සමඟය. මෙම පනතින් බල
සිටින ලද කුඹුරු ඉඩම් ඔවුන් විසින්ම මිලදී ගැනීමට පෙළඹවීම
ගෙවා ඉඩම් හිමියා විසින්ම ඉඩම ලබා ගැනීමයි. මෙම අපේක්ෂ
තිබීම නිසා පෙර මෙන් මුල් අඳ ගොවියාගෙන් පසු අනුප්‍රාප්
අලුතින් අඳ ගොවීන් බිහිවීම සිදු නොවීය. ඉඩම් මිල දී ගැනී
මුදල් පහසුකම් සැලසීම සඳහා ඉඩම් බැංකු ක්‍රමයක් ස්ථාපිත
කිසිවක් ක්‍රියාත්මක වූයේ නැත. මුල් අඳ ගොවියාගෙන් පසු
උරුමවීමේ නීතිමය පසුබිම මෙම පනත යටතේ අක්‍රිය වීම
සුරක්ෂිතතාවය ඉවත් විය. එසේ වුවත් රජයේ පොහොර
වාසිදායක තත්ත්වයන් යටතේ වී වගාව පිළිබඳ නව උද්
ගොවීන්ට දී තිබුණු ඉඩම් ආපසු ගැනීමට කටයුතු කිරීමත් ස

2008 වර්ෂයේ සංඛ්‍යා ලේඛන අනුව ශ්‍රී ලංකාවේ මුළු වී වග
වගා කරන බව හෙළි වේ. ඒ අනුව අඳ ගොවීන් විසින් අක්
හම්බන්තොට දිස්ත්‍රික්කයේ අඳ ගොවීන් 16767 දෙනෙකු වී වග
සැලකිය යුතු ප්‍රතිශතයක් අඳ ගොවීන් නියෝජනය කරන
කෘෂිකර්මාන්තය මුහුණ පා සිටින ගැටළු අධ්‍යයනය කිරීම දේ
බැවින් මෙම අධ්‍යයනය සිදු කරන ලදී. මෙම අධ්‍යයනය ප්‍රධාන
2010 කෙටුම්පත් කර ඇති නව අඳ ගොවි පනතේ එක් එක්
මෙන්ම ගොවිජන ක්ෂේත්‍රයේ නිලධාරීන්ගෙන් ඉලක්ක කණ්ඩායම්
හා ප්‍රශ්නාවලී සමීක්ෂණ ක්‍රමය මගින් අඳ ගොවීන්ගේ හා ඉ
අධ්‍යයනය කිරීමයි.

අභිනවයෙන් කෙටුම්පත් කරන ලද අඳ ගොවි පනත් කෙටුම්
**වශයෙන් එක් ඉඩම් හිමියෙකු යටතේ වගා කළ හැකි උ**
**සිදු කර ඇති යෝජනාව සම්බන්ධයෙන් ගොවීන්ගේ ගෙ**

කමිටුවේ තක්සේරු වටිනාකමද, විවෘත වෙළෙඳපොලේ වටිනාකමද සලකා බලා සාධාරණ මිලකට ඉඩම් විකිණීමට අවස්ථාව සැලසෙන තත්ත්වයක්ද යෝජනා කරන ලදී. එහිදී, මුදල් අගහිගකම් ඇති අඳ ගොවීන් සඳහා පහසු පොළී යටතේ ණය සැපයීමේ ආයතනයක් ස්ථාපිත කිරීමටද වැඩිදුරටත් යෝජනා විය. ගොයම් කැපීම සහ අස්වැන්න කමතින් ඉවත් කරගැනීමට අදහස් කරන දින අවම වශයෙන් දින 14කට කලින් ඉඩම් හිමියාට සහ ගොවිජන සංවර්ධන කමිටුවට දැනුම් දිය යුතුය යන යෝජනාවද අනුමත කෙරිණි. අස්වැන්න වැඩිවීමත් සමග ඉඩම් හිමියාට ගෙවන ප්‍රවේණිය වැඩි කිරීමට යෝජනා වූ අතර ඒ අනුව එක් එක් දිස්ත්‍රික්කවල විවිධ ප්‍රදේශවල සාමාන්‍ය වී අස්වැන්න ගණනය කර අස්වනු ඉහළ දිස්ත්‍රික්කයක දී ඉහළ ප්‍රවේණියක්ද අඩු දිස්ත්‍රික්කයක දී අඩු ප්‍රවේණියක්ද අදාළ දිස්ත්‍රික්කවල ගොවිජන සේවා නියෝජ්‍ය කොමසාරිස්වරුන් විසින් දැනුම් දෙනු ලැබීම සුදුසු බවට යෝජනා කිරීමත්, ප්‍රවේණිය, ගෙවීම පැහැර හැරීම, නියමිත කාල සීමාව තුළ බද්ද නොගෙවීම එනම් අස්වැන්න නෙළා දින 13ක් ඇතුළත ප්‍රවේණිය ගෙවිය යුතු බව හා දින 13 පසු වූ විට පළමු දිනයේ සිට හිග සේ සැලකීමටත් යෝජනා ඉදිරිපත් විය. අස්වැන්න ඉහළ මට්ටමකින් පවත්වාගෙන යාම සඳහා කාර්යක්ෂම ලෙස කුඹුරු වගා කොට ඉහළ අස්වනු නෙළා ඊට සාපේක්ෂව ඉහළ ප්‍රවේණියක් ගෙවීම සඳහා ගොවීන් පෙළඹවීම මගින් ජාතික නිෂ්පාදනය වැඩිවීමත් අඳ ගොවියා ආරක්ෂාවීමත් ඉඩම් හිමියන් තෘප්තිමත් වීමත් සිදුවනු ඇතැයි යෝජනා කෙරිණි.

අඳ ගොවියාගේ සමාජ ආර්ථික තත්ත්වය පිළිබඳ අධ්‍යයනයේදී හෙළි වූ කරුණු අනුව අඳ ගොවීන්ගෙන් 50%ක් නියෝජනය කරනුයේ අවු. 52-65 වයස් කාණ්ඩයයි. අධ්‍යාපන මට්ටම වුයේ ද්විතීයික අධ්‍යාපන මට්ටම වූ 6-13 ශ්‍රේණි දක්වා අධ්‍යාපනය ලබා තිබීමයි. මේ අතර මාතර දිස්ත්‍රික්කයේ අඳ ගොවීන්ගෙන් 6%ක් උපාධිධාරීන් වූ අතර අනුරාධපුර දිස්ත්‍රික්කයේ අඳ ගොවීන්ගෙන් 15%ක් පාසල් අධ්‍යාපනය නොලැබුවෝ වූහ. අඳ ගොවීන්ගෙන් බහුතරයකගේ ප්‍රධාන රැකියාව ගොවිතැන බව හෙළි වූ අතර ඒ හම්බන්තොට 93%ක්, මාතර 69%ක් හා අනුරාධපුර 77%ක් ලෙසිනි. ඔවුන් නිරතව සිටින වෙනත් රැකියා මාර්ග ඉතා අඩු බව හෙළි වන අතර හම්බන්තොට 84%, මාතර 69%, අනුරාධපුර 70%ක් වෙනත් රැකියාවක නිරත නොවන අතර එකම රැකියාව ගොවිතැන විය.

එක් අඳ ගොවියෙකුට ඉඩම් හිමියන් එක් කෙනෙකු හෝ කිහිප දෙනෙකු යටතේ වගා කිරීම කළ හැකි අතර සමීක්ෂණ තොරතුරු අනුව එක් ඉඩම් හිමියෙකු යටතේ පමණක් වගා කරන අඳ ගොවීන් වැඩි පිරිසක් හමු විය. අඳ ගොවිතැන කාලත්‍රයාට දරුවන්ට සහ ළග ලේ ඥාතීන්ට උරුමවීම නීතිය අනුව සිදුවන අතර වර්තමානයේ දී වැඩිම අඳ ගොවීන් සංඛ්‍යාවක් හමුවන්නේ දෙවන පරපුරේ අය ලෙසිනි. එනම් පිය පුතු සම්බන්ධතාවයයි. ඉඩම් හිමියා හා අඳ ගොවියා අතර ඥාති සම්බන්ධතාවයක් හෙළි නොවේ. අඳ කුඹුරුවල ප්‍රවේණිය ගෙවීම සම්බන්ධයෙන් විමසීමේදී අනුරාධපුරය හා හම්බන්තොට යන දිස්ත්‍රික්කවල අඳ ගොවීන්ගේ බහුතර කැමැත්ත වූයේ ස්ථාවර ප්‍රවේණිය ගෙවීම වන අතර මාතර වැඩි කැමැත්ත 1/4 ප්‍රවේණිය ගෙවීමය. අඳ ගොවි පවුල්වල සෙසු සාමාජිකයන්ගේ අධ්‍යාපන මට්ටම අනුව බහුතරය ද්විතීක අධ්‍යාපනය පමණක් ලබා සිටින අය වේ. මෙම පවුල්වල සාමාජිකයන්ගේ ජීවන මාර්ග වශයෙන් හෙළි වී අත්තේ කෘෂිකර්මයෙන් බැහැර වෙනත් ස්ථාවර රැකියා මාර්ග නොව පවුලේ කෘෂිකාර්මික කටයුතුවලටම උදවු වීමයි.

ඉඩම් හිමියාගේ සමාජ ආර්ථික තත්ත්වය සම්බන්ධයෙන් විමසීමේ දී ඉඩම් හිමියන්ගේ වයස් ව්‍යාප්තිය අනුව බහුතරය අවු 55 හෝ ඊට වැඩි වයස්වල සිටින බව හෙළි විය. ඔවුන්ගේ රැකියා නියුක්තිය 75%ක් විය. රැකියාවක් ලෙස ගොවිතැනෙහිම නිරතව සිටි පිරිස ඉඩම් හිමියන්ගෙන් 39%ක් විය. සෙසු පිරිස පෞද්ගලික අංශයේ රැකියා හා වෙළෙඳාම, යනාදී රැකියාවල නිරතව සිටියහ.

තම කුඹුර අඳ ගොවියෙකුට දී වගා කරගැනීමට හේතුව ලෙස අනාවරණය වූයේ ඉඩම් හිමියාට වගාව සඳහා යෙදීමට කාලය මදිවීම හා අඳ ගොවියාද සමග ඉඩම මිලට ගැනීමට සිදු වීමය. ඉඩම් හිමියන් සතු අඳ ගොවීන් පිළිබඳව සැලකූ විට ඉඩම් හිමියන් 57%ක් තමන් යටතේ එක් අඳ ගොවියෙකු පමණක් වගාවට යොදවා ගෙන

තිබුණි. හම්බන්තොට දිස්ත්‍රික්කයේ ඉඩම්හිමියන් 77%කට එක් අඳ ගොවියෙකු සිටි අතර අනුරාධපුර දිස්ත්‍රික්කයේ ඉඩම් හිමියන් 62%කට අඳ ගොවීන් දෙදෙනෙකු සිටි බව හෙළි විය.

ඉඩම් හිමියන් විසින් අඳ ගොවීන්ට වගාව සඳහා ලබාදී තිබූ ඉඩම් විශාලත්වය අනුව බලන කල හම්බන්තොට වැඩි ඉඩම් ප්‍රමාණයක් (61%ක්) අක්කර 1-3 අතර විය. මාතර දිස්ත්‍රික්කයේ අඳයට දුන් ඉඩම්වලින් 29%ක් අක්කර 1 ට අඩු වූ අතර අක්කර 1-3 අතර විශාලත්වයක් සහිත ඉඩම් 29% ද, අක්කර 3-5 අතර විශාල ඉඩම් ද 29% විය. අනුරාධපුර 37% අක්කර 1-3 අතර ප්‍රමාණයේ ද තවත් 37%ක් අක්කර 3-5 තරම් විශාලත්වයේද ඒවා බව හෙළි විය.

ප්‍රවේණිය ලබා ගැනීම සම්බන්ධව ඉඩම් හිමියන්ගේ ප්‍රතිචාරය අනුව ඉඩම් හිමියන්ගෙන් 43%ක් අස්වැන්නෙන් 1/4ක් ප්‍රවේණිය ලෙස ලබා ගැනීමට කැමැත්ත පළ කර ඇති අතර, 25%ක් යම් නිශ්චිත වී බුසල් ප්‍රමාණයක් ප්‍රවේණිය ලෙස ලබා ගැනීමට කැමතිව සිටියහ.

කුඹුරු ඉඩම් විකිණීම සම්බන්ධයෙන් ඉඩම් හිමියන්ගේ 82%ක ප්‍රතිචාරය වූයේ ඉඩම් විකිණීමට අකමැති බවය. අඳ ගොවීන් විසින් කුඹුරෙන් ලබා ගන්නා ලද අස්වැන්න පිළිබඳ ඉඩම් හිමියන්ගේ ප්‍රතිචාරය වූයේ කුඹුරෙන් වැඩි අස්වැන්නක් ලබා ගැනීමට නම් කුඹුර අයිතිකරු විසින්ම වගා කිරීම අවශ්‍ය බව යි.

# පටුන


| | | පිටු අංකය |
|---|---|---|
| පෙරවදන | | iii |
| ස්තුතිය | | iv |
| සංක්ෂේපය | | v |
| පටුන | | viii |
| වගු සටහන් | | x |
| ප්‍රස්තාර සටහන් | | xi |
| ඇමුණුම් | | xii |
| **පළමු පරිච්ඡේදය** | | |
| **හැඳින්වීම** | | |
| 1.1 | අධ්‍යයනයේ පසුබිම | 01 |
| 1.2 | අධ්‍යයන ගැටලුව | 02 |
| 1.3 | අධ්‍යයනයේ අවශ්‍යතාවය | 03 |
| 1.4 | අධ්‍යයනයේ පරමාර්ථ | 03 |
| 1.5 | පර්යේෂණ ක්‍රමවේදය | 04 |
| 1.6 | අධ්‍යයනයේ සීමා | 05 |
| 1.7 | වාර්තාවේ සැකැස්ම | 05 |
| **දෙවැනි පරිච්ඡේදය** | | |
| **අඳ ගොවි පනතේ විකාශනය** | | |
| 2.1 | හැඳින්වීම | 07 |
| 2.2 | ඓතිහාසික හා නෛතික පදනම | 07 |
| | 2.1.1 තට්ටු මාරු සහ කට්ටි මාරු ක්‍රම | 09 |
| 2.3 | 1887 අංක 27 දරණ ආඥා පනත | 10 |
| 2.4 | 1953 කුඹුරු පනත | 10 |
| 2.5 | 1958 අංක 01 දරණ කුඹුරු පනත | 11 |
| 2.6 | 1973 අංක 42 දරණ කෘෂිකාර්මික ඉඩම් පනත | 13 |
| 2.7 | 1979 අංක 58 දරණ ගොවිජන සේවා පනත | 13 |
| 2.8 | 1991 අංක 04 දරණ ගොවිජන සේවා පනත (සංශෝධිත) | 15 |
| 2.9 | වර්ෂ 2000 අංක 46 දරණ ගොවිජන සංවර්ධන පනත | 16 |
| **තෙවැනි පරිච්ඡේදය** | | |
| **අඳ ගොවීන්ගේ හා ඉඩම් හිමියන්ගේ සමාජ ආර්ථික තත්ත්වය** | | |
| 3.1 | හැඳින්වීම | 19 |
| 3.2 | අඳ ගොවීන්ගේ සමාජ හා ආර්ථික තත්ත්වය | 19 |
| 3.3 | ඉඩම් හිමියන්ගේ සමාජ හා ආර්ථික තත්ත්වය | 30 |

සිව් වැනි පරිච්ඡේදය

2000 අංක 46 දරණ ගොවිජන සංවර්ධන පනත හේතුවෙන් ගොවිජන ක්ෂේත්‍රයේ උද්ගත වී ඇති ගැටළු

4.1 හැඳින්වීම 39

4.2 අද ගොවීන් මුහුණපාන ගැටලු 39

4.3 ඉඩම් හිමියන් මුහුණපාන ගැටලු 40

4.4 පොදු ගැටලු 41

පස්වන පරිච්ඡේදය

වර්ෂ 2010 යෝජිත අද ගොවි පනත් කෙටුම්පතෙහි සංශෝධනය විය යුතු වගන්ති පිළිබඳ අද ගොවීන්, ඉඩම් හිමියන් සහ නිලධාරීන්ගේ අදහස් හා යෝජනා

5.1 හැඳින්වීම 42

5.2 වෙනත් යෝජනා 52

හයවැනි පරිච්ඡේදය

නිගමන හා නිර්දේශ

6.1 හැඳින්වීම 54

6.2 නිගමන 54

6.3 නිර්දේශ 57

ආශ්‍රිත ග්‍රන්ථ නාමාවලිය 59

## වගු සටහන්

පිටු අංකය

01. එක් එක් වයස් කාණ්ඩවලට අයත් අඳ ගොවීන් සංඛ්‍යාව 20
02. අඳ ගොවීන්ගේ ප්‍රධාන රැකියා මාර්ග 21
03. අඳ ගොවීන් යෙදී සිටින වෙනත් ජීවන මාර්ග 22
04. අඳ ගොවියකු වශයෙන් වගා කටයුතු කර තිබෙන කාලය 23
05. නියෝජනය කරන පරපුර අනුව අඳ ගොවීන් වර්ගීකරණය 24
06. අඳ ගොවි පරපුරේ සම්බන්ධතාවය 25
07. ඉඩම් හිමියා සහ අඳ ගොවියා අතර සම්බන්ධතාවය 26
08. ප්‍රවේණිය ගෙවීමේ ක්‍රමය අනුව අඳ ගොවීන්ගේ ප්‍රමාණය 27
09. අඳ ගොවි පවුල්වල සාමාජිකයන්ගේ රැකියා මාර්ග 29
10. අනුරාධපුර මාතර හා හම්බන්තොට දිස්ත්‍රික්කවල සමීක්ෂණයට ලක්කළ ඉඩම් හිමියන්ගේ වයස් ව්‍යාප්තිය (2010) 30
11. ඉඩම් හිමියන් නිරතවන කාර්යයන් අනුව ව්‍යාප්තිය 30
12. ඉඩම් හිමියන්ගේ ප්‍රධාන රැකියාව අනුව ව්‍යාප්තිය 31
13. එක් එක් ඉඩම් හිමියා යටතේ සිටින අඳ ගොවීන් සංඛ්‍යාව අනුව ඉඩම් හිමියන්ගේ ව්‍යාප්තිය 32
14. ඉඩම් හිමියන් විසින් අඳ ගොවීන්ට වගා කිරීමට ලබා දුන් කුඹුරු ඉඩම් ප්‍රමාණය අනුව ව්‍යාප්තිය 32
15. ප්‍රවේණිය ලැබීම පිළිබඳ ඉඩම් හිමියන්ගේ ප්‍රතිචාර 33
16. ඉඩම් සම්බන්ධ ගැටලු 34
17. අඳ ගොවීන් විසින් ලබා ගන්නා අස්වැන්න පිළිබඳ ඉඩම් හිමියන්ගේ ප්‍රතිචාර 36

## ප්‍රස්තාර සටහන්

පිටු අංකය


| | | |
|---|---|---|
| 01. | අඳ ගොවීන්ගේ අධ්‍යාපන මට්ටම | 21 |
| 02. | එක් අඳ ගොවියකු විසින් ඉඩම් හිමියන් කිහිප දෙනෙකු යටතේ වගා කරනු ලැබීම | 24 |
| 03. | අඳ ගොවි පවුල්වල සාමාජිකයන්ගේ අධ්‍යාපන මට්ටම | 28 |
| 04. | අඳ ගොවි පවුල්වල සාමාජිකයන්ගේ රැකියා මාර්ග | 29 |
| 05. | ප්‍රවේණිය ලබා ගැනීමට ඇති කැමැත්ත අනුව ඉඩම් හිමියන් වර්ගීකරණය | 35 |
| 06. | කුඹුරුවලින් ආදායම් වැඩි කරගැනීම සඳහා ගත යුතු ක්‍රියාමාර්ග | 36 |

## ඇමුණුම්


පිටු අංකය

01. හම්බන්තොට දිස්ත්‍රික්කයේ කෘෂිකාර්මික පොදු තොරතුරු 60
02. හම්බන්තොට දිස්ත්‍රික්කයේ ගොවිජන සේවා මධ්‍යස්ථාන අනුව ඉඩම් හිමි ගොවීන් සම්බන්ධ තොරතුරු 60
03. වගා කරන ඉඩම් ප්‍රමාණය අනුව අඳ ගොවීන් වර්ගීකරණය 61
04. වාරි ක්‍රමය අනුව අඳ ගොවීන් සංඛ්‍යාව 61
05. හම්බන්තොට ගොවිජන සංවර්ධන දිස්ත්‍රික් කාර්යාලයට ලැබෙන ගොවි පැමිණිලිවල ස්වභාවය අනුව වර්ග කර දැක්වීම 62
06. ගොවිජන සංවර්ධන මධ්‍යස්ථාන අනුව සිදු කරන පරීක්ෂණවල වර්ගීකරණය 62
07. දිස්ත්‍රික් කාර්යාලයේ දැනට පවතින කරුණු විමර්ශන, පැමිණිලි හා අධිකරණයේ විභාග වෙමින් පවතින නඩු 63
08. ශ්‍රී ලංකාවේ දිස්ත්‍රික්ක කිහිපයක 2010 වර්ෂයේ දී අඳ ගොවි ක්‍රමය යටතේ වී වගා කිරීම පිළිබඳ විස්තර 64
09. ඉලක්ක කණ්ඩායම් සාකච්ඡා සඳහා සහභාගී වූවන්ගේ සංඛ්‍යා ලේඛන 64
10. අඳ ගොවි ක්‍රමයේ වර්තමාන තත්ත්වය පිළිබඳ අධ්‍යයන ප්‍රශ්නාවලිය (ඉඩම් හිමියන්ගෙන්) 65
11. අඳ ගොවි ක්‍රමයේ වර්තමාන තත්ත්වය පිළිබඳ අධ්‍යයන ප්‍රශ්නාවලිය (අඳ ගොවීන්ගෙන්) 72

## පළමු පරිච්ඡේදය

# හැඳින්වීම

### 1.1 අධ්‍යයනයේ පසුබිම

කුඹුරු පනත ඉදිරිපත් කිරීමට තුඩු දුන් සමාජ ආර්ථික පසුතලයට දීර්ඝ ඉතිහාසයක් ඇත. සිංහල රාජ්‍ය සමයේ මෙරට ක්‍රියාත්මක වූයේ අර්ධ වැඩවසම් සමාජ සංවිධානයකි. එකල රටේ සියළුම ඉඩම් රජු සතුව පැවතුණි. රජුගේ රාජකාරිය ඉටු කිරීම වෙනුවෙන් හා ජීවත්වීම සඳහා රජු විසින්ම රටේ ප්‍රභූ පන්තිය වෙත ඉඩම් ලබා දී තිබුණි. මහනුවර යුගයේදී උඩරට රදළයන් හා පහතරට වලව් පැලැන්තියේ ප්‍රභූන් අතට මෙසේ විශාල ඉඩම් ප්‍රමාණයක් ලැබුණි. මෙයට අමතරව පූජනීය ස්ථාන සඳහා පූජා කළ ඉඩම් ප්‍රමාණයද විශාලය. මෙම ඉඩම්, වගා කිරීම සඳහා ගොවීන්ට ලබා දී තිබුණි. නමුත් ඉඩම්වල ඵලදාවෙන් වැඩි කොටස හිමිවූයේ ඉඩම්වල වගා කළ ගොවියාට නොව ඉඩම් හිමියාටය.

මෙරට ජනතාවගේ ප්‍රධාන ආහාරය බත් වූ නිසාම සමාජය තුළ කුඹුරු වගා කරන ගොවියාගේ කාර්යය අතිශයින්ම වැදගත් විය.

කුඹුරු වගා කළ ගොවීහු වර්ග තුනකට අයත් වූහ. ඒ ඉඩම් හිමි ගොවීන්, කුළී ගොවීන් හා අඳ ගොවීන් යනුවෙනි. ඉඩම් අයිතිකරු කුඹුරක් වගා කරන්නේ නම්, ඔහු ඉඩම් හිමි ගොවියා වේ. දෛනික කුළියට ඉඩම් වගා කළ ගොවියා කුළී ගොවියා ලෙස සැලකුණි. වෙනත් කෙනෙකුගේ කුඹුරක් වගා කළ ගොවියා අඳ ගොවියා ලෙස හැඳින්විණි. ඒ අනුව අඳ ගොවියා යනු අස්වැන්නෙන් කොටසක් දීමට ලිඛිත හෝ වාචික ගිවිසුමක් මගින් පොරොන්දු වී භුක්ති විඳීමට අවසර ලත් පුද්ගලයා වෙයි.

මෙහි දී අඳ ගොවියාගේ තත්ත්වය බෙහෙවින් කණගාටුදායක විය. වෙනත් ඉඩම්වල අයිතියක් නොමැති වූ ඔහුට අඳ ක්‍රමයට වගා කළ කුඹුරෙන් ලැබුණේ අස්වැන්නෙන් 1/4ක් හෝ 1/3ක් තරම් සුළු කොටසකි. වැඩි පංගුව ලබා ගන්නේ ඉඩම් හිමියාය. ඒ නිසා අඳ ගොවියා ණය බරින් මිරිකුණි. අඳ ගොවියා තමන් කැමති විටෙක ඉඩමෙන් ඉවත් කිරීමේ හැකියාව ඉඩම් හිමියාට තිබුණි. එබැවින් ඔහුගේ ජීවන වෘත්තිය අස්ථිර විය. සිය රැකියාවේ ස්ථිරත්වය උදෙසා ඉඩම් හිමියාගේ සිත දිනාගත යුතු වූ හෙයින් අඳ ගොවියාට කුඹුරු හිමියාගේ සියළුම බැල මෙහෙවර කරන්නටද සිදු වී තිබුණු අතර ඔහු වහලෙකුගේ තත්ත්වයටද පත්වී තිබුණි (හැන්සාඩ් වාර්තාව, 2000). උඩරට ප්‍රදේශවල කුඹුරු ඉඩම් හිඟය නිසා කුඹුරු අහිමි පුද්ගලයන් බලවත් අසීරුතාවයට පත්වී තිබුණි. එම අස්ථිරතාවය නිසා කුඹුරු වගා කිරීම පිණිස හා ඒ කුඹුරු වැඩිදියුණු කිරීම පිණිස ගොවීන් වැඩි උත්සාහයක් ගත්තේ ද නැත (හැන්සාඩ් වාර්තාව, 1957). උඩරට ප්‍රදේශයේ පැවති මඩරන් ක්‍රමය අනුව ඉඩම් හිමියා විසින් තම කුඹුරු ඉඩම් වසරින් වසර වෙන්දේසි කරනු ලැබිණි. එනම් වගා කන්නයට පෙර කුඹුරු ඉඩම් වෙන්දේසියේ දමා වැඩිම කොටසක් ප්‍රවේණිය ලෙස දීමට ඉදිරිපත් වන්නාට කුඹුරු ලබා දීමයි. අඳ කුඹුරක් ලබා ගැනීම සඳහා සියළුම කැවිලිවලින් සමන්විත කැවිලි කදක් ඉඩම් හිමියා වෙත ගෙන ගොස් දී ඉඩම් ඉල්ලා සිටීමක්ද මෙම ප්‍රදේශයේ පැවතුණි. මෙය *දැකුම්* නමින් හැඳින්වේ. මෙහි දී වැඩිම *දැකුම්* පෙට්ටිය ගෙන ගිය පුද්ගලයාට කුඹුර ලබා දීමට ක්‍රියා කර තිබේ (වනිගරත්න, 1977). මේ අනුව මෙම කන්නයේ *දැකුම්* පෙට්ටිය ගෙන ගිය පුද්ගලයාට

වඩා වැඩි ප්‍රමාණයකින් ඊළඟ කන්නයේ වෙනත් අයකු විසින් රැගෙන යන ලද්දේ නම් ඔහුට කුඹුර වගා කිරීමේ අයිතිය ලැබිණි.

මෙසේ ගොවිජන සමාජයේ පැවති තත්ත්වය හමුවේ අඳ ගොවියාගේ අයිතිවාසිකම් සුරක්ෂිත කිරීමේ අරමුණින් 1958 අංක 1 දරණ කුඹුරු පනත නිර්මාණය කරන ලදී. ක්‍රමිකව සුළු සුළු වෙනස්කම්වලට භාජනය කරමින් කාලීන අවශ්‍යතාවයන් අනුව 1973, 1979 හා 1991 යන වර්ෂවල දී අඳ ගොවීන් සම්බන්ධ නව පනත් ඉදිරිපත් කරන ලදී. මෙම පනත් මඟින් අඳ ගොවීන් හා ඉඩම් හිමියන් යන දෙපිරිසම ආරක්ෂා කිරීම අරමුණ විය. ඉන් පසුව ඉදිරිපත් කරන ලද වර්ෂ 2000 අංක 46 දරණ ගොවිජන සංවර්ධන පනත අඳ ගොවියා නැමති පුද්ගලයා ඉඩම් හිමියකු බවට පත් කිරීමේ අරමුණින් ඉදිරිපත් කරන ලද්දකි.

## 1.2 අධ්‍යයන ගැටලුව

වර්ෂ 2000 අංක 46 දරණ ගොවිජන සංවර්ධන පනතින් දක්වා ඇති යෝජනාවලින් බලාපොරොත්තු වුයේ වසර 02 ක් තුළ අඳ ගොවීන් වගා කරමින් සිටි ඉඩම් ඔවුන් විසින්ම මිලදී ගැනීමට පෙළඹවීමයි. එසේ නැතහොත් ඉඩම් හිමියන් අඳ ගොවියාට යම් කිසි සාධාරණ වන්දි මුදලක් ගෙවා එම ඉඩම් ආපසු ගැනීමට පෙළඹවීමයි. එම අපේක්ෂාව අනුව මෙම ගොවිජන සේවා පනතේ නීති සකසා තිබීම නිසා අඳ ගොවියාගෙන් පසුව එම ඉඩම අනුප්‍රාප්තිකයෙකුට, බිරිඳට, වැඩිමල් දරුවාට හෝ ඥාතියෙකුට උරුමවීමේ මෙතෙක් පැවැති ක්‍රමය තවදුරටත් ක්‍රියාත්මක කරවීමට පනතින් ප්‍රතිපාදන දක්වා නොතිබිණි. එම පනතේ හේතුවෙන් මුල් අඳ ගොවියාගෙන් පසු අලුතින් අඳ ගොවියන් බිහිවීම නැවතීම සිදු විය. ඉඩම් මිලදී ගැනීම සඳහා මූල්‍ය ප්‍රතිපාදන සැලසීමට මෙම පනතින් යෝජනා කර තිබුණි (2000 අංක 46 දරණ පනත). නමුත් එවැනි කිසිවක් ඉටු නොවීමෙන් මෙතෙක් පැවති අඳ ගොවියාගේ සුරක්ෂිතතාවය පිරිහීම සිදු විය. අඳ ගොවියා මිය ගිය පසුව අනුප්‍රාප්තිකයෙකු නම් කිරීම, බිරිඳට, දරුවන්ට උරුමවීම වැනි ක්‍රියාවලියද නැවතුන නිසා අඳ ගොවි පවුල් අවිනිශ්චිත තත්ත්වයට  පත් විය.  අනුප්‍රාප්තිකයෙකු නම් කිරීමට ඉඩකඩ පැවතීම, බිරිඳට හා දරුවන්ට අඳ අයිතිය උරුමවීම වැනි මෙතෙක් පැවති ක්‍රමය පිළිබඳව අඳ ගොවි පවුල්වල බලාපොරොත්තු මෙම පනත අනුව ඉටු නොවන තත්ත්වයක් උදාවීම නිසා අඳ ගොවි පවුල් හා ඉඩම් හිමියන් අතර ආරවුල් ඇති වී තිබේ. එවැනි වාතාවරණයකදී අඳ ගොවියාගේ පවුලේ සාමාජිකයන් විසින් කළ යුතු යයි දක්වන ලද පිළියමක්ද මෙම පනතේ සඳහන් වී නොතිබුණි. එය මෙම පනතේ තවත් අඩුපාඩුවකි. අනුප්‍රාප්තිය නැවතියේ වී නමුත් අඳ ගොවියාගේ උරුමකරුවන් කුඹුරෙන් බැහැර නොවීය. මේ නිසා අඳ ගොවියා හා ඉඩම් හිමියා අතර වූ හොඳ හිත පළුදු විය. එය සංස්කෘතියට හා සාරධර්මවලට බලපෑවේය. වර්තමාන රජයේ කෘෂිකාර්මික ප්‍රතිපත්ති වන පොහොර සහනාධාරය, වී සඳහා ඉහළ මිලක් ලබාදීම වැනි සානුබල තත්ත්ව යටතේ වී වගාවෙන් ලබා ගත හැකි ලාභය වැඩිවීම මත,  පැවති තත්ත්වයට සාපේක්ෂව වී වගාව වඩාත් වාසි සහගත වීම  නිසා ඉඩම් හිමියන්ද වී වගාව කෙරෙහි උනන්දුවක් දැක්වීමත් සමග මෙම තත්ත්වය තවත් උග්‍ර වී ඇත.  එම නිසා අඳ ගොවියා සහ ඉඩම් හිමියා අතර ගැටුම් සහ අවිශ්වාසය ගොඩනැගී ඇත.  මෙම පසුබිම මත හම්බන්තොට දිස්ත්‍රික්කයේ ගොවිජන සංවර්ධන මධ්‍යස්ථාන 14ක් තුළ 2009 වර්ෂයේ දී අඳ ගොවිතැන සම්බන්ධව වාර්තා වී ඇති ගැටලු සංඛ්‍යාව 424කි. අඳ ගොවීන් නෙරපීමට දරන උත්සාහයන් විශාල සංඛ්‍යාවක් වාර්තා වී ඇති අතර පනත

යටතේ පිහිටුවීමට යෝජිත ගොවිජන විනිශ්චය සභා අක්‍රියවීම නිසා එම පැමිණිලි ගොඩගැසී තිබේ. අඳ ගොවියා ප්‍රවේණිය නිසි පරිදි හොඳම වී වලින් නොගෙවා බොල් වී ලබාදීම, ගොයම් කපන දින 10කට පෙර ඒ බැව් ඉඩම් හිමියාට දැනුම් නොදීම වැනි යුතුකම් හරිහැටි ඉටු නොකරන තත්ත්වයක්ද වාර්තා වී ඇත. මේ නිසා අඳ ගොවි, ඉඩම් හිමි ආරවුල් උත්සන්න වී ඇත. මෙම ආරාවුල් සහගත තත්ත්වය හා අඳ ගොවි අයිතිය පිළිබඳ සුරක්ෂිතතාවයක් නොමැතිකම වී නිෂ්පාදන ඵලදායිතාවයටද අවසාන වශයෙන් එය රටේ ජාතික නිෂ්පාදනයටද බලපානු ලැබේ. මෙම තත්ත්වය තුළ අඳ ගොවීන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීමට ක්‍රියා කිරීම කාලීන අවශ්‍යතාවයක් බව මහින්ද චින්තන ඉදිරි දැක්ම ප්‍රතිපත්ති ප්‍රකාශය මඟින්ද අවධාරණය කරයි (මහින්ද චින්තන ඉදිරි දැක්ම, පිටුව 83). මෙලෙස සමාජය තුළ අඳ ක්‍රමය සම්බන්ධයෙන් උද්ගතව පවතින ගැටලුවලට විසඳුම් ලෙස මෙයට වසර කිහිපයකට පෙර සිට නව අඳ ගොවි පනතක් කෙටුම්පත්කර ඇති නමුත් එහි යම් යම් කරුණු සම්බන්ධවද ගැටළු සහගත තත්ත්වයක් මතුවී තිබේ.

## 1.3 අධ්‍යයනයේ අවශ්‍යතාවය

වර්තමාන ශ්‍රී ලංකාවේ වී වගා කරන ලද මුළු බිම් ප්‍රමාණයෙන් 13%ක් අඳ භුක්ති ක්‍රමය මත වගා කරන බව 2008 දත්ත අනුව හෙළි වේ. ඒ අනුව මෙයට සම්බන්ධ වී සිටින අඳ ගොවීන් සංඛ්‍යාවද අතිවිශාලය (245,603) (කෘෂිකාර්මික සංඛ්‍යාන දත්ත වාර්තාව, 2002). ප්‍රධාන වී වගා ප්‍රදේශයක් වන හම්බන්තොට දිස්ත්‍රික්කය තුළ පමණක් 2010 වර්ෂය වන විට අඳ ගොවීන් 16,767 දෙනෙකු සිටි බවට වාර්තා වූ අතර ඔවුන් විසින් හෙක්ටයාර 6,979ක වී වගා කර තිබුණි (ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව, හම්බන්තොට). මෙම කරුණු අනුව ශ්‍රී ලංකාවේ ප්‍රධාන වී වගා දිස්ත්‍රික්කයන් හි ගොවි ජනතාව අතුරින් සැලකිය යුතු ප්‍රතිශතයක් අඳ ගොවීන් නියෝජනය කරයි. එම නිසා අඳ ගොවීන්ගේ ගැටලු මෙන්ම ඒ හා අදාළව කෘෂිකර්මාන්තය මුහුණ පා ඇති ගැටලු අධ්‍යයනය කිරීම කෘෂිකර්මයේ උන්නතිය සඳහා හේතු වන්නකි. වර්තමාන අඳ ගොවිතැන පෙර සඳහන් කළ පරිදි අනාරක්ෂිත තත්ත්වයකට පත්වීම මත ගැටලු රාශියක් උද්ගත වී ඇත. එය අඳ භුක්ති ක්‍රමය යටතේ වගා කරමින් පවතින ඉඩම් ප්‍රශස්ථ මට්ටමේ නිෂ්පාදන කාර්යයක් සඳහා යොදවා ගැනීමට බාධකයක් වී ඇත. එම බාධක මගහරවා කාර්යක්ෂම ලෙස මෙම ඉඩම් වගා කිරීමට අවශ්‍ය ප්‍රතිපත්ති සකස් කිරීමට ඉවහල් වන තොරතුරු ජනිත වන ආකාරයේ සවිස්තරාත්මක අධ්‍යයනයක් මෑත කාලයේ සිදු කර නොමැත. එහෙයින් මෙම යෝජිත පර්යේෂණය සිදු කිරීම කාලීන අවශ්‍යතාවයකි.

## 1.4 අධ්‍යයනයේ පරමාර්ථ

මෙම අධ්‍යයනයේ මූලික පරමාර්ථය වන්නේ, වර්තමාන ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මක වන අඳ භුක්ති ක්‍රමය හා එහි පවතින ගැටලු පිළිබඳව සොයා බැලීමත්, ඒ තුළින් අඳ ගොවීන් හා ඉඩම් හිමියන් යන දෙපාර්ශ්වයේම අයිතිවාසිකම් සුරක්ෂිත කිරීමට අදාළ විධිවිධාන සහිත වූ නව පනතක් සකස් කිරීම සඳහා ගොවිජන සමාජයේ යෝජනා හා අදහස් පදනම් කරගත් නිර්දේශ ඉදිරිපත් කිරීමත්ය.

**විශේෂිත පරමාර්ථ**

01. අඳ ගොවීන් සහ ඉඩම් හිමියන්ගේ සමාජ ආර්ථික තත්ත්වය විමසා බැලීම.
02. 2000 අංක 46 දරණ ගොවිජන සංවර්ධන පනත ඉදිරිපත් කිරීමෙන් පසු අඳ භුක්ති ක්‍රමය සම්බන්ධයෙන් ක්ෂේත්‍රයේ උද්ගත වී ඇති ප්‍රශ්න සහ ගැටලු හඳුනා ගැනීම.
03. එම ගැටළුවලට පිළියම් ලෙස දැනට යෝජිත පනත් කෙටුම්පත පිළිබඳ අඳ ගොවීන්, ඉඩම් හිමියන් හා ගොවිජන සමාජයේ අදහස් ලබා ගැනීම.
04. අඳ ගොවියාත් ඉඩම් හිමියාත් යන දෙපක්ෂයම තෘප්තියට පත්වන ආකාරයේ තිරසාර අඳ භුක්ති ක්‍රමයක් පිළිබඳ රාජ්‍ය ප්‍රතිපත්තියක් සකස් කිරීම සඳහා වූ යෝජනා ඉදිරිපත් කිරීම.

## 1.5 පර්යේෂණ ක්‍රමවේදය

මෙම අධ්‍යයනය සඳහා ප්‍රාථමික හා ද්විතියික දත්ත යොදා ගන්නා ලදි. ප්‍රාථමික දත්ත ලබා ගැනීම සඳහා ක්‍රම තුනක් භාවිතා කරන ලදී. ඒවා මෙසේය.

01. ප්‍රශ්නාවලියක් මාර්ගයෙන් සමීක්ෂණයක් සිදු කිරීම.
02. අඳ ගොවීන් හා ඉඩම් හිමියන් සමඟ කණ්ඩායම් සාකච්ඡා පැවැත්වීම.
03. නිලධාරීන් සමග සාකච්ඡා කිරීම

ද්විතියික දත්ත ලබා ගැනීම සඳහා මීට පෙර කරන ලද අධ්‍යයනයන්, අදාළ පනත්, පාර්ලිමේන්තු විවාද වැනි වාර්තා මෙන්ම මුද්‍රිත වාර්තාද පරිශීලනය කරන ලදී.

වර්තමානයේ අඳ භුක්ති ක්‍රමය වැඩි වශයෙන් ක්‍රියාත්මක වන හා අඳ ගොවි ගැටලු වැඩිපුරම වාර්තා වන දිස්ත්‍රික්ක 03ක් (හම්බන්තොට, මාතර, අනුරාධපුරය,) තෝරා ගෙන ප්‍රාථමික දත්ත ලබා ගන්නා ලදී. ඒ සඳහා තෝරාගත් දිස්ත්‍රික්ක තුළ වැඩිම අඳ ගොවීන් ප්‍රමාණයක් සිටින ගොවිජන සංවර්ධන බල ප්‍රදේශ 02 බැගින් තෝරා ගැනිණි. ඉන්පසු එම එක් එක් ගොවිජන සංවර්ධන බල ප්‍රදේශයකින් අඳ ගොවි ගැටලු වැඩි වශයෙන් පවතින කෘෂිකර්ම පර්යේෂණ හා නිෂ්පාදන සහකාර (කෘ. ප. නි. ස) කොට්ඨාස 02 බැගින් තෝරා ගැනිණි. එම එක් එක් කෘ. ප. නි. ස කොට්ඨාසයක් තුළ සිටින අඳ ගොවීන් හා ඉඩම් හිමියන් 50-60 අතර සංඛ්‍යාවක් රැස් කර ඔවුන් සමග 2010 යෝජිත පනත් කෙටුම්පත පිළිබඳව ඉලක්ක කණ්ඩායම් සාකච්ඡා පවත්වා අදහස් ලබා ගැනිමත් සසම්භාවී ක්‍රමයට ඔවුන් අතරින් තෝරා ගන්නා පිරිසක් සමග ප්‍රශ්නාවලියක් මගින් තොරතුරු රැස් කිරීමත් සිදු කරන ලදී.

ඊට අමතරව මෙම එක් එක් ගොවිජන සේවා බලප්‍රදේශයේ සිටින ගොවිජන ක්ෂේත්‍රයේ නිලධාරීන්ගෙන් (ගොවිජන කොමසාරිස්වරුන්, ගොවිජන සංවර්ධන නිලධාරීන් හා කෘ.ප.නි.ස. වරුන්) යෝජිත පනත පිළිබඳව යෝජනා හා අදහස් ලබා ගන්නා ලදී.

## 1.6 අධ්‍යයනයේ සීමා

යෝජිත ගොවිජන සංවර්ධන පනත් කෙටුම්පත පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීමට පෙර සංශෝධන ඇතුළත් කළ යුතු වූ බැවින් මෙම අධ්‍යයනය ඉතා කෙටි කාලයක් තුළ කඩිනමින් සිදු කිරීමට නියමිත විය. එම නිසා පනත් කෙටුම්පත පිළිබඳ අඳ ගොවීන්ගේ, ඉඩම් හිමියන්ගේ හා ගොවිජන ක්ෂේත්‍රයේ නිලධාරීන්ගේ අදහස් ලබා ගැනීම සඳහා කඩිනම් පර්යේෂණ විධි ක්‍රම භාවිතා කිරීමට සිදු විය. ඒ අනුව යමින් කඩිනම් ගැමි විමසුම් විධික්‍රම වන ඉලක්ක කණ්ඩායම් සාකච්ඡා හා ඒ ආශ්‍රයෙන් තොරතුරු ලබා ගැනීමේ ක්‍රමය භාවිතා කරන ලදී. ශ්‍රී ලංකාවේ වී වගා කරන සෑම දිස්ත්‍රික්කයකම නීත්‍යානුකූල අඳ ගොවීන් අඩු වැඩි වශයෙන් සිටියත් ඒ සෑම දිස්ත්‍රික්කයක්ම ආවරණය කිරීමට හැකියාවක් නොමැති විය. ඉඩම් හිමියන් බහුතරයක් ප්‍රදේශයෙන් පිටත ජීවත් වීම නිසා ඔවුන්ගේ අදහස් හා යෝජනා ලබා ගැනීමේදී ගැටලු මතු විය.

## 1.7 වාර්තාවේ සැකැස්ම

මෙහි පළමු පරිච්ඡේදය යටතේ ශ්‍රී ලංකාවේ අඳ ක්‍රමය හා සම්බන්ධ වී ගොවිතැන පිළිබඳ පසුබිම විස්තර කරන අතර, ඊට අමතරව අධ්‍යයන ගැටලුවේ ස්වභාවය, අධ්‍යයනයේ අවශ්‍යතාවය, අධ්‍යයනයේ පරමාර්ථය, අධ්‍යයන ක්‍රමවේදය හා අධ්‍යයන සීමා විග්‍රහ කෙරේ.

අඳ යන වචනය භාවිතයට පැමිණීම, අඳය යන්නෙහි අර්ථය හා ශ්‍රී ලංකාවේ අඳ ක්‍රමය යටතේ වී ගොවිතැනෙහි ඓතිහාසික තොරතුරු හා විවිධ අඳ ක්‍රම පිළිබඳව විස්තර, අඳ ගොවි පනත් හා පසුකාලීනව ඒවාට ගෙන එන ලද සංශෝධනයන් මෙන් ම 2000 අංක 46 දරණ ගොවිජන සංවර්ධන පනත පිළිබඳව දීර්ඝ විස්තරයක් දෙවැනි පරිච්ඡේදයේදී ගෙන එයි. අධ්‍යයන ප්‍රදේශයේ අඳ ගොවීන්ගේ හා ඉඩම් හිමියන්ගේ සමාජ ආර්ථික තත්ත්වය තෙවැනි පරිච්ඡේදයේදී විශ්ලේෂණය කෙරේ. වර්ෂ 2000 අංක 46 දරණ ගොවිජන සංවර්ධන පනත ඉදිරිපත් කිරීමෙන් පසුව මේ දක්වා අඳ ගොවිතැන සම්බන්ධව අඳ ගොවීන් හා ඉඩම් හිමියන් අතර තිබෙන ගැටලුකාරී ස්වභාවය විස්තර කෙරෙන්නේ සිවුවැනි පරිච්ඡේදයේය. වර්ෂ 2010 යෝජිත අඳ ගොවි පනත් කෙටුම්පතෙහි සංශෝධනය විය යුතු වගන්ති පිළිබඳ අඳ ගොවීන් ඉඩම් හිමියන් සහ ගොවිජන ක්ෂේත්‍රයේ නිළධාරීන් සමඟ සාකච්ඡා කිරීමෙන් පසුව ඔවුන් ඒ පිළිබඳව දැක්වූ අදහස් හා යෝජනා පස් වන පරිච්ඡේදයෙන් විස්තර කරනු ලැබේ. මෙම අධ්‍යයනයෙන් හෙළි කරගත් කරුණු මත පදනම් වූ නිගමන හා නිර්දේශ හයවැනි පරිච්ඡේදයේදී ඉදිරිපත් කර ඇත. වාර්තාව අවසානයේ ඇමුණුම් කීපයක් මඟින් අඳ වී ගොවිතැන සම්බන්ධ දත්ත හා තොරතුරු ඉදිරිපත් කර ඇත. ඇමුණුම 01 මඟින් හම්බන්තොට දිස්ත්‍රික්කයේ වී වගාව සම්බන්ධ දත්ත ඉදිරිපත් කෙරෙයි. ඇමුණුම 02 මඟින් හම්බන්තොට දිස්ත්‍රික්කයේ ඉඩම් හිමි ගොවීන් සහ අඳ ගොවීන් සම්බන්ධ තොරතුරු ද, ඇමුණුම 03 මඟින් එම දිස්ත්‍රික්කයේ වගා කරන ඉඩම් ප්‍රමාණය අනුව අඳ ගොවීන් වර්ගීකරණයද, ඇමුණුම 04 මඟින් වාරිමාර්ග ක්‍රමයන් යටතේ සිටින අඳ ගොවීන් සංඛ්‍යාවද, ඇමුණුම 05 මඟින් හම්බන්තොට ගොවිජන සංවර්ධන දිස්ත්‍රික් කාර්යාලයට ලැබෙන ගොවිජන පැමිණිලිවල ස්වභාවය අනුව වර්ග කර දැක්වීමද ඉදිරිපත් කර ඇත. අමුණුම් 06 මඟින් හම්බන්තොට දිස්ත්‍රික්කයේ ගොවිජන සේවා මධ්‍යස්ථානවල ආරවුල් පිළිබඳව සිදු කරන පරීක්ෂණ සංඛ්‍යාව හා වර්ගීකරණයද ඇමුණුම 07 මඟින් ගොවිජන සංවර්ධන දිස්ත්‍රික්

කාර්යාලයේ 2010 වර්ෂය දක්වා පවතින කරුණු විමර්ශන, ලැබී ඇති පැමිණිලි හා අධිකරණයේ පවතින නඩු සංඛ්‍යාවන්ද, ඇමුණුම 08 මගින් ශ්‍රී ලංකාවේ දිස්ත්‍රික්ක කිහිපයක 2010 වර්ෂයේදී අඳ ගොවි ක්‍රමය යටතේ වී වගා කිරීම පිළිබඳ විස්තරද ඇමුණුම 09 මගින් සමීක්ෂණයේදී ඉලක්ක කණ්ඩායම් සාකච්ඡා සඳහා සහභාගීවූවන්ගේ සංඛ්‍යා ලේඛණද, ඇමුණුම 10 සහ 11 මගින් අඳ ගොවීන් හා ඉඩම් හිමියන් සම්බන්ධයෙන් තොරතුරු ලබා ගැනීම සඳහා භාවිතා කරන ලද ප්‍රශ්නාවලියද ඉදිරිපත් කෙරේ.

## දෙවැනි පරිච්ඡේදය

# අඳ ගොවි පනතේ විකාශනය

### 2.1 හැඳින්වීම

අඳ ක්‍රමය ශ්‍රී ලංකාවේ වී වගාව තුළ ඉතා ඈත අතීතයේ සිටම පැවත ගෙන එන වගා ක්‍රමයකි. අඳය යන වචනයේ නිරුක්තිය, ශ්‍රී ලංකාවේ අතීතයේ ක්‍රියාත්මක වෙමින් පැවති අඳ ක්‍රම හා වර්තමානයේ රටේ විවිධ ප්‍රදේශවල ක්‍රියාත්මක වන අඳ ක්‍රම පිළිබඳ තොරතුරු, අඳ ගොවීන්ගේ සුරක්ෂිතභාවය යනාදිය සම්බන්ධයෙන් මෙරට පැවති ආණ්ඩු මගින් ඉදිරිපත් කරන ලද පනත්, මෙම පනත් සඳහා වරින්වර ගෙන එන ලද සංශෝධන, 2000 අංක 46 දරණ ගොවිජන සංවර්ධන පනත ඉදිරිපත් කිරීමේ පසුබිම හා එම පනත ඉදිරිපත් කිරීමෙන් පසුව අඳ ගොවි ක්ෂේත්‍රයේ ගැටළුකාරී ස්වභාවයක් පැන නැගීම පිළිබඳ තොරතුරු මෙම පරිච්ඡේදයේදී සාකච්ඡා කරනු ලැබේ.

### 2.2 ඓතිහාසික හා නෛතික පදනම

ශ්‍රී ලංකාවේ අඳ ගොවීන් හා ඔවුන්ට බලපාන නෛතික කාරයයන් ඓතිහාසිකව ක්‍රමිකව ඇරඹී විකාශනය වුවකි. ඉංග්‍රීසීන් ලංකාවේ ආධිපත්‍යය ලබා ගන්නා අවධිය වන විට "අඳය" යන්න දේශීය කෘෂිකාර්මික නීති ක්‍රමයේ මූලිකාංගයක් විය.

"අඳේ" යන්නෙහි අර්ථය නම් වගාකරු විසින් කුඹුරු ඉඩම් හිමියාට එළදාවෙන් අර්ධයක් ගෙවනු ලැබීමය. අඳය යන්න සංස්කෘත භාෂාවේ එන "අර්ධ" යන්නෙන් බිඳුණකි. ක්වේරෝස් නමැති පෘතුගීසි ලේඛකයාට අනුව අඳය කොටස් 2කින් සමන්විත විය. පළමුවැන්න Paldora and Asucado යනුවෙන් බෙදීමය. මින් Asucado යන්නෙන් රජු හෝ ඉඩම් හිමියාට ගෙවන අර්ධයද Paldora යන්නෙන් වගාකරුවා ලබා ගත් අර්ධයද යන්න අදහස් වේ. ඔහු සඳහන් කළ දෙවැනි අඳ වර්ගය නම් "කරු අඳේ" සහ "තුනෙන් අඳේ" යන්නයි. කරු අඳේ යනු, ගොවීන් දෙදෙනෙකු කුඹුර වගා කළ විට තනි ගොවියාට ලැබෙන ප්‍රමාණයයි. තුනෙන් අඳේ යනු සමහර අවස්ථාවක ඉඩම් හිමියා ලද 1/3ක පංගුවයි. පෘතුගීසී සමය වනවිට මෙම ක්‍රමය මුහුදු බඩ පෙදෙස්වල ව්‍යාප්තව තිබිණ. "බදු අඳේ" යන්න ගාල්ල වැනි ප්‍රදේශවල භාවිතා වූ වචනයකි (පෙරමුණ, 1992).

"ඔතු" යන වගා ක්‍රමය ලංකාවේ මලබාර් රජවරු සිටි අවධියේ ව්‍යාප්තව තිබුණි. රජුන්ගෙන් කුඹුරු ඉඩම් ලබා ගන්නා ගම් ප්‍රධානින් ඒවා වගා කිරීමට පවරා දුන් ගොවීන්ගෙන් අය කරන එළදා කොටස ඔතු (othu) නම් විය. මේ ක්‍රමය යටතේ අවශ්‍ය බීජ හා පිරිවැය ඉඩම් හිමියා විසින් සැපයිය යුතු විය. සිංහල රජ කාලයේ පැවති අඳ ක්‍රමය එවකට පැවති ඉඩම් භුක්ති ක්‍රමය අනුව විවිධාකාර විය. විශේෂයෙන් ඒ කාලයේ "අඳය" හා සමාන පළමු ඉඩම් භුක්ති ක්‍රමය වූයේ අඳ මුත්තෙට්ටුවයි. අඳ මුත්තෙට්ටුව යනු යම් රාජකාරියක් උදෙසා යම්

පුද්ගලයෙකුට ලැබුණු ඉඩම් වෙනත් වගාකරුවෙකු විසින් වගා කර ප්‍රවේණි දීමේ ක්‍රමයයි. ඈත අතීතයේ "අඳ ඉඩම්" යනුවෙන් භාවිතා කරන ලද්දේ කුළිය වශයෙන් අස්වැන්නෙන් කොටසක් දෙන පොරොන්දුව මත සාරවත් ඉඩම් වාර්ෂිකව ගොවිතැන් කිරීමයි.

ඉහත කී ප්‍රවේණි ක්‍රම ඉංග්‍රීසි පාලන සමයත් සමඟ ක්‍රමයෙන් අභාවයට පත් විය. වර්තමානයේද ඇතැම් තැනක පවත්නා සාම්ප්‍රදායික ගොවි අඳ ක්‍රම කීපයක් වේ. හරි අඳය, කරු අඳය මේ අතරින් වැදගත්ය.

අඳ ක්‍රමය යන්නෙහි නියම අර්ථය අස්වැන්නෙන් හරි අඩක් ඉඩම් හිමියාට ගෙවීම සඳහා වගා කිරීමයි. ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මක වන අඳ ක්‍රම යටතේ ඉඩම් වගා කරන්නා සෑම විටම ඉඩම් හිමියාට සිය අස්වැන්නෙන් අඩක් ගෙවීම අවශ්‍ය නොවේ. අස්වැන්නෙන් මොනයම් කොටසක් හෝ ගෙවන සියළුම ක්‍රම අඳය යන නමින් හැඳින්විය හැකිය. ශ්‍රී ලංකාවේ වී ගොවිතැනේදී ක්‍රියාත්මක වන අඳ ක්‍රම ගණනාවක්ම ඇතත් ඒ හැම අඳ ක්‍රමයකම ආවේණික පොදු ලක්ෂණය වනුයේ කුඹුර අයිතිකරු කුඹුර වගා නොකොට අඳකරුවෙකු ලවා වගා කරවීමෙන් ලබා ගන්නා අස්වැන්නෙන් නියමිත ප්‍රමාණයක් හිමි කරගැනීමයි. කුඹුරු හිමියා භූමිය වෙනුවෙන් ආර්ථිකමය ගෙවීමක් වශයෙන් ලබාගන්නා මේ කොටස "ප්‍රවේණිය හෝ බිම් හවුල" වශයෙන් හැඳින්වේ (වික්ටර් අයිවන්, 1981).

වික්ටර් අයිවන් විසින් විවරණය කරන ලද ශ්‍රී ලංකාවේ වී ගොවිතැනේදී ක්‍රියාත්මක වන ප්‍රධාන අඳ ක්‍රම කීපයක් පහත සඳහන් පරිදි දැක්විය හැකිය.

**හරි අඳ ක්‍රමය :** මෙම ක්‍රමය යටතේ ගොවියාට ඉඩම් හිමියාගෙන් අතිරේක ආධාර නොලැබෙන අතර ඉඩම් හිමියාට අස්වැන්නෙන් හරි අඩක් ගෙවිය යුතුය.

**තුන් අඳ ක්‍රමය :** මෙහිදීද ඉඩම් හිමියාගෙන් අතිරේක ආධාර නොලැබෙන අතර ගොවියා ඉඩම් හිමියාට ගෙවිය යුත්තේ සිය අස්වැන්නෙන් තුනෙන් එකකි.

**ගත් අඳය, බිම් අඳය, කරු අඳය:** මෙම ක්‍රමය අනුව ඉඩම් හිමියාගෙන් ගොවියා අතිරේක ආධාර නොලබා ඉඩම් හිමියාට සිය අස්වැන්නෙන් 25%ක් ගෙවිය යුතුය.

ඉහත අඳ ක්‍රම තුන යටතේම ඉඩම් හිමියාගෙන් ගොවියාට ගොවිතැන කරගෙන යාම සඳහා අතිරේක ආධාර කිසිවක් නොලැබෙන නිසා වී වගා කටයුතු සඳහා අවශ්‍ය යෙදවුම් වන බිත්තර වී, පොහොර, ට්‍රැක්ටර් හෝ මීහරක් ආදී දේ ගොවියා විසින්ම සපයා ගත යුතුය.

ශ්‍රී ලංකාවේ විවිධ ප්‍රදේශවල භාවිතා වන අඳ ගොවි ක්‍රම කිහිපයක් පිළිබඳව වික්ටර් අයිවන් තවදුරටත් කරුණු ඉදිරිපත් කරයි. ඉඩම් හිමියා විසින් යෙදවුම් (බිත්තර වී, මීහරක්, පොහොර) සැපයීමෙන් එම යෙදවුම් වෙනුවෙන්

ගොවියාගෙන් පොළියක් ද අයකර ගන්නා අතර මෙම පොළිය හා ප්‍රවේණිය වශයෙන් ගොවියාගේ අස්වැන්නෙන් අඩකට වඩා ලබා ගැනීම එක් ක්‍රමයකි. සපයන ලද බිත්තර වී බුසලක් සඳහා වී බුසල් 1 1/2ක් අය කරගනී. කෑගල්ල දිස්ත්‍රික්කයේ ඇතැම් පළාත්වල සී සෑම පිණිස ණයට දෙන මීහරක් සඳහා දිනකට රුපියල් 2ක් බැගින් ඉඩම් හිමියන් විසින් අය කරගන්නා ක්‍රමයක් පැවතිණි. මාතර දිස්ත්‍රික්කයේ ඇතැම් ප්‍රදේශවල ඉඩම් හිමියා විසින් සපයනු ලබන ඇටකටු පොහොර හොණ්ඩරයක් වෙනුවෙන් ගොවියා ඉඩම් හිමියාට වී කුරුණි 18ක් ගෙවිය යුතුය. සියනෑ කෝරළයේදී ඉඩම් හිමියකු විසින් ණයට දෙන ලද පොහොර වෙනුවෙන් ගොයම් පෑගීමෙන් පසු ඉතිරිවන පිදුරු සියල්ලම ලබා ගනී.

ඉඩම් හිමියා විසින් අමතර පොළියක් අය නොකොට අවශ්‍ය යෙදවුම් ගොවියාට සපයා අස්වැන්නෙන් අඩක් ලබා ගැනීම තවත් ක්‍රමයකි. අස්වැන්නෙන් හරි අඩක් වශයෙන් සැලකුවද නියම වශයෙන් ඉඩම් හිමියාට ලැබෙන්නේ ඊට වඩා අඩු ප්‍රමාණයකි. මෙවැනි ඉඩම් හිමියන් "සහයෝගකාරී" ඉඩම් හිමියන් ලෙස හඳුන්වනු ලැබේ.

අඳ ගොවියා ශ්‍රමයෙන් පමණක් වගාවට හවුල් වීමේ ක්‍රමයක් ද භාවිතා වන අතර ඒ යටතේ ඉඩම් හිමියා ගොවියාට බීජ වී, පොහොර, මීහරක්, යනාදිය සපයා අස්වැන්නෙන් 75%ක්ම ලබාගනී.

ඉඩම් හිමියා සමඟ කලින් ඇතිකරගත් සම්මුතියක් අනුව අස්වැන්නෙන් නිශ්චිත ප්‍රමාණයක් ඔහුට ගෙවනු ලැබේ. වගා පාඑවක් වුවද මෙම ප්‍රමාණය ඉඩම් හිමියාට දිය යුතුය. මෙහිදීද ගොවියාට ඉඩම් හිමියාගෙන් අතිරේක ආධාර නොලැබේ. මෙය වඩාත්ම භාවිතා වන්නේ උතුරු පළාතේ දිස්ත්‍රික්කවලය.

**හවුල් අඳය:** ඉඩම් හිමියා හා ගොවියා හවුලේ කුඹුර වගාකරයි. අස්වැන්න කොටස් කිරීමට පෙර ඉඩම් හිමියා සපයන ලද බිත්තර වී සඳහා බුසලකට බුසල් දෙක බැගින් වෙන්කොට ඉතිරිය 50% බැගින් දෙදෙනා අතරේ බෙදාගනී. මෙය ශ්‍රී ලංකාවේ දකුණු ප්‍රදේශයේ භාවිතා වන ක්‍රමයකි. මෙහිදී ඉඩම් හිමියා සහ අඳ ගොවියා සම සමව වියදම් කර අස්වැන්න පංගු කිරීමේ දී 1/4ක් ඉඩම් හිමියාට අතහැර ඉතිරිය සමසේ බෙදා ගැනීම සිදු වේ. මේ අවස්ථාවේ යම් කිසිවකු බිත්තර වී සපයා තිබුණි නම් ඒ සඳහා 1 1/2ක් ඔහුට හිමි විය.

### 2.1.1 තට්ටුමාරු සහ කට්ටිමාරු ක්‍රම

තට්ටුමාරු ක්‍රමය යටතේ හවුල් අයිතිකරුවන් අතර වු කුඹුරක් කන්නයෙන් කන්නය එක් එක් හවුල්කරු විසින් වගා කරනු ලැබේ. එක් හිමිකරුවෙකු එක් කන්නයක් වගා කළ විට ඊළඟ කන්නය තවත් හවුල්කරුවකු විසින් වගා කරනු ලැබීම මෙම ක්‍රමයේ ස්වභාවයයි.

මෙම ක්‍රමය යටතේ හවුල් ඉඩම් හිමියෝ තම තමන් විසින්ම වගා කිරීම හෝ කරු අඳකරුවකු ලවා වගාකරවීම හෝ වෙනත් අඳ ගොවියෙකු ලවා වගා කරවීම සිදු කරති.

කට්ටිමාරු ක්‍රමය, කුඹුරු කීපයක් අයත්ව තිබූ හවුල් අයිතිකරුවන් අතර භාවිතා වූ ක්‍රමයකි. එක් එක් කුඹුරට මාරු වෙමින් හවුල් අයිතිකරුවන් විසින් තට්ටුමාරුවට වගා කරනු ලැබීම මෙම ක්‍රමයේ පදනමයි. මෙම ක්‍රමය යටතේද කරු අඳ ගොවියන් හෝ වෙනත් ස්වභාවයක අඳ ගොවියෙකු යෙදවීමට කට්ටිමාරු ඉඩම් හිමියාට අවස්ථාව තිබේ. ඉහත කී ක්‍රම දෙකේම පොදු ලක්‍ෂණ කීපයක් දිස්වන අවස්ථා තිබේ. එනම්:

1. තට්ටුමාරු හා කට්ටිමාරු ක්‍රමය යටතේ වූ අඳ ගොවියන් ඔහු පත් කළ ඉඩම් හිමියාගේ අයිතියට සරිලන කන්නවලට පමණක් සීමා වීම.

2. ඉඩම් හිමියන්ට අවශ්‍ය නම් හවුලේ හැම තට්ටුමාරුවක් හෝ කට්ටිමාරුවක් උදෙසා එකම අඳ ගොවියෙකු පත් කළ හැකිය. එවිට අඳ ගොවියා අඳයට අදාළ බිම් ප්‍රවේණිය නිසි කන්නයට අදාළ ඉඩම් හිමියාට ගෙවිය යුතුය. එසේ නැතහොත් ඉඩම් හිමියන් හා එකඟත්වය අනුව ඔවුන් අතර ප්‍රවේණිය බෙදා දිය යුතු වේ.

ඉහත සඳහන් කරන ලද විවිධ කුඹුරු අඳ ගොවි ක්‍රම ඉතා වියවුල් සහිත ඒවා විය. ඉඩම් හිමියන් විසින් අඳ ගොවියාගේ ශ්‍රමය සූරා කනු ලැබූ අතර, ඉඩම්වලින් සරු ඵලදාවක් ලබා ගැනීමටද එය බාධාවක් විය. එකී ක්‍රමය වැඩවසම් ලක්‍ෂණවලින් හෙබි බැවින් අඳ ගොවි-ඉඩම් හිමි සබඳතා ක්‍රමානුකූල හා ඵලදායී බවට පත් කිරීමට අවශ්‍ය විය. ඒ සඳහා ව්‍යවස්ථාදායක පනත් කීපයක් පනවන ලදී.

### 2.3 1887 අංක 27 දරණ ආඥා පනත

අඳ ගොවියන් සම්බන්ධ වූ ව්‍යවස්ථාපිත තත්ත්වය ආරක්‍ෂා කිරීමට දරන ලද ප්‍රථම ප්‍රයත්නය මෙයයි. අඳ ගොවි අයිතිය ඇතිවීම සඳහා නොතාරිස් විසින් සහතික කරන ලද ලියවිලි අවශ්‍ය බවත්, එය වාචිකව වුව ඇතිවිය හැකි බවත් මෙහි සඳහන් වේ.

### 2.4 1953 කුඹුරු පනත

නිදහස ලැබීමෙන් පසුව අඳ ගොවි ක්‍රමය ප්‍රතිසංස්කරණය සඳහා ගත් පළමුවන ව්‍යවස්ථාදායක ප්‍රයත්නය 1953 කුඹුරු පනතයි. මෙම පනත මඟින් ගොවි අඳය පස් වසරක කාලයක් සඳහා ආරක්‍ෂා කරදීමටත්, අඳ ගොවි ඉඩම් හිමි බදු ගිවිසුම් නීත්‍යානුකූල කර එමඟින් අඳ ගොවියා ආරක්‍ෂා කිරීමටත්, උපරිම බද්දක් නියම කිරීමටත්, එමඟින් අඳ ගොවි අයිතිය යම් ප්‍රමාණයකින් ආරක්‍ෂා කිරීමටත් පියවර ගන්නා ලදී. මෙම කුඹුරු පනත අත්හදා බැලීමක් වශයෙන් දිස්ත්‍රික්ක 2ක පමණ ක්‍රියාත්මක කළ නමුත් එය අසාර්ථක විය.

## 2.5 1958 අංක 01 දරණ කුඹුරු පනත

මූලික අඳ ගොවි ප්‍රශ්නය සඳහා විසඳුමක් වශයෙන් පැනවූ දෙවන ව්‍යවස්ථාදායක නීතිය මෙයයි. 1956 බලයට පත් මහජන එක්සත් පෙරමුණු ආණ්ඩුවේ කෘෂිකර්ම හා ආහාර අමාත්‍යවරයා වශයෙන් පිලිප් ගුණවර්ධන මහතා විසින් කුඹුරු පනත නිර්මාණය කරන ලද්දේ ඉහතින් සඳහන් කරන ලද සමාජ ආර්ථික පරිසරයක් තුළය. අඳ ගොවියාගේ දාසභාවය තුරන් කොට ආහාර නිෂ්පාදන ක්‍රියාවලිය සඳහා ඔහු වඩාත් සක්‍රීය ලෙස යොමු කිරීම හා ඔහුගේ ජීවන තත්ත්වය සුරක්ෂිත කිරීම කුඹුරු පනතේ මූලික අරමුණ විය. 1958 අංක 01 දරණ කුඹුරු පනත නමින් හැඳින්වූ මෙම පනත් කෙටුම්පත 1958 පෙබරවාරි 2 වන දින පාර්ලිමේන්තුවේදී සම්මත විය. කුඹුරු පනත අනුව අඳ ගොවියා කැමති විටෙක ඉවත් කරන්නට ඉඩම් හිමියාට තිබූ අසීමිත බලය අහෝසි කෙරිණි. අඳ ගොවියෙකු කුඹුරකින් ඉවත් කළ හොත් ඔහුගේ අයිතිය සුරැකීමට පනතින් නීතිමය ප්‍රතිපාදන සලසා තිබුණි. අඳ ගොවියා ඉඩම් හිමියාට ගෙවිය යුතු අඳයද වගාව සඳහා වෙහෙස නොවන, වගාවට ආධාර නොදෙන ඉඩම් හිමියාට අස්වන්නෙන් වැඩි කොටසක් ගෙවීමේ මෙතෙක් පැවති ක්‍රමයද පනතින් අහෝසි කරන ලද අතර, ඉඩම් හිමියාට ලැබිය යුතු අස්වනු කොටස සීමා කිරීමට යෝජනා විය. එක කන්නයකදී එක් අක්කරයකින් බුසල් 15ක් හෝ එම කන්නයේදී ලැබෙන මුළු අස්වනු ප්‍රමාණයෙන් 1/4ක් හෝ යන දෙකෙන් අඩු කොටස ඉඩම් හිමියාට දිය යුතු බව පනතෙන් දක්වා ඇත. අඳ ගොවියා සතු අයිතිවාසිකම්වලට, ඔහුගෙන් පසුව ලංකාවේ පුරවැසියෙකු නම් කිරීමට අඳ ගොවියාට පනතින් බලය පවරා තිබුණි. එවැන්නකු නම් නොකර අඳ ගොවියා මිය ගිය අවස්ථාවක දී ඔහුගේ ලේ ඥාතියෙකුට (වැඩිමහල් ඥාතිවරයාට) අඳ අයිතිය උරුම වන බවද දක්වා ඇත. ඔහුට ගොවිතැන හුරුපුරුදු නොමැති විටෙක වී ගොවිතැන පුරුදු ඥාතිවරයෙකු ප්‍රදේශයේ ගොවිකාරක සභාව විසින් තෝරා උරුමකරු ලෙස පත් කරනු ලැබිය යුතු බවද දක්වා ඇත. ඒ අනුව පනත යටතේ ගොවිකාරක සභාවක්ද පිහිටුවීමට යෝජනා කර ඇත. එලෙස පත් කරන පුද්ගලයා ඉඩම් හිමියාට ප්‍රවේණිය ගෙවූ පසු ඉතිරි මුළු ආදායමේ සම්පූර්ණ ප්‍රමාණයෙන් 1/4ක කොටසක් මුදලින් හෝ අස්වැන්නෙන් අදාළ අඳ ගොවියාගේ ජීවත්ව සිටින කලත්‍රයාට ගෙවිය යුතුය. ගෙවන ප්‍රමාණය තීරණය කරනුයේ බලය ලත් ගොවිකාරක සභාවයි. එසේම අඳ ගොවියෙකුට තම අයිතිවාසිකම් විකිණීම හෝ තෑගි ඔප්පුවකින් පැවරීමද සිදු කිරීමට හැකිය. එසේම යම් කුඹුරු ප්‍රමාණයක, අඳ ගොවියෙකු මියගිය අවස්ථාවක උරුම වීමට ඥාතියෙකුද නැති අවස්ථාවක, නම් කරන ලද්දකු ද නැතිවිට එම කුඹුරු ප්‍රමාණය ගොවිකාරක සභාව වෙත අයත් වේ. එය දින 30ක් තුළ ඉඩම් හිමියාට ලිඛිතව දැනුම් දිය යුතු අතර එම අයිතිවාසිකම සුදුසු පුද්ගලයෙකු සතු කර දිය යුතුය. දැනුම් දීම අනුව ඉඩම් හිමියා ඉඩම් හිමි ගොවියා වීමට කැමති බව දැන්වුවහොත් අක්කර 5කට නොවැඩි වන කොටසක ඉඩම් හිමි ගොවියෙකු වීමට අවසර දිය යුතු අතර එසේ ඉදිරිපත් නොවුන හොත් වෙනත් සුදුසු තැනැත්තෙකු සතු කළ යුතු බවද මෙම පනතේ දක්වා තිබුණි. අඳ ගොවියෙකු සතු අයිතිවාසිකම් ගොවි කාරක සභාවකට පැවරූ හෝ අත්වූ පසු එකී අයිතිය තමන් සතුව තබා ගන්නා කාලය තුළ ඉඩම් හිමියාට එම කුඹුරු ප්‍රමාණය වෙනුවෙන් බදු ගෙවිය යුතුය. මියගිය අඳ ගොවියෙකුගේ කුඹුරු ප්‍රමාණයේ අයිතිවාසිකම්වලට හිමිකම් නැති තැනැත්තෙකු ඊට ඇතුළුව භුක්ති වින්ද හොත් ප්‍රදේශයේ බලයලත් ගොවිකාරක සභාවට ඔහු ඉවත් කිරීමට කටයුතු කළ හැකිය.

අඳ ගොවියෙකු සිටින යම් කුඹුරු ප්‍රමාණයක ඉඩම් හිමියෙකුට, කුඹුරු පනත වලංගු වීම ආරම්භ වී පස් අවුරුද්දක් ඇතුළත, තමන් එම කුඹුරු ප්‍රමාණයෙන් කොමසාරිස්වරයා අනුමත කරන යම් කොටසක, ඉඩම් හිමි

ගොවියා වීමට අදහස් කරන බව ප්‍රදේශයේ බලය ලත් ගොවිකාරක සභාව වෙත ලියවිල්ලකින් දැනුම්දිය හැකිය. ඉන්පසු කොමසාරිස්වරයා විසින් ඒ පිළිබඳ විනිශ්චය කරනු ලැබීමෙන් අනතුරුව, යම්කිසි වන්දි මුදලක් වෙතොත් ඉඩම් හිමියා විසින් අදාළ ඉඩමේ අඳ ගොවියාට එය ගෙවනු ලැබීමෙන් පසු අඳ ගොවියා එම කුඹුරු කොටසින් ඉවත් විය යුතුයි. මෙම පනත වලංගු වන දිනයේ යම්කිසි කුඹුරු ප්‍රමාණයක කුලීකරුවකු එය වගා කරන ගොවියා වේ නම්, එම කුඹුර වගා කරන ඉඩම් හිමි ගොවියෙක් හෝ අඳ ගොවියකු නොසිටී නම්, එම ප්‍රදේශයේ බලය ලත් ගොවිකාරක සභාව ඉඩම් හිමියාට කරන දැනුම් දීමෙන් පසුව අදාළ ගොවි කුලීකරුවා එම කුඹුරු ප්‍රමාණයේ අඳ ගොවියා වශයෙන් පත් කළ හැකිය.

අඳ ගොවියෙකු විසින් යම් කුඹුරු ප්‍රමාණයක නිෂ්පාදනය පිළිබඳව ප්‍රමාණයෙන් මෙන්ම තත්ත්වයෙන්ද සෑහෙන උසස් බවක් රැකගනු ලැබිය යුතු අතර අනාගතයේදීත් එම තත්ත්වය රැක ගැනීමට හැකි පරිදි එම කුඹුරු ප්‍රමාණය පවත්වා ගෙන යා යුතුය. එසේ නොවන තත්ත්වයක් යටතේ අඳ ගොවියා ඉන් ඉවත් කළ හැකිය. එවිට අඳ ගොවියාට කුඹුර අහිමි වන අතර වන්දියක්ද හිමි නොවේ. යළිත් ඉඩම් හිමි ගොවියෙකු වීමට ඉඩම් හිමියාට අවස්ථාව ලබා ගත හැකි අතර ඔහු ඉදිරිපත් නොවුන හොත් කාරක සභාව එම අයිතිවාසිකම් සඳහා සුදුසු බව සඳහන්ව තිබුණි.

1958 අංක 01 දරණ කුඹුරු පනතින් පසුව 1961, 1972, 1973, 1979, 1991, 2000 යන වර්ෂවල සංශෝධිත පනත් ඉදිරිපත් කර තිබුණද අඳ ගොවියෙකු නෙරපූ අවස්ථාවකදී ක්‍රියා කළ යුතු වූ ආකාරය පිළිබඳව ඒවායින් දක්වා තිබුණේ නැත. මේ නිසා අඳ ගොවි පනත ක්‍රියාත්මක කරන ලද මුල් වර්ෂයේදී අඳ ගොවීන් නෙරපීම පිළිබඳ පැමිණිලි 14,500ක් ලැබී තිබුණි. මේවා විභාග කිරීමට පිටස්තර ආයතනවලින්ද සේවකයන් බඳවා ගැනීම නිසා ඉඩම් හිමියාට වාසි සහගත ලෙස එම පරීක්ෂණ සිදු කරන ලදී, මෙහිදී අධිකරණය දක්වා යන නඩු විභාග කිරීමට විශාල කාල සීමාවක් ගත විය. අඳ ගොවීන් නෙරපීම පිළිබඳ විග්‍රහ කිරීම පැවරී තිබුණේ ගොවිකාරක සභාවටය. මෙය සෘජු තීරණ ගැනීමට තරම් ශක්තිමත් නොවීය. මෙහි බලය අධිකරණයේ පවා අභියෝගයට ලක් විය. 1962, 1963 යන වර්ෂ වනවිට අඳ ගොවීන් නෙරපීම පිළිබඳ පැමිණිලි 23,105 ක් ලැබී තිබුණි. මෙයින් විභාග කර තිබුණේ නඩු 3,761ක් පමණි. මෙම තත්ත්වය යටතේ අඳ ගොවීන් අසීරුතාවයට පත්වීම දැඩි කතාබහට ලක් විය. මෙම පසුබිම මත 1965-1970 අතර රජයේ කෘෂිකර්ම සංවර්ධන යෝජනාවක් ලෙස අඳ ගොවීන් විසින් වගා කරන ලද ඉඩම් එම ගොවීන්ටම ලබාදීමේ අදහසක් ඉදිරිපත් කරන ලදී. මෙම යෝජනා මාලාවේ 114 පිටුවේ සඳහන්ව ඇති පරිදි එදා අඳ ගොවීන් සඳහා ආරක්ෂාව සැලසීමේදී උද්ගතව තිබූ අපහසුතාවය සලකන විට අඳ ගොවීන්ටම එම ඉඩම්වල අයිතිය පැවරීම සුදුසු බව යෝජනා කර ඇත. ලෝක ආහාර හා කෘෂිකර්ම සංවිධානයේ නිලධාරියෙකු වන අමීරාජා මහතා විසින් ලංකාවේ කුඹුරු ඉඩම් ප්‍රතිසංස්කරණ සම්බන්ධව 1970 වර්ෂයේදී සිදු කරන ලද නිර්දේශයක් වුයේද අඳ ගොවීන්ට කුඹුරු ඉඩම් පැවරීම සුදුසුය යන්නය. 1972 වර්ෂයේදී ආචාර්ය නිමල්සඳරත්න මහතා විසින් සිදු කරන ලද අධ්‍යයනයක් අනුව ඔහු යෝජනා කර තිබුණේද අඳ ගොවීන්ට ඉඩම් පැවරීම සුදුසු බවයි. 1972 රාජ්‍ය මන්ත්‍රණ සභා විවාදවල නිල වාර්තාවේ (doomon report) පිටු අංක 1627හි සඳහන් වන්නේ මෙතෙක් නෙරපා හරින ලද අඳ ගොවීන්ටම කුඹුරු ලබා දීමට ඉඩම් ප්‍රතිසංස්කරණයක් ගෙන ඒම අත්‍යවශ්‍ය බවයි.

## 2.6 1973 අංක 42 දරණ කෘෂිකාර්මික ඉඩම් පනත

මෙම පනත ඉදිරිපත් කිරීමේ ප්‍රධාන අභිමතාර්ථ වී ඇත්තේ අඳ ගොවීන්ගේ අඳය සුරක්ෂිත කිරීම, ඉඩම් හිමියන්ට ගෙවිය යුතු බද්ද නියම කිරීම, ගොවි කාරක සභා පිහිටුවීමට විධිවිධාන සැලැස්වීම හා ඒවායේ වගකීම් හා යුතුකම් නියම කිරීම, කෘෂිකාර්මික ඉඩම් සම්බන්ධයෙන් අඳ හා වෙනත් ආරවුල් කෘෂිකර්ම විනිශ්චය අධිකාරයක් මගින් විසඳීම හා 1958 අංක 01 දරණ කුඹුරු පනත ඉවත් කිරීමට විධිවිධාන සැලැස්වීමත්ය.

අඳ ගොවිතැන සම්බන්ධයෙන් 1958 අංක 01 දරණ කුඹුරු පනතින් පනවන ලද නීති බොහෝ ප්‍රමාණයක් එලෙසම මෙම පනතටද ඇතුළත්ව ඇති අතර සුළු සුළු වෙනස්කම් කිහිපයක් පමණක් මෙම පනතේ දක්නට ඇත. එවා පහත ආකාරයෙන් දැක්වීමට පුළුවන.

1958 අංක 01 දරණ කුඹුරු පනතේ 8 වන වගන්තිය යටතේ අඳ ගොවියකුගේ අයිතිවාසිකම් වෙනත් අයෙකුට පැවරීම පිළිබඳ විධිවිධාන දක්වා ඇත. ඒ අනුව අඳ ගොවියකු විසින් ඉඩම් හිමියාට ලියවිල්ලකින් දැනුම් දීමෙන් පසුව අඳ ගොවියාගේ අයිතිවාසිකම් එම කුඹුරු පිහිටි ප්‍රදේශයේ ගොවිකාරක සභාවට විකිණීමකින් පැවරිය හැකිය. එසේම ශ්‍රී ලාංකික පුරවැසියෙකු වන වෙනත් පුද්ගලයෙකුටද පැවරීමට පුළුවන. එම පැවරීම ලියාපදිංචි කිරීමෙන් පසු එම තැනැත්තා එම කුඹුරේ අඳ ගොවියා වන්නේය. 1973 අංක 42 පනත යටතේ මෙම නීතිය දක්වා ඇත්තේ අදාළ ගොවියා වෙනත් අඳ ගොවියකු හෝ අඳ ගොවීන් සමග හවුලේ හෝ තට්ටුමාරුවට වගා කරන්නේ නම් එවැනි අඳ ගොවීන්ගෙන් කෙනෙකුට හෝ ගොවි කාරක සභාවට අඳ අයිතිය පැවරිය හැකිය යනුවෙනි. හවුලේ හෝ තට්ටුමාරු ක්‍රමයට වගා නොකරන්නේ නම් තම භාර්යාවට හෝ අඳ ගොවියාගේ ලේ ඥාතීන්ගෙන් කෙනෙකුට හෝ ගොවි කාරක සභාවට අඳ අයිතිය පැවරිය හැකිය. මෙම පනතෙහි කෘෂිකර්ම විනිශ්චය අධිකාරයක් පිහිටුවීමට යෝජනා කර ඇති අතර එමගින් අඳ ගොවියාගේ අයිතිවාසිකම් උරුමවීම සම්බන්ධ ප්‍රශ්න හා අඳ ගොවිකම පිළිබඳව වෙනත් ප්‍රශ්න විභාග කිරීමට අවස්ථාව සලසා තිබුණි. අනුප්‍රාප්තිකයෙකු නම් කිරීම, ප්‍රවේණිය ගෙවීම ආදිය 1958 කුඹුරු පනත අනුවම සිදු වේ. අඳ ගොවියාගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීම මෙම පනතින් තවදුරටත් සිදු විය.

## 2.7 1979 අංක 58 දරණ ගොවිජන සේවා පනත

මෙම ගොවිජන සේවා පනත, අඳ ගොවීන්ගේ අඳය සුරක්ෂිත කිරීම, අඳ ගොවියා විසින් ඉඩම් හිමියන්ට ගෙවිය යුතු බද්ද නියම කිරීම, කෘෂි බෝග, පශු සම්පත්, කුඹුරුවලින් හා වෙනත් කෘෂිකාර්මික ඉඩම්වලින් උපරිම ඵලදාවක් ලබාගැනීම, ගොවිජන සේවා කාරක සභා පිහිටුවීම, ගොවිජන සේවා කොමසාරිස්වරයා විසින් කෘෂිකාර්මික ඉඩම්වල පවතින අඳ සහ වෙනත් ආරවුල් විසඳීම හා ඒ සඳහා ඇතැම් බලතල පවරනු ලැබීම, වගා නිලධාරීන් පත් කිරීම, 1972 අංක 2 දරණ කෘෂිකාර්මික ඵලදාවර්ධන පනත සහ 1973 අංක 42 දරණ කෘෂිකාර්මික ඉඩම් පනත ඉවත්කිරීමට විධිවිධාන සැලැස්වීම යන අරමුණු මත ඉදිරිපත් කරන ලදී, මෙම පනතේ 1958 අංක 01 දරණ කුඹුරු පනත හා 1973 අංක 42 දරණ කෘෂිකාර්මික ඉඩම් පනත යන පනත්වල වගන්තිවලට බොහෝ සමාන වගන්ති දක්නට ඇති අතර සුළු සුළු වෙනස්කම් කීපයක් පමණක් ඇත. එම

වෙනස්කම් පහත සඳහන් ආකාරයට දැක්විය හැකිය. පනතේ 2(1) වගන්තිය අනුව අඳ ගොවියකු ලවා වගා කරවන කුඹුරු හිමියන් මෙම පනත ආරම්භ වීමේ දින සිට මාස හයක් ඇතුළතදී පහත සඳහන් විස්තර කොමසාරිස්වරයාට සැපයිය යුතුය. එනම් ඉඩම් හිමියාගේ සහ අඳ ගොවියාගේ සම්පූර්ණ නම් සහ අඳ ගොවියා විසින් වගා කරනු ලබන කුඹුරු ප්‍රමාණය සහ නියම කරනු ලබන වෙනත් විස්තර යන ඒවා වේ. එම විස්තර සැපයීම පැහැර හරින යම් ඉඩම් හිමියකු මෙම පනත යටතේ වරදකරුවකු බවද දක්වා තිබේ.

4(1) වගන්තිය යටතේ දක්වා ඇති පරිදි අඳ ගොවියකු විසින් වගාකළ හැකි උපරිම කුඹුරු ප්‍රමාණය අක්කර පහකි. එහෙත් යම් කිසි අඳ ගොවියකු අක්කර පහකට වැඩි කුඹුරු ප්‍රමාණයක ඉඩම්හිමි ගොවියකු බවට කොමසාරිස්වරයා විසින් ඔප්පු කරගනු ලැබුව හොත් අදාළ ගොවියා අඳ ගොවි අයිතිවාසිකම්වලට හිමිකම් නොලබයි. පනතේ විධිවිධානවලට අනුව වැඩිමනත් කුඹුරු ප්‍රමාණයක් අඳ ගොවියා විසින් බුක්ති විඳිමින් සිටින්නේ නම් කොමසාරිස්වරයාගේ අනුමැතියට යටත්ව වගා කිරීමට තමාට හිමිකම තිබෙන කුඹුරු ප්‍රමාණය තෝරා ගැනීමට ඔහුට හිමිකම තිබෙන අතර ඉතිරි කුඹුරු ප්‍රමාණයෙන් ඉවත් වීමට සිදුවේ. පනතේ 5වන වගන්තිය අනුව අඳ ගොවියා එම කුඹුරු ප්‍රමාණයෙන් ඉවත්ව යාමෙන් පසු ඉඩම් හිමියාට එම කුඹුරු ප්‍රමාණය වගා කිරීමට හිමිකම ලැබේ. එසේ නැත හොත් ඉඩම්හිමියා විසින් අඳ ගොවීන් එක් අයෙකු හෝ කිහිප දෙනෙකු යම් නියම කරනු ලබන කාලයක් තුළ පත් කරනු ලැබිය යුතු බව දැක්වේ.

අඳ ගොවියකු ඉඩම් හිමියකුගෙන් කුඹුරු ඉඩමක් ලබා ගෙන, එය තමන් විසින් වගා නොකර වෙනත් අතුරු අඳ ගොවියෙකුට බදු දී එම අතුරු අඳ ගොවියා එහි අඳ ගොවියා බවට පත්වුව හොත්, මුල් අඳ ගොවියාගේ අඳය කෙළවර වන බව පනතේ 9 වන වගන්තිය යටතේ දක්වා ඇත. එහෙත් එලෙස අතුරු අඳ ගොවියකුට අඳ කුඹුරක් දිය හැක්කේ අයිතිකරුගේ කැමැත්ත ලියවිල්ලකින් ලබා ගැනීමෙන් හා ප්‍රදේශයේ ගොවිජන සේවා කාරක සභාවට දැනුම් දීමෙන් පමණි. එසේ නොමැතිව අඳ ගොවියා අතුරු ගොවියෙකුට කුඹුරු බදු දෙනු ලැබූ අවස්ථාවක ඒ කුඹුරු ප්‍රමාණය වගා කිරීමට ඉඩම් හිමියාට හිමිකම තිබෙන බව දන්වා ඇත.

1979 අංක 58 පනතේ හවුල් අඳ ගොවීන් දෙදෙනෙකු සිට එක් ගොවියෙකු මිය ගිය හොත් ඔහුගේ අඳ අයිතිවාසිකම් උරුමකරුවන්ට නොපැවරෙන අතර එය ඉතිරි වූ හවුල් අඳ ගොවියාට හිමි වේ. මෙය සාධාරණ නොවන්නේ මියගිය හවුල් අඳ ගොවියාගේ පවුල අනාථභාවයට පත් වන බැවිනි.

පනතේ 17(2) (1) වගන්ති මගින් දක්වා ඇත්තේ ඉඩම් හිමියා වෙත බද්ද ගෙවිය යුතු ප්‍රමාණය සම්බන්ධයෙනි. ගැසට් පත්‍රයේ පළ කරන නිවේදනයක් මගින් අඳ ගොවීන් විසින් ගෙවිය යුතු බද්ද කොමසාරිස්වරයා විසින් කලින් කල නිශ්චය කළ යුතු යයි දක්වා ඇත. එම නිශ්චය කිරීම් අනුව, යම් ප්‍රදේශයක වගා කළ එක් එක් කුඹුරු අක්කරයකින් වී බුසල් පහළොවකට නොවැඩි ගණනක් හෝ එම කුඹුරු ප්‍රමාණයෙන් උපදවන මුළු අස්වැන්නෙන් (පනත යටතේ නියමිත අයකිරීමේ ප්‍රමාණය අඩු කළ විට ඉතිරි කොටසින්) හතරෙන් එක පංගුවකට නොවැඩි කොටසක් හෝ යන මේ දෙකින් වඩා වැඩි ප්‍රමාණය කුඹුරු වගා කරන එක් එක් කන්නය සඳහා ගෙවිය යුතු බව දක්වා ඇත. මෙය ගොවිජන පනත් සම්බන්ධව ඉතා වැදගත් කොන්දේසියක් සේ කැපී පෙනෙන්නේ මෙතෙක් පනවන ලද පනත්වලින් අඩු කොටස ඉඩම් හිමියාට ගෙවන ලෙස දක්වා තිබීම නිසාය. අඳ ගොවීන්

ආරක්ෂා කරන අතරම ඉඩම් හිමියන් සතුටු කිරීමටද මෙම පනත මගින් උත්සාහ ගෙන තිබෙන අයුරු දැකිය හැකිය. වාරිමාර්ග ජලය කාර්යක්ෂම ලෙස පාලනය කිරීම, පස සංරක්ෂණය ජල සංරක්ෂණය හා නිසි පරිදි ජලය බැසයාමට සැලැස්වීම, පළිබෝධවලින් වගාව ආරක්ෂා කරමින් වී වගාවෙන් කාර්යක්ෂම ලෙස ප්‍රයෝජන ගැනීම හා කෘෂිකාර්මික ඵලදා වර්ධනය සැලසීම සඳහා ගොවියා උපරිම ආකාරයෙන් කැප වී කටයුතු කළ යුතු බව මෙම පනතින් දක්වා ඇත. එලෙස කිරීමට අපොහොසත් ඉඩම් හිමියෙකු හා භුක්තිකරුවෙකු "අධීක්ෂණ නියමය" නැමැති නියමයක් මගින් යම් කාල සීමාවක් තුළ කොමසාරිස්වරයාගේ අධීක්ෂණය යටතේ තැබිය හැක. එම කාල සීමාව තුළ කොමසාරිස්වරයා සෑහීමකට පත්නොවුන හොත් "අසන්තක නියමයක්" නිකුත් කිරීමෙන් යම්කිසි කාල සීමාවකට ඉඩම අදාළ භුක්තිකරුට අසන්තක කළ හැකි බව දක්වයි. මෙම නියමයෙන් බලාපොරොත්තු වී ඇත්තේ පස, ජලය වැනි සම්පත් කාර්යක්ෂම ලෙස යොදා ගනිමින් හා සුරකිමින් වගාවෙන් උපරිම ඵලදාවක් ලබා ගැනීමට ගොවීන් යොමු කිරීමයි.

## 2.8 1991 අංක 4 දරණ ගොවිජන සේවා පනත (සංශෝධිත)

1979 අංක 58 දරණ පනතට සංශෝධන කිහිපයක් එක් කිරීම සඳහා මෙම පනත ඉදිරිපත් කර ඇත. එම සංශෝධන පහත සඳහන් ආකාරයට දැක්විය හැකිය.

1979 පනතේ 4 වන වගන්තිය සංශෝධනය කර ඇති අතර ඒ අනුව කුඹුරක් වගා කරන අඳ ගොවියාගේ කලත්‍රයා හෝ අවුරුදු 18ට අඩු දරුවකු වුවද එම ඉඩම් කොටසේ අඳ ගොවියකු ලෙස සැලකේ.

1991 අංක 4 දරණ සංශෝධිත පනත අනුව කලත්‍රයා හෝ 18 ට අඩු දරුවකු අඳ ගොවියෙකු ලෙස සැලකේ. මෙහි දී විය යුත්තේ 18ට වැඩි අවිවාහක දරුවන් ලෙස සංශෝධනය වීමයි. අවුරුදු 18 වයසේ දරුවන් පාසල් ශිෂ්‍යයන් වන බැවින් කට්ටි මාරුව කුඹුරු කිහිපයක් දක්වා යා හැකිය.

1979 පනතේ 8 වන වගන්තියද සංශෝධනය කර ඇත. ඒ අනුව අඳ ගොවියා මිය ගිය පසු අනිවාර්යයෙන් ඔහුගේ අඳ අයිතිවාසිකම්, ජීවත්ව සිටින කලත්‍රයාට හෝ එවැන්නෙකු නොමැති විට පවුලේ දරුවකුට (විශේෂයෙන් වැඩිමහල් දරුවාටත්), දරුවන් කිහිපදෙනෙකු සිටින විට, ස්ථිර රැකියාවක් නොකරන ප්‍රධාන ජීවනෝපාය කුඹුරු ගොවිතැන වන දරුවාටත් හිමිවන බව දක්වයි.

ඉඩම් හිමියා විසින් ඉඩම විකිණීමට අදහස් කරනු ලබන්නේ නම් මුලින්ම ඒ බව අඳ ගොවියාට දැනුම් දිය යුතු බවට නව වගන්තියක් මේ පනත තුළ ඇතුළත්ය. එවිට අඳ ගොවියා ඉඩම් හිමියා විසින් නියම කරනු ලබන මිලට ඉඩම මිලදී ගැනීමට කැමැති නම් ඒ බව ගොවිජන සේවා කමිටුව වෙත දැනුම් දීමත් එම මිලට අකමැති නම් ඉඩම් හිමියා සමඟ සාකච්ඡා කර මිලක් නියම කරගත යුතු බවත් සඳහන් වේ. එසේ අඳ ගොවියා විසින් ඉඩම මිලට නොගනී නම් එම ඉඩම වෙනත් අයෙකුට විකිණීමට ඉඩම් හිමියාට හැකියාව ලැබේ.

1991 සංශෝධිත පනත මගින් 1979 පනතේ 17 වන වගන්තිය සංශෝධනය කර ඇති අතර ඒ අනුව අඳ ගොවියා විසින් ඉඩම් හිමියා වෙත ගෙවිය යුතු ප්‍රවේණිය වනුයේ එම ඉඩමේ මුළු අස්වැන්නෙන් 1/4කට නොවැඩි ප්‍රමාණය (පනත අනුව නියමිත අඩු කිරීම් අඩු කළ පසු) බව දක්වා ඇත. ස්ථාවර ප්‍රවේණිය එනම් බුසල් 15 යන්න ඉවත් කර ඇත.

පනතේ 20 වන වගන්තියද සංශෝධනය කර ඇත. මේ අනුව දින 13ක් වෙනුවට දින 15ක් ප්‍රවේණිය ගෙවීම සඳහා කල් ලබා දී ඇත.

පනතේ 26 වන වගන්තියට සංශෝධන එකතු කර ඇත. ඒ අනුව යම් ඉඩම් කොටසක අඳ ගොවියකු විසින් ඔහුගේ ඉඩම් හිමියාට ගෙවනු ලැබිය යුතු ප්‍රවේණියේ හිඟයක් හෝ යම් පොළියක් හෝ ඒ දෙකම තිබේ නම්, ඉඩම් හිමියා ඒ පිළිබඳ කොමසාරිස් ජනරාල්ට ලිඛිතව දැනුම් දීමෙන් පසුව පරීක්ෂණ නිලධාරියෙකු විසින් පවත්වනු ලබන පරීක්ෂණයකින් අනතුරුව එම හිඟය මුදලින් හෝ වී වලින් හෝ ඒ දෙයාකාරයෙන්ම නියමිත කාලයකදී ගෙවීමට අඳ ගොවියාට සිදුවන බව දක්වා ඇත. අඳ ගොවියා හා ඉඩම් හිමියා යන දෙපාර්ශ්වයේම කාලීන වෙනස්වීම්වලට ගැළපෙන ආකාරයේ සංශෝධන මෙම පනත මගින් සිදු කර ඇති බව පෙනේ.

## 2.9 වර්ෂ 2000 අංක 46 දරණ ගොවිජන සංවර්ධන පනත

වර්ෂ 2000 අංක 46 ගොවිජන සංවර්ධන පනත මගින් අඳ ගොවීන් සම්බන්ධව දක්වා ඇති නීතිරීති මෙතෙක් පනත්වල පැවති අඳ ගොවි නීතිරීතිවලට වඩා වෙනස් බැවින් මෙය අඳ ගොවීන්ට අයහපත් බලපෑම් ඇතිකර තිබෙන බව පෙනේ. මෙම පනතේ පරමාර්ථයන් වනුයේ ගොවිජන සංවර්ධන සභා පිහිටුවීමට විධිවිධාන සැලැස්වීම, ගොවිජන විනිශ්චය සභා පිහිටුවීම හා 1979 අංක 58 දරණ ගොවිජන සේවා පනත ඉවත් කිරීම සඳහා විධිවිධාන සලස්වා ගැනීමයි. අඳ ගොවීන් සම්බන්ධයෙන් ගත් කල මෙම පනත වැදගත් වනුයේ අඳ ගොවියා හෝ ඉඩම් හිමියා යන පාර්ශ්ව දෙකෙන් කුමන හෝ පාර්ශ්වයක් විසින් හෝ අදාළ කුඹුරු ඉඩම් මිලට ගැනීමට පෙළඹවීම නිසාය (හැන්සාඩ් වාර්තාව, 2000 අගෝ. 10).

වර්ෂ 2000 අංක 45 පනත අනුව අඳ ගොවිකම උරුමවීම පිළිබඳව පැහැදිලි නොවීම නිසා ගැටලු උද්ගත වී ඇත. මේ හේතුවෙන් අදාළ පාර්ශ්ව අතර මිනීමැරුම් පවා ඇති වී තිබේ.

අඳ ගොවියෙකු මිය ගිය පසුව ඉඩම් හිමියාට කුඹුර වගා කිරීමේ හැකියාවක් ඇති බව පනතේ සඳහන් වන අතර තවත් වරෙක සඳහන් වන්නේ අඳ අයිතිය අස් කළ නොහැකි බවයි.

පනතේ දෙවන වගන්තිය අනුව අඳ ගොවීන් විසින් වගා කරනු ලබන කුඹුරු ඉඩම් අඳ ගොවියා වෙතම විකිණීමට එම ඉඩම් හිමියන් ක්‍රියා කළ යුතු ආකාරය දක්වා ඇත. කුඹුරු හිමියා පළමුවෙන්ම තමා අඳයට වගා කරන කුඹුර විකිණීමට අදහස් කරන මිල සඳහන් කරමින් ලිඛිත දැනුම් දීමක් කළ යුතුය. එම දැනුම් දීමේ පිටපතක් අදාළ ගොවිජන සංවර්ධන සභාව වෙතද යැවිය යුතුය. එම මිලට මිලදී ගැනීමට කැමැත්ත ඉඩම්

හිමිකරුට හා ගොවිජන සංවර්ධන සභාවට දැනුම්දී නියමිත කාලයක් තුළ එය මිලට ගත යුතුය. එම මිලට ලබාගැනීමට අඳ ගොවියා අසමත් නම් ගොවිජන සංවර්ධන සභාව විසින් ප්‍රදේශයේ කුඹුරු ඉඩම්වල වෙළෙඳ වටිනාකම පදනම් කරගෙන ඉඩම් අයිතිකරුද විමසා සාධාරණ වන මිලක් නිශ්චය කර අඳ ගොවියාට කුඹුරු ඉඩම පැවරිය යුතු වේ. මෙම මිල ගණන් යටතේ අදාළ කාල සීමාව තුළ අඳ ගොවියා ඉඩම මිලට ගැනීම පැහැර හැර ඇතැයි කොමසාරිස්වරයා සෑහීමකට පත්වුව හොත් අඳ ගොවියා ඒ කුඹුරු ප්‍රමාණයෙන් අස් කිරීමට හැකිය. 1979 අංක 58 දරණ පනතේද මෙම ඉඩම් විකිණීමේ වගන්තිය ඇතුළත් කර තිබුණි.

අඳ ගොවියකුගේ අයිතිවාසිකම් පැවරීම හෝ ආපසු දීම සම්බන්ධව ඔහුගේ ඇති අදහස අදාළ ගොවි සංවිධාන සහ ගොවිජන සංවර්ධන සභාව වෙත ලියාපදිංචි තැපෑලෙන් දැනුම් දිය යුතු බව පනතේ 3(1) වගන්තියෙන් දක්වයි. ඒ අනුව අඳ හිමියාගේ අයිතිවාසිකම් ඉඩම් හිමියාට හෝ අයිතිකරුට ආපසු දීම සිදු කළ හැකිය.

පනතේ 4(1) වගන්තියෙන් දක්වා ඇත්තේ පූජනීය ස්ථාන සතු අඳ ගොවීන් විසින් වගා කරනු ලබන කුඹුරු ඉඩම් සම්බන්ධව එම පූජනීය ස්ථානයන්හි භාරකරුවන් විසින් ගොවිජන සංවර්ධන කොමසාරිස්වරයා වෙත ලිඛිත ඉල්ලීමක් කරනු ලැබුව හොත් අක්කර 2කට වැඩි නොවන ප්‍රමාණයක් අඳ ගොවීන්ගේ අයිතියෙන් නිදහස් කරගැනීමට හැකිවන බවයි. එහෙත් අඳ ගොවියකු යම් කුඹුරු ප්‍රමාණයකින් ඉවත් නොවී සිටී නම් එම අඳ ගොවියාට යම්කිසි වන්දි මුදලක් ගෙවීමෙන් එම අඳ ගොවියා නෙරපීම සඳහා ක්‍රියාමාර්ග ගැනීමට කොමසාරිස්වරයාට හැකිය.

යම් අඳ ගොවියකු තමන් වගා කරමින් සිටි කුඹුරු ඉඩම් ප්‍රමාණයෙන් අස් කරනු ලැබූ අවස්ථාවක එම අඳ ගොවියා ක්‍රියා කළ යුතු ආකාරය පනතේ 7(3) වගන්තියෙන් දක්වයි. ඒ අනුව අස්කරනු ලැබූ අඳ ගොවියකු විසින් ඒ පිළිබඳව කොමසාරිස්වරයා වෙත ලිඛිතව දැනුම් දිය යුතුය. ඉන්පසු කොමසාරිස්වරයා විසින් ගොවිජන විනිශ්චය සභාව වෙත අදාළ පැමිණිල්ල යොමු කොට අඳ ගොවියා අස්කර ඇද්ද යන්න පරීක්ෂා කිරීමට බලය ලබා දෙයි. එම අස්කිරීම තහවුරු වී ඇති අවස්ථාවක එම තීරණයට විරුද්ධව යම් කාලසීමාවක් ඇතුළත අභියාචනයක් සිදු කිරීමට ඉඩම් හිමියාට අවස්ථාව ඇති අතර, එලෙස අභියාචනයක් කර නොමැති නම් එම අස්කිරීම තහවුරු වී ඇති අවස්ථාවක අස්කිරීමට ලක්වූ තැනැත්තාට නැවත ඒ කුඹුරු ප්‍රමාණයේ භුක්තිය ආපසු ලබා ගැනීමට හිමිකම ඇති බව දැක්වේ. එසේම කුඹුරු හිමියා විසින් යම්කිසි නියම කරන ලද මුදලක් අලාභ වශයෙන් ගෙවිය යුතු යයි දක්වා තිබේ.

මෙම පනතේ (14) වන වගන්තියේ දක්වා ඇති පරිදි යම් කිසි අඳ ගොවියෙකු හට එම අඳ ගොවිකම කරගෙන යාමට යම්කිසි ආකාරයකින් බාධා කරන්නේ යයි මහේස්ත්‍රාත් උසාවියකදී ඔප්පු වුව හොත් එම වරද කළ තැනැත්තාට රුපියල් පන්දහසක් නොඉක්මවන දඩයක් නියම වේ.

මෙම පනතේ 9 (2) (I) උපවගන්තිය යටතේ අඳ ගොවියකු විසින් ඉඩම් හිමියාට ගෙවනු ලැබිය යුතු බද්ද නියමකර ඇත. ඒ අනුව මෙතෙක් නියම කරන ලද බද්දට වඩා අඩු බද්දක් එනම් කුඹුරු අක්කරයකින් වී බුසල් දහයකට නොඅඩු ගණනක් හෝ එම කුඹුරු ප්‍රමාණයෙන් උපදවන මුළු අස්වැන්නෙන් (නියමිත අයකිරීම් ප්‍රමාණය

අඩු කළ විට ඉතිරි කොටසෙන්) 1/4පංගුවකට නොඅඩු කොටසක් හෝ යන දෙකෙන් වඩා වැඩි ප්‍රමාණය එක් එක් කන්නය සඳහා ගෙවිය යුතු බව දක්වා ඇත.

පනතේ 20 (1) වගන්තියෙන් දක්වා ඇත්තේ ද මෙතෙක් අඳ ගොවි පනත්වලින් හඳුන්වා නොදුන් නීතියකි. එනම් අඳ ගොවියකු විසින් වගා කරනු ලබන ඉඩමක්, 2000 අංක 46 පනත ආරම්භ වීමේ දිනයේ සිට අවුරුදු දෙකක කාල සීමාවක් අවසානයේදී එම අඳ ගොවියාට විකුණා නොමැති නම් ඉඩම් අත් කරගැනීමේ පනත යටතේ අත් කරගනු ලැබිය හැකි බවයි. එලෙස අත් කරගනු ලබන කුඹුරු ඉඩමක් මේ පනත යටතේ පිහිටුවනු ලබන ඉඩම් බැංකුව වෙත සතු විය යුතු බව දක්වා තිබේ. පනතේ 37 වගන්තිය මඟින් ඉඩම් බැංකුව වෙත පවරනු ලබන ආකාරය දක්වා ඇත. ඉඩම් බැංකුව මගින් අඳ ගොවීන්ට ඉඩම් මිලට ගැනීමට මුදල් ආධාර ලබා ගත හැකිය. ඉඩම් බැංකුව පිහිටුවන තුරු ගොවිජන සංවර්ධන සභාව මෙම ඉඩම් බැංකුවේ කටයුතු ආවරණය කළ යුතුය.

එවැනි කුඹුරු ඉඩමක අඳ ගොවියන්ට මෙම පනතේ 10 වන වගන්තිය අනුව ගණන් බලන ලද වන්දි මුදලක් ගෙවිය යුතු යයි විධිවිධාන නියමකර ඇත.

මෙම පනත ඉදිරිපත් කිරීමේ අභිමතාර්ථයන් අතර ප්‍රධාන එකක් වූයේ අඳ ගොවීන් විසින් වගා කරනු ලබන කුඹුරු අඳ ගොවීන්ට හෝ ඉඩම් හිමියන් යන පාර්ශ්ව දෙකෙන් එක පාර්ශ්වයකට විකිණීමය. ඒ අනුව මින් ඉදිරියට අඳ ගොවීන් වශයෙන් පිරිසක් ශ්‍රී ලංකාවේ සිටිය නොහැක. එම නිසා මෙම පනතේ ජීවත්ව සිටින අඳ ගොවියාගෙන් පසුව අඳ කුඹුර අනුප්‍රාප්තිකයෙකුට හිමිවීමේ ක්‍රමයක් ගැන දක්වා නැත. මෙය 2000 පනතින් නිර්මාණය කරන ලද සුවිශේෂී තත්ත්වයක් වන අතර, එය මෙතෙක් ඉදිරිපත් වූ පනත් අනුව අඳ ගොවීන් හා ඔවුන්ගේ පරපුර ආරක්ෂා කරමින් පැවත ගෙන ආ ඉතිහාසය වෙනස් කිරීමේ ප්‍රබල සංධිස්ථානයක් ලෙස සැලකිය හැකිය.

එසේ වුවද මෙම පනත මඟින් දක්වා ඇති ඉහත දී විස්තර කළ අරමුණු ක්‍රියාත්මක කිරීමට හැකි වූයේ නැත. එම නිසා 2000 අංක 46 දරණ පනතින් පසුව අඳ ගොවීන් අළුතින් බිහිවීමක් සිදු නොවුණි. මෙම පසුබිම මත 2000 වර්ෂයේ සිට 2010 දක්වා අඳ ගොවි ක්‍රමය සම්බන්ධයෙන් විශාල ගැටලුකාරී ස්වභාවයක් උද්ගත වී ඇත.

තෙවැනි පරිච්ඡේදය

# අඳ ගොවීන්ගේ හා ඉඩම් හිමියන්ගේ සමාජ ආර්ථික තත්ත්වය

## 3.1 හැඳින්වීම

අඳ ගොවීන්ගේ සහ ඉඩම් හිමියන්ගේ සමාජ ආර්ථික තත්ත්වය පිළිබඳව විමර්ශනයක් මෙම පරිච්ඡේදය යටතේ ඉදිරිපත් කෙරේ. මෙහිදී අඳ ගොවීන් සම්බන්ධයෙන් පහත සඳහන් අංශ කෙරෙහි අවධානය යොමු කර ඇත.

අඳ ගොවීන් අයත්වන වයස් කාණ්ඩ, අඳ ගොවීන්ගේ අධ්‍යාපන මට්ටම, අඳගොවීන් නිරතව සිටින ද්විතීයික රැකියා, ඉඩම් හිමියන් කීපදෙනෙකු යටතේ වගා කිරීම, පාරම්පරිකව අඳ ගොවිතැන උරුම වීම, ප්‍රථම අඳ ගොවියා සහ වර්තමාන අඳ ගොවියා අතර ඇති සම්බන්ධය, ඉඩම් හිමියා සහ අඳ ගොවියා අතර ඇති සම්බන්ධය, ප්‍රවේණිය ගෙවීම, අඳ ගොවීන්ගේ පවුල්වල සාමාජිකයන්ගේ අධ්‍යාපන මට්ටම, අඳ ගොවීන්ගේ පවුල්වල සමාජිකයන්ගේ රැකියා මාර්ග යනාදියයි. ඉඩම් හිමියන් සම්බන්ධයෙන්ද පහත සඳහන් අංශයන් පිළිබඳව සාකච්ඡා කරනු ලැබේ. ඒ ඉඩම් හිමියන්ගේ සමාජ ආර්ථික තත්ත්වය, ඉඩම් හිමියන් විසින් අඳයට වගා කිරීමට ලබාදුන් කුඹුරු ඉඩම්වල ව්‍යාප්තිය, ඉඩම් හිමියා සහ අඳ ගොවියා අතර සුහදත්වය, ඉඩම් හිමියන් විසින් කුඹුරු ඉඩම විකුණනු ලැබීම, අස්වනු විෂමතාවය, ඉඩම් හිමියන්ගේ දැනුවත්භාවය හා අඳ ආරවුල් යනාදී වශයෙනි.

## 3.2 අඳ ගොවීන්ගේ සමාජ හා ආර්ථික තත්ත්වය

අඳ ගොවිතැන පිළිබඳව සමාජ විවරණයක යෙදීමේදී අඳ ගොවියා මෙන්ම ඉඩම් හිමියාද එක සේ වැදගත් වේ. අඳ ගොවියා තමන් වගා කරන කුඹුරු ඉඩම අඳයට ලබා ගන්නේ ඉඩම් හිමි ගොවියෙකුගෙනි. මෙම ඉඩම් හිමියා, අඳ ගොවියාගෙන් ප්‍රවේණිය ලබා ගැනීමේ පදනම මත ඉඩම වගා කිරීම සඳහා අඳ ගොවියාට ලබා දෙයි. එම ඉඩම් හිමියන්ගේ හා අඳ ගොවීන්ගේ සමාජ හා ආර්ථික පසුබිම පිළිබඳ විවරණයක් කිරීම මෙම පරිච්ඡේදය මගින් බලාපොරොත්තු වේ. කඩිනම් අවශ්‍යතාවයක් මත මෙම අධ්‍යයනය සිදු කරන ලද්දේ අනුරාධපුර, මාතර හා හම්බන්තොට දිස්ත්‍රික්කවල එක් දිස්ත්‍රික්කයකින් ගොවිජන සේවා මධ්‍යස්ථාන දෙකක් බැගින් දිස්ත්‍රික්ක තුන සඳහා මධ්‍යස්ථාන 6ක් ලෙස තෝරා ගැනීමෙනි. මෙහි දී හම්බන්තොට දිස්ත්‍රික්කයට අයත් ලුනම හා අම්බලන්තොට යන ගොවිජන සේවා මධ්‍යස්ථානත් මාතර දිස්ත්‍රික්කයට අයත් හක්මණ හා කඹුරුපිටිය ගොවිජන සේවා මධ්‍යස්ථානත්, අනුරාධපුර දිස්ත්‍රික්කයට අයත් හිදෝගම හා ඇලයාපත්තුව යන ගොවිජන සේවා මධ්‍යස්ථානත් තෝරා ගන්නා ලද අතර අඳ ගොවියන් හා ඉඩම් හිමියන් මෙම සමීක්ෂණයට භාජනය කරන ලදී. එහිදී පැහැදිලි වූයේ එම ප්‍රදේශවල අඳ ගොවීන් විසින් වගා කරනු ලබන කුඹුරුවල ඉඩම් හිමියන් බොහොමයක් මේ වන විට ප්‍රදේශයෙන් පිටත පදිංචි වී සිටින බවයි. එම නිසා සමීක්ෂණය සිදු කරන ලද කාලපරිච්ඡේදය තුළ ඉඩම් හිමියන් සැලකිය යුතු ප්‍රමාණයක් සොයා ගැනීමට අපහසු විය. වාර්තා වූ අන්දමට ඔවුන්ගෙන් බහුතරයක් කොළඹ, නුවර, වැනි නාගරික ප්‍රදේශවලද, ඇතැම් අය විදේශ රටවලද පදිංචි වී සිටිති. අනුරාධපුර දිස්ත්‍රික්කයේ නගර සීමාව තුළ පදිංචි අඳ ගොවීන්ගේ ඉඩම් සතු අයිතිකරුවන් විශාල වශයෙන් යාපනය ප්‍රදේශයේ පදිංචි දෙමළ වැසියන් බවත්

පසුගිය යුධ සමය තුළ ඔවුන් ප්‍රවේණිය ලබාගැනීම සඳහා අනුරාධපුරයට පැමිණීම සහ ඉඩම පිළිබඳ සොයා බැලීම අඩු වූ බවත් වාර්තා විය. කෙසේ වුවද යුධ වාතාවරණය නිමවීමත් සමග එම ඉඩම් හිමියන් නැවතත් තම ඉඩම් පිළිබඳ සොයා බැලීමටත්, ප්‍රවේණිය අය කරගැනීමටත් පැමිණෙන බව වාර්තා වී තිබේ.

### අඳ ගොවීන් අයත්වන වයස් කාණ්ඩයන්

මුළු නියැදියෙන් වැඩිම අඳ ගොවින් සංඛ්‍යාවක් එනම් 50%ක් පමණ නියෝජනය කරන්නේ වයස අවුරුදු 52-65 වයස් කාණ්ඩයයි. මෙම අඳ ගොවින් සියළු දෙනාම ප්‍රථම අඳ ගොවීන් හෝ ඔවුන්ගේ ලේ ඥාතීන්ය. එනම් දෙවැනි පරපුරේ අඳ ගොවීන් වේ. වයස අවුරුදු 51ට අඩු වයස් කාණ්ඩයේ අඳ ගොවීහු 38% ක් පමණ සිටිති මෙම වයස් කාණ්ඩ දෙකම අනුව පෙනී යන්නේ වයස අවුරුදු 65ට අඩු අඳ ගොවීන් බහුතරයක් සිටින බවයි. අවුරුදු 65ට වැඩි වයස් කාණ්ඩයේ අඳ ගොවීන් ප්‍රමාණය 12%-19%ත් අතර සුළු පිරිසකි. අඳ ගොවි පනත සම්මත වුයේ 1958 වසරේදීය. අඳ ගොවි පනතට වසර 52ක ඉතිහාසයක් ඇති නිසා වයස 65ට වැඩි වයස් කාණ්ඩයට මුල් පරපුරේ අඳ ගොවින් යම්කිසි ප්‍රමාණයක්ද ඇතුළත් වී ඇත.

වගු අංක 1 : එක් එක් වයස් කාණ්ඩවලට අයත් අඳ ගොවීන් සංඛ්‍යාව

| දිස්ත්‍රික්කය | වයස් කාණ්ඩය (අවුරුදු) | | | එකතුව |
|---|---|---|---|---|
| | 51 ට අඩු<br>% | 52-65<br>% | 65 ට වැඩි<br>% | |
| හම්බන්තොට | 38 | 48 | 14 | 100 |
| මාතර | 38 | 50 | 12 | 100 |
| අනුරාධපුරය | 31 | 50 | 19 | 100 |

මුලාශ්‍රය: ක්ෂේත්‍ර සමීක්ෂණ දත්ත, (2010).

### අඳ ගොවීන්ගේ අධ්‍යාපන මට්ටම

අඳ ගොවීන් බහුතර සංඛ්‍යාවක් ද්විතියික අධ්‍යාපන මට්ටමක (6-13 ශ්‍රේණි) සිටි අයයි. අධ්‍යයනයට භාජනය කරන ලද අඳ ගොවීන් අතුරින් 7%ක්ම අයත් වුයේ මෙම අධ්‍යාපන මට්ටමටයි. ශ්‍රී ලංකාවේ අධ්‍යාපන ක්ෂේත්‍රයේ දියුණුව නිසා ග්‍රාමීය ජනතාවද උසස් අධ්‍යාපනයක් ලැබීමට යොමු වෙති. ප්‍රාථමික අධ්‍යාපනය පමණක් හිමි කරගෙන ඇති අඳ ගොවීන් සංඛ්‍යාව ද්විතියික අධ්‍යාපනය ලබාගන්නවුනට සාපේක්ෂව සුළු ප්‍රමාණයකි. එනම් 13% සිට 26% දක්වා වූ ප්‍රමාණයකි. උපාධිය ලබා සිටි අඳ ගොවීන් 6%ක් මාතර දිස්ත්‍රික්කයෙන්ද පාසැල් අධ්‍යාපනය නොලද අඳ ගොවීන් 15%ක් අනුරාධපුර දිස්ත්‍රික්කයෙන්ද වාර්තා විය. ප්‍රස්තාර අංක 1 මේ පිළිබඳ වැඩිදුරටත් විස්තර දක්වයි. මෙලෙස ද්විතියික අධ්‍යාපන සුදුසුකම් සපුරා ඇති පිරිස අවුරුදු 65ට අඩු වයස් කාණ්ඩයේ අයයි.

ප්‍රස්තාර අංක 1: අඳ ගොවීන්ගේ අධ්‍යාපන මට්ටම




මූලාශ්‍රය: ක්ෂේත්‍ර සමීක්ෂණ දත්ත, (2010).

වගු අංක 2: අඳ ගොවීන්ගේ ප්‍රධාන රැකියා මාර්ග

| දිස්ත්‍රික්කය | රැකියාව | | | | | | එකතුව |
|---|---|---|---|---|---|---|---|
| | ගොවිතැන % | රජයේ රැකියා % | පෞද්ගලික රැකියා % | පුහුණු කම්කරු % | කෘෂිකාර්මික කම්කරු % | වෙනත් % | |
| හම්බන්තොට | 93 | - | 3 | - | - | 4 | 100 |
| මාතර | 69 | 6 | 6 | 13 | 6 | - | 100 |
| අනුරාධපුර | 77 | 17 | - | 3 | 3 | - | 100 |

මූලාශ්‍රය: ක්ෂේත්‍ර සමීක්ෂණ දත්ත, (2010).

අඳ ගොවීන් බහුතර සංඛ්‍යාවකගේ ප්‍රධානතම රැකියාව ගොවිතැන බව හෙළි වී ඇත. එනම් හම්බන්තොට 93%ක්, මාතර 69%ක් හා අනුරාධපුර 77%ක් වශයෙනි (වගු අංක 2). ගොවිතැන ප්‍රධාන රැකියාව කරගත් වැඩිම අඳ ගොවීන් ප්‍රතිශතයක් වාර්තා වන්නේ හම්බන්තොට දිස්ත්‍රික්කයෙනි. හම්බන්තොට දිස්ත්‍රික්කයේ අඳ ගොවීන් ප්‍රකාශ කරන්නේ ඔවුන් හට ඇති එකම ජීවන මාර්ගය ගොවිතැන බවයි. ඉතාම සුළු අඳ ගොවීන් සංඛ්‍යාවක් පමණක් ප්‍රධාන රැකියාව ලෙස ස්වයං රැකියා වැනි කටයුතුවල නිරත වී සිටිති. හම්බන්තොට හැරුණු විට අනුරාධපුර දිස්ත්‍රික්කයේද වැඩිම අඳ ගොවීන් ප්‍රමාණයකගේ ප්‍රධාන රැකියාව ගොවිතැනය. එහි ඇති විශේෂත්වය වන්නේ ප්‍රධාන රැකියාව ලෙස රජයේ රැකියාවන් හි නියුතු 17%ක සැලකිය යුතු ප්‍රතිශතයක්ද සිටීමයි. මෙම දිස්ත්‍රික්ක දෙකේම විශේෂත්වය වන්නේ ගොවිතැන හැරුණු විට වෙනත් ප්‍රධාන ජීවන මාර්ගවල ඇති හිඟකමය. මාතර දිස්ත්‍රික්කයේ තත්ත්වය මීට වඩා වෙනස්ය. මාතර දිස්ත්‍රික්කයේ වැවිලි බෝග වගාවද, වෙනත් ක්ෂේත්‍රවල කම්කරු වැනි රැකියා මාර්ග බහුලවීමද නිසා ජනතාවට වෙනත් රැකියාවන්හි යෙදීමේ ඉඩකඩද ඇත.

## අද ගොවීන් නිරතව සිටින වෙනත් රැකියා

කෘෂිකාර්මික ද්‍රව්‍යයන් හි මිල උච්චාවචනය, දේශගුණික සාධක හා පළිබෝධ ගැටළු නිසා කෘෂිකර්මාන්තයෙන් පමණක් ආදායම් අපේක්ෂා කිරීම අවධානම්සහගතය. එම අවධානම්සහගත බවින් මිදී ආර්ථික ස්ථාවරත්වයක් ගොඩනගා ගැනීම සඳහා කෘෂිකර්මාන්තය ප්‍රධාන ජීවන වෘත්තිය කරගත් පුද්ගලයන් ද්විතියික රැකියාවක නිරතවීම වැදගත්ය. විශේෂයෙන්ම අද ගොවියන් වශයෙන් කටයුතු කරන පුද්ගලයා යනු අස්වැන්නෙන් ප්‍රවේණිය වශයෙන් කොටසක් ඉඩම් හිමියාට ගෙවන හා වගා කරන ඉඩමේ ස්ථිර අයිතිවාසිකමක් නැති, ගිවිසුමකින් පමණක් බැඳි සිටින පුද්ගලයෙකි. එම තත්ත්වය මත ද්විතීක ආදායම් මාර්ගයක වැදගත්කම වැඩිය. සමීක්ෂණ නියැදියේ අද ගොවින් සම්බන්ධයෙන්. වෙනත් හෝ ද්විතීක ආදායම් මාර්ග පිළිබඳව වගු අංක 3න් සාකච්ඡා කරනු ලැබේ. ද්විතීයික ආදායම් මාර්ග හෝ වෙනත් ආදායම් මාර්ග ලෙස මෙහිදී අදහස් කරන්නේ අද ගොවිතැනට අමතරව නියැළී සිටින ආදායම් උත්පාදන ජීවන මාර්ගයන්ය. ඇතැම් අද ගොවීන්ගේ එවැනි ජීවන මාර්ග කලින් සඳහන් කළ පරිදි තම ප්‍රධාන ජීවන මාර්ගය වෙයි.

**වගු අංක 3: අද ගොවීන් යෙදී සිටින වෙනත් ජීවන මාර්ග**

| | ද්විතියික රැකියාව | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| දිස්ත්‍රික්කය | වෙනත් රැකියාවල නියුතු නොවන % | රජයේ රැකියා % | පෞද්ගලික අංශයේ රැකියා % | කම්කරු රැකියා % | ස්වයං රැකියා % | විශ්‍රාමික % | එකතුව |
| හම්බන්තොට | 84 | - | - | - | 19 | - | 100 |
| මාතර | 69 | 6 | 6 | 13 | - | 6 | 100 |
| අනුරාධපුරය | 70 | - | - | 23 | 7 | - | 100 |

මූලාශ්‍රය: ක්ෂේත්‍ර සමීක්ෂණ දත්ත. (2010).

වගු අංක 3 අනුව පැහැදිලි වන්නේ වෙනත් රැකියාවක නිරත වන අද ගොවීන් සංඛ්‍යාව ඉතා අඩු බවයි. දිස්ත්‍රික්ක තුනේදීම පෙනී ගියේ වෙනත් රැකියා නොමැති ගොවිතැන එකම රැකියාව වූ පිරිස විශාල බවයි. මෙම තත්ත්වය ගොවි ආර්ථිකයේ ස්ථාවරත්වය සඳහා එතරම් යහපත් නැත. මාතර දිස්ත්‍රික්කයේ නියැදියේදී රජයේ රැකියාවන්හි නිරත අද ගොවීන් සංඛ්‍යාව සෙසු දිස්ත්‍රික්ක සමඟ සසඳන විට වැඩි ප්‍රමාණයකි. ඊට හේතුව මාතර දිස්ත්‍රික්කයේ කුඹුරු ඉඩම්වල ප්‍රමාණය කුඩා වීම නිසා ප්‍රදේශයෙන් දුර බැහැර වෙනත් ප්‍රදේශයක රැකියාවක් කරමින් වගාව කරගෙන යාමට යොමු වීම සහ අනුරාධපුර දිස්ත්‍රික්කයේ නියැදි ප්‍රදේශය අනුරාධපුර නගරයට තරමක් සමීප වීම නිසා රැකියා අවස්ථා වැඩි වීම යනාදියයි.

**වගු අංක 4: අඳ ගොවියෙකු වශයෙන් වගා කටයුතු කර තිබෙන කාලය**

| දිස්ත්‍රික්කය | එක් ඉඩම් හිමියකු යටතේ | | | ඉඩම් හිමියන් දෙදෙනෙකු යටතේ | | |
|---|---|---|---|---|---|---|
| | වසර 40 ට අඩු % | වසර 40 ට වැඩි % | එකතුව | වසර 40 ට අඩු % | වසර 40 ට වැඩි % | එකතුව |
| හම්බන්තොට | 71 | 29 | 100 | 86 | 14 | 100 |
| මාතර | 81 | 19 | 100 | 67 | 33 | 100 |
| අනුරාධපුරය | 66 | 34 | 100 | 100 | - | 100 |

මූලාශ්‍රය: ක්ෂේත්‍ර සමීක්ෂණ දත්ත. (2010).

එක් අඳ ගොවියෙකු ඉඩම් හිමියන් එක් අයකු හෝ කිහිප දෙනෙකු යටතේ අඳ ක්‍රමයට ඉඩම් වගාකිරීමට හැකියාව තිබේ. ඉඩම් හිමියන් කීපදෙනෙකු යටතේ ඉඩම් වගා කරනු ලබන අඳ ගොවියෝ පවුලේ ශ්‍රමය ප්‍රමාණවත් තරම් ඇති ආර්ථික ශක්තියෙන්ද ඉහළ පුද්ගලයෝය. එසේම අඳ ගොවි පනත සම්මත කර අඳ ගොවිතැන නීතිගත කර මේ වන විට වසර 52ක් පමණ ගත වී ඇති අතර මුල්ම පරපුරේ අඳ ගොවීන් මිය ගොස් හෝ වයෝවෘද්ධ තත්ත්වයට පත් වී සිටී. මෙම සමීක්ෂණයේ දී හෙළි වූයේ ඇතැමුන් එක් ඉඩම් හිමියෙකු යටතේ හෝ ඉඩම් හිමියන් දෙදෙනෙකු යටතේ වසර 40කට වඩා අඩු කාලයක් අඳ ගොවීන් ලෙස කටයුතු කර ඇති බවය. දිස්ත්‍රික්ක තුනෙහිම වසර 40ට අඩු ප්‍රමාණයක් වගා කළ පිරිස වැඩිය. මෙයට හේතුව මෙම අඳ ගොවීන් දෙවන පරපුර නියෝජනය කිරීමයි. වසර 40 ට වඩා වැඩි වසර ගණනක් වගා කළ අඳ ගොවීහු පළමු පරපුර හා දෙවන පරපුර නියෝජනය කරති. ඇතැම් නිවෙස්වල වයෝවෘද්ධ පළමු අඳ ගොවියා සිටින අතර දරුවන් විසින් කුඹුරු වගා කරනු ලැබේ. ඉහත සංඛ්‍යා සටහන අනුව පෙනී යන්නේ ඉඩම් හිමියන් එක් අයෙකු හෝ දෙදෙනෙකු යටතේ වසර 40ට වඩා වැඩි කාලයක් ඉඩම් වගාකළ අඳ ගොවින් සංඛ්‍යාත්මකව අඩු පිරිසක් බවයි. වසර 40ට වඩා වැඩි අඳ ගොවින් වැඩිම සංඛ්‍යාවක් වාර්තා වන්නේ හම්බන්තොට සහ අනුරාධපුර දිස්ත්‍රික්කවලිනි.

**ඉඩම් හිමියන් කීපදෙනෙකු යටතේ වගා කිරීම**

සමීක්ෂණයේ දී ඇතැම් ගොවීන් ඉඩම් හිමියන් කීපදෙනෙකු යටතේ අඳ ගොවීන් ලෙස ක්‍රියාකරනු දැකිය හැකි විය. එලෙස ඉඩම්හිමියන් කිප දෙනෙකු යටතේ ඉඩම් වගා කිරීමට පවුලේ පිරිස් බලය මෙන්ම ආර්ථික ශක්තියද තිබිය යුතුය. කෙසේ වුවත් සමීක්ෂණයේදී දැකගත හැකි වූයේ එක් ඉඩම් හිමියෙකු යටතේ පමණක් ඉඩම් වගා කරන අඳ ගොවීන් බහුතරයක් සිටින බවයි. ප්‍රස්තාර අංක 2 යටතේ මේ පිළිබඳව පැහැදිලි කර ඇත.

**ප්‍රස්තාර අංක 2: එක් අඳ ගොවියකු ඉඩම් හිමියන් කීහිපදෙනෙකු යටතේ වගා කරනු ලැබීම**




මූලාශ්‍රය: ක්ෂේත්‍ර සමීක්ෂණ දත්ත. (2010).

මෙයින් පැහැදිලි වන්නේ මෙම නියැදියේ එක් ඉඩම් හිමියකු යටතේ ඉඩම් වගා කරන අඳ ගොවීන් ප්‍රමාණය වැඩි අතර දෙදෙනෙකු හා තුන් දෙනෙකු යටතේ ඉඩම් වගා කරන අඳ ගොවීන් සංඛ්‍යාව ඊට සාපේක්ෂව අඩු බවයි. මුලින් සඳහන් කළ පරිදි, පවුලේ ශ්‍රමය පිළිබඳ ගැටලුව හා ආර්ථික තත්ත්වයන්, මෙන්ම මුල් කාලයේ කුඹුරු කීහිපයක් අඳ ක්‍රමයට වගා කිරීම සඳහා ලබාගැනීම ඉතා අපහසු කටයුත්තක් වීම මෙම තත්ත්වයට මූලික හේතුන් වේ.

### පාරම්පරිකව අඳ ගොවිතැන උරුම වීම

නීත්‍යානුකූල මුල්ම අඳ ගොවියාගෙන් පසු අඳ ගොවි පරපුරක් නිර්මාණය වීම සඳහා 1958 අංක 01 දරණ කුඹුරු පනතේ සිට 2000 අංක 46 දරණ ගොවිජන සංවර්ධන පනත දක්වා පනත්වලින් නීතිමය ඉඩකඩ ලැබී තිබුණි. ඒ අනුව මුල් අඳ ගොවියාගේ ඇවෑමෙන් කලත්‍රයාටද ඉන්පසු පවුලේ වැඩිමහල් දරුවාටද, ඔහු රැකියාවක් කරන්නේ නම් වෙනත් දරුවකුටද, නැතහොත් ලේ ඥාතියෙකුටද යනාදී වශයෙන් කුඹුර හා කුඹුර වගා කළ අඳ ගොවියාගේ පරපුර අතර බැඳීමක් නිර්මාණය කර තිබුණි. සමීක්ෂණ නියැදිය අනුව මෙම තත්ත්වය පහත සංඛ්‍යා සටහනින් පැහැදිලි කළ හැක.

**වගු අංක 5: නියෝජනය කරන පරපුර අනුව අඳ ගොවීන් වර්ගීකරණය**

| දිස්ත්‍රික්කය | අඳ ගොවි පරපුර නියෝජනය කරන ප්‍රතිශතය % | | | |
|---|---|---|---|---|
| | පළමු පරපුර % | දෙවැනි පරපුර % | තෙවැනි පරපුර % | එකතුව |
| හම්බන්තොට | 19 | 71 | 10 | 100 |
| මාතර | 12 | 69 | 19 | 100 |
| අනුරාධපුර | 28 | 72 | - | 100 |

මූලාශ්‍රය: ක්ෂේත්‍ර සමීක්ෂණ දත්ත. (2010).

අඳ ගොවියාගේ පරපුරේ සම්බන්ධය ලෙස ගත් කල වැඩිම ප්‍රමාණයක් නියෝජනය කරන්නේ දෙවන පරපුරේ අඳ ගොවීන් ලෙසය. දෙවන පරපුරේ අඳ ගොවීන්ට සාපේක්ෂව පළමුවන පරපුරේ අඳ ගොවීන් සුළු ප්‍රමාණයක් සිටිති. කුඹුරු පනත සම්මත වී වසර 52ක් ගතවීම නිසා මුල් පරපුරේ අඳ ගොවීන් වයෝවෘද්ධ වීම ඊට හේතුව වී ඇත. තුන්වන පරපුරේ අඳ ගොවීන් යනු දෙවන පරපුරේ අඳ ගොවීන්ගේ දරුවන්ය. මොවුන් ඉතාමත්ම තරුණ වයසේ සිටින ගොවීන් වන අතර පරපුරෙන් පරපුර නියෝජනය කරමින් නොකඩවා අඳ ගොවිකම ඉදිරියට රැගෙන එන පිරිසයි.

### පළමුවන අඳ ගොවියා සහ වර්තමාන අඳ ගොවියා අතර ඇති සම්බන්ධතාවය

අඳ ගොවි පනතේ වරින්වර සිදු කරන ලද වෙනස්කම්වලින් මුල් අඳ ගොවියාගෙන් පසු කලත්‍රයාටත් ඉන්පසු වැඩිමල් පුතාට හෝ වෙනත් ලේ ඥාතිවරයෙකුටත් අඳ ගොවිකම උරුම වෙයි. සමීක්ෂණ නියැදියේදී පළමුවන අඳ ගොවියා සහ දෙවැනි සහ තෙවැනි පරපුරේ ගොවීන් අතර සම්බන්ධතාවය විමසීමේදී පෙනී යන්නේ වැඩිම අඳ ගොවීන් සංඛ්‍යාවකගේ සම්බන්ධතාවය පියපුතු බැඳීම වන බවයි. මෙහි පළමුවන අඳ ගොවියා පියායි. සහෝදරයන් සහ වෙනත් ලේ ඥාතීන් මෙම නියැදි ගොවීන් අතර සිටියේ සුළු වශයෙනි. වගු අංක 6 මෙම තත්ත්වය තවදුරටත් පැහැදිලි කර ඇත.

**වගු අංක 6: අඳ ගොවි පරපුරේ සම්බන්ධතාවය**

| දිස්ත්‍රික්කය | පළමුවන අඳ ගොවියාට ඇති සම්බන්ධය | | |
|---|---|---|---|
| | දෙමව්පියන් % | වෙනත් ඥාතීන් % | එකතුව |
| හම්බන්තොට | 94 | 6 | 100 |
| මාතර | 100 | - | 100 |
| අනුරාධපුරය | 83 | 17 | 100 |

මූලාශ්‍රය: ක්ෂේත්‍ර සමීක්ෂණ දත්ත, (2010).

ඉහත වගුව අනුව පෙනී යන්නේ අඳ ගොවීන් බහුතරය දූ දරු සම්බන්ධතාවයක් ඇති අය බවයි.

### ඉඩම් හිමියා හා අඳ ගොවියා අතර සම්බන්ධතාවය

ඉඩම් හිමියා හා අඳ ගොවියා අතර සම්බන්ධතාවයක් තිබීමට හෝ නොතිබීමට පුළුවන. එසේම ඉඩම් හිමියා සහ අඳ ගොවියා අතර සම්බන්ධතාවයක් පවතින නමුත් එය ඥාති සබඳතාවයක්ම නොවීමට ඉඩ ඇත. 1950 දශකයේ දී වී වගා කිරීමට ඉඩම් නොමැති පුද්ගලයින් වැඩිපුර ඉඩම් ඇති පුද්ගලයින්ගෙන් ඉඩම් ඉල්ලාගෙන අඳ ගොවීන් ලෙස එම ඉඩම් වගා කළ බව අඳ ගොවීන් පිළිබඳ ඉතිහාසය අනාවරණය කරයි. පසු කාලයේදී ඉඩම් හිමියන් විසින් ප්‍රදේශයේ දක්ෂ ගොවීන්, හිතවතුන් හෝ ඥාතීන්ට තම ඉඩම් වගා කිරීම සඳහා ලබා දී ඇත. එපමණක් ද නොව දෙමව්පියන්ගේ ඉඩම් දරුවන් විසින් අඳ ක්‍රමයට වගා කරනු ලැබීමද ක්ෂේත්‍රයේ දී දක්නට ලැබේ. එම නිසා ඉඩම් හිමියා සහ අඳ ගොවියා අතර සම්බන්ධතාවයේ විවිධ ස්වරූප තිබිය හැකිය. මෙම

සමීක්ෂණට අනුව නියැදියේ දිස්ත්‍රික්ක තුනෙහිම වැඩිම අඳ ගොවීන් සංඛ්‍යාවක් තමා වගා කරන ඉඩමේ ඉඩම් හිමිකරු සමග ඥාති සම්බන්ධතාවයක් නොමැති බව හෙළි වේ. එනම් මොවුන් හෝ මොවුන්ගේ පියවරුන් පෙර සඳහන් කළ පරිදි 1950 දශකයේ වී වගා කිරීමට ඉඩම් නොමැතිකම මත ඉඩම් ඇති අයගෙන් ඉඩම් ඉල්ලාගෙන වගා කළ පුද්ගලයන් විය හැක. එනිසා මොවුන් අතර ඥාති සබඳතා හෝ හිතවත්කම් නොමැත. හිතවත්කම ගොඩනැගී ඇත්තේ අඳ ගොවියකු ලෙස ඉඩම වගා කිරීම නිසාය. විශාල ඉඩම් හිමියන් නොව සාමාන්‍ය ඉඩම් හිමියන්ද විවිධ හේතු මත තම ඥාතීන්ට, හෝ හිතවතුන්ට තමන් සතු කුඹුර වගාකිරීමට ලබා දෙන අවස්ථාද විය. එවැනි අවස්ථාවලදී අඳ ගොවියා සහ ඉඩම් හිමියා අතර පැහැදිලි සබඳතාවයක් දක්නට ඇත. වගු අංක 7 මගින් මෙම තත්ත්වය පැහැදිලි කර ඇත.

**වගු අංක 7: ඉඩම් හිමියා සහ අඳ ගොවියා අතර සම්බන්ධතාවය**

| දිස්ත්‍රික්කය | සම්බන්ධතාවය | | | | එකතුව |
|---|---|---|---|---|---|
| | දෙමව්පියන් % | වෙනත් නෑදෑයන් % | මිතුරන් % | සම්බන්ධයක් නැත % | |
| හම්බන්තොට | 2 | 17 | 21 | 60 | 100 |
| මාතර | 7 | 40 | 20 | 33 | 100 |
| අනුරාධපුර | 6 | 3 | 22 | 64 | 100 |

මූලාශ්‍රය: ක්ෂේත්‍ර සමීක්ෂණ දත්ත. (2010).

ඉඩම් හිමියාත් අඳ ගොවියාත් අතර දැඩි සම්බන්ධතාවයක් නැති බව හම්බන්තොට හා අනුරාධපුර දිස්ත්‍රික්ක දෙකේදී පෙනී යයි. එනම් විශාල ඉඩම් කැබලි වගා කරන මෙම දිස්ත්‍රික් දෙකෙහි වගා නඩත්තු කිරීමට කැමති පුද්ගලයන්ට ඉඩම් ලබාදී ඇති අතර එසේ ලබාදීම සඳහා සබඳතාවයක් පදනම් වී නැත. එහෙත් මාතර දිස්ත්‍රික්කයේ කුඩා ඉඩම් කැබලි අඳ ගොවි ක්‍රමය යටතේ වගා කරනු ලබන අතර එහිදී ඥාති සබඳතා හා මිත්‍ර සබඳතා සලකා ඉඩම් ලබා දී ඇත.

සමස්තයක් වශයෙන් සැලකීමේදී සමීක්ෂණයට භාජනය කළ දිස්ත්‍රික්ක තුනේම ඉඩම් හිමියන් හා අඳ ගොවීන් අතර කිසියම් හෝ ඥාති සම්බන්ධයක් නොමැති බව 60%ක් ප්‍රකාශ කළ අතර ඥාති සම්බන්ධයක් ඇති අවස්ථා (දෙමවුපිය, දූ දරු, මිතුරන් හෝ වෙනත් නෑදෑයකු) වාර්තා වූයේ 40%ක් පමණි. කෙසේ නමුත් මාතර දිස්ත්‍රික්කය තුළ පමණක් ඉඩම් හිමියන් හා අඳ ගොවීන් අතර කිසියම් ඥාති සම්බන්යක් ඇති අවස්ථා 71%ක් වාර්තා විය. නමුත් අනුරාධපුරය හා හම්බන්තොට දිස්ත්‍රික්ක සැලකූ විට ඉඩම් හිමියන් හා අඳ ගොවීන් අතර සම්බන්ධය දුර්වල මට්ටමක පවතී. මෙසේ මාතර දිස්ත්‍රික්කය තුළ ඉහළ ඥාති මිත්‍ර සම්බන්ධතාවයක් පැවතීමට හේතුව වන්නේ එම ප්‍රදේශයේ පවතින ඉඩම් කුඩා වීමත් ඒවායේ ගොවිතැන් කටයුතු කරන අය ප්‍රධාන ජීවනෝපාය ලෙස වෙනත් රැකියා මාර්ගවල නිරතවීමත්ය. ඔවුන් බොහෝ විට අඳයට වගා කරන තම ඉඩමෙන් බලාපොරොත්තු වනුයේ පවුලේ සාමාජිකයන්ගේ ආහාර අවශ්‍යතාවය සපුරා ගැනීමයි. මෙයට හේතුව අනුරාධපුරයට හා

හම්බන්තොටට සාපේක්ෂව මාතර ප්‍රදේශයේ ගම්මාන පාරම්පරික වීමත් ඒ නිසා කුඹුරු වගා කිරීමට නොහැකි ඉඩම් හිමියන් විසින් හැකියාව ඇති තම ඥාතීන්ට ඉඩම් වගා කිරීමට ලබා දීමත් ය.

**ප්‍රවේණිය ගෙවීම**

ඉඩම් හිමියා තම කුඹුරු ඉඩමේ නිෂ්පාදනය කිරීමේ බලය වෙනත් පුද්ගලයකුට ලබා දෙයි. ඔහු අඳ ගොවියා නම් වන අතර ඔහු ඉඩම් හිමියාට බද්දක් ගෙවයි. එය ප්‍රවේණිය නමින් හැඳින්වේ. ශ්‍රී ලංකාවේ විවිධ ප්‍රදේශවල විවිධ ප්‍රමාණයෙන් ප්‍රවේණිය ගෙවීමේ සම්ප්‍රදායන් පවතී. හම්බන්තොට දිස්ත්‍රික්කයේ මහා වාරිමාර්ග ක්‍රමය අනුව වගා කරන ප්‍රදේශවල අක්කරයට බුසල් 14ක් හා වර්ෂාපෝෂිත ප්‍රදේශවල අක්කරයට බුසල් 12ක්ද ලෙස ප්‍රවේණිය ගෙවයි. අනුරාධපුර දිස්ත්‍රික්කයේද මහා වාරිමාර්ග ප්‍රදේශවල අක්කරයට බුසල් 14,16ක් හා වර්ෂාපෝෂිත ප්‍රදේශවල අක්කරයට බුසල් 10,11,12 වැනි ප්‍රමාණවලින් එය ගෙවයි. මාතර දිස්ත්‍රික්කයේ අස්වැන්නෙන් 1/4ක් හා මෙම දිස්ත්‍රික්කයේම ඇතැම් ප්‍රදේශවල අක්කරයට බුසල් 10, 11 වැනි ප්‍රමාණයක්ද ගෙවයි. ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුවේ තොරතුරු අනුව හෙළි වන්නේ ගාල්ල, කෑගල්ල, කුරුණෑගල යන දිස්ත්‍රික්කවල කුඹුරු අක්කරයකින් වී බුසල් 10කට නොඅඩු ප්‍රමාණයන් හෝ එම කුඹුරු ප්‍රමාණයේ නිපදවන මුළු අස්වැන්නෙන් නියමිත අඩු කිරීම් සිදු කොට ඉතිරියෙන් 1/4 පංගුවට නොඅඩු කොටසක් හෝ යන දෙකෙන් වැඩි ප්‍රමාණය ප්‍රවේණිය වශයෙන් ලබා දීම ක්‍රියාත්මක වන බවයි. පහත සඳහන් වගු අංක 8න් විස්තර කරන්නේ සමීක්ෂණ නියැදියේ අඳ ගොවීන් විසින් ප්‍රවේණිය ගෙවනු ලැබීම හා සම්බන්ධ තොරතුරුය.

**වගු අංක 8: ප්‍රවේණිය ගෙවීමේ ක්‍රමය අනුව අඳ ගොවීන්ගේ ප්‍රමාණය**

| දිස්ත්‍රික්කය | අඳ ගොවීන්ගේ ප්‍රතිශතය (%) | | එකතුව |
|---|---|---|---|
| | ස්ථාවර ප්‍රමාණය (අක්.1ට බුසල් 14 වැනි) | අස්වැන්නෙන් 1/4 | |
| හම්බන්තොට | 100 | - | 100 |
| මාතර | 31 | 69 | 100 |
| අනුරාධපුර | 94 | 6 | 100 |

මූලාශ්‍රය: ක්ෂේත්‍ර සමීක්ෂණ දත්ත. (2010).

**අඳ ගොවි පවුල්වල සාමාජිකයන්ගේ අධ්‍යාපන මට්ටම**

අඳ ගොවීන්ගේ පවුල්වල සාමාජිකයන් අතරින් බහුතරයක් ද්විතියික අධ්‍යාපනය ලබා ඇති බව වාර්තා වේ. අනතුරුව වැඩිම පිරිසක් ප්‍රාථමික අධ්‍යාපනයක් හෝ ලද අයයි. දිස්ත්‍රික්ක තුනෙහිම උපාධිධාරී මට්ටමේ සිටින ප්‍රතිශතය සුළු ප්‍රමාණයකි. මෙම අධ්‍යාපන තත්ත්වයන් සැලකිල්ලට ගත් විට පෙනී යන්නේ සාමාන්‍ය සමාජයේ අධ්‍යාපනික තත්ත්වයේම හරස්කඩක් මින් නිරූපණය වන බවය. පහත සඳහන් ස්ථම්භ ප්‍රස්තාර සටහනින් මෙය වැඩිදුරටත් පැහැදිලි වෙයි.

ප්‍රස්තාර අංක 3: අද ගොවි පවුල්වල සාමාජිකයන්ගේ අධ්‍යාපන මට්ටම




මූලාශ්‍රය: ක්ෂේත්‍ර සමීක්ෂණ දත්ත, (2010).

පාසැල් නොගිය ඉතා සුළු පිරිසක්ද මෙම සාමාජිකයන් අතර සිටින අතර මොවුහු එම පවුල්වල සිටින වයස්ගත හා අබල දුබල අය වෙති.

### අද ගොවි පවුල්වල සාමාජිකයන්ගේ රැකියා මාර්ග

අද ගොවීන්ගේ පවුල්වල ශ්‍රම හමුදාවට අයත් වන සාමාජිකයන් විවිධ ජීවන මාර්ගවල යෙදී සිටින බව හෙළි වේ. මෙයින් බහුතරය කෘෂිකාර්මික උදවුකරුවන් වශයෙන් කටයුතු කරති. එනම්, පවුලේ ස්ථිර රැකියා මාර්ග නොමැති දූ දරුවන්, පියාට හෝ පවුලේ කෘෂිකර්මයෙහි යෙදෙන පුද්ගලයාට උදව්කරුවන් වශයෙන් ක්‍රියා කිරීමයි. එනිසා මෙම පිරිස කෘෂිකර්මාන්තයෙහි අත් උදව්කරුවන් ලෙස සැලකීම සාධාරණය. නියැදියට අයත් දිස්ත්‍රික්ක තුනෙහිම මෙම තත්ත්වය දක්නට ලැබුණි. මේ අතර තමන් ස්වාධීනව කෘෂිකර්මයෙහි යෙදෙන පවුලේ සාමාජිකයන් ද මීට ඇතුළත්ය. මොවුහු කෘෂිකර්මයට අමතරව වෙනත් ජීවන මාර්ග වශයෙන් රජයේ රැකියා, පෞද්ගලික අංශයේ රැකියා, ස්වයං රැකියා, කෘෂිකාර්මික කම්කරුවන් හෝ පුහුණු කම්කරුවන් වශයෙන් රැකියා, මාර්ගවල යෙදී සිටිති.

අද ගොවි පවුල්වල සාමාජිකයන්ගේ රැකියා මාර්ග අතර රජයේ  රැකියාවන් හි යෙදී සිටින්නන් හම්බන්තොට දිස්ත්‍රික්කයෙහි වාර්තාවන්නේ ඉතාමත් සුළු ප්‍රමාණයකි (1%). අධ්‍යාපන මට්ටම් පිළිබඳව සාකච්ඡා කිරීමේදී හෙළි වූයේ මෙම පවුල්වල බහුතර පිරිස ද්විතීයික අධ්‍යාපන මට්ටමක් හිමි කරගෙන සිටින බවයි. මෙලෙස උපාධි මට්ටමට වඩා පහළ අධ්‍යාපනයක් ලැබූ, වෘත්තීය පුහුණුවක්ද නොලැබූ, එහෙත් ශ්‍රම හමුදාවට අයත් පිරිසට රැකියා අවස්ථා ඉතා අඩුය. මෙම තත්ත්වය හම්බන්තොට වැනි බස්නාහිර පළාතින් දුරස්ථ ප්‍රදේශයකදී වඩාත් අයහපත් ප්‍රතිඵල ගෙනදේ. පෞද්ගලික අංශයේ වැටුප් ලබන රැකියාවන්හි යෙදී සිටින සංඛ්‍යාව 5%ක ප්‍රමාණයකි.

වඩු, මේසන් හා කාර්මික වැනි පුහුණු ශ්‍රමිකයන් ලෙස 4%ක පමණ ප්‍රමාණයක්ද රැකියාවේ යෙදී සිටී. මාතර හා අනුරාධපුර දිස්ත්‍රික්කවල අඳ ගොවීන්ගේ පවුල්වල සාමාජිකයන් සුළු ප්‍රමාණයක් එනම් 1%ක් රජයේ රැකියාවන්හි යෙදී සිටින බව වාර්තා වී ඇත. පෞද්ගලික අංශයේ රැකියා කරන සංඛ්‍යාව මෙම දිස්ත්‍රික්ක දෙකේ පිළිවෙළින් 5%ක් හා 8%ක් ලෙස වාර්තා විය. හම්බන්තොට හා මාතර දිස්ත්‍රික්කවලට සාපේක්ෂව අනුරාධපුර දිස්ත්‍රික්කයේ රැකියා අවස්ථා වැඩි බව මේ අනුව පැහැදිලි වෙයි. වගු අංක 9න් හා රූපසටහන් අංක 4න් මෙම නියැදි ප්‍රදේශවල අඳ ගොවි පවුල්වල සාමාජිකයන්ගේ රැකියා මාර්ග පිළිබඳව වැඩිදුරටත් විස්තර වේ.

වගු අංක 9: අඳ ගොවි පවුල්වල සාමාජිකයන්ගේ රැකියා මාර්ග

| දිස්ත්‍රික්කය | ගොවිතැන් කටයුතු සඳහා උදව්කරුවන් % | රජයේ රැකියා % | පෞද්ගලික අංශයේ රැකියා % | ස්වයං රැකියා % | වෙනත් රැකියා % | එකතුව |
|---|---|---|---|---|---|---|
| හම්බන්තොට | 76 | 1 | 5 | 7 | 11 | 100 |
| මාතර | 59 | 13 | 5 | 11 | 12 | 100 |
| අනුරාධපුරය | 67 | 7 | 8 | 3 | 5 | 100 |

මූලාශ්‍රය: ක්ෂේත්‍ර සමීක්ෂණ දත්ත, (2010).

ප්‍රස්තාර අංක 4: අඳ ගොවි පවුල්වල සාමාජිකයන්ගේ රැකියා මාර්ග




මූලාශ්‍රය: ක්ෂේත්‍ර සමීක්ෂණ දත්ත, (2010).

ඉහත විමර්ශනය අනුව පෙනී යන්නේ අඳ ගොවීන්ගේ පවුල්වල ස්ථිර රැකියා මාර්ගවල නිරත නොවන වැඩිම පිරිසක් අඳ ගොවිතැනට උදව් කිරීම ජීවන මාර්ගය කරගෙන සිටින බවයි. පොදුවේ ගත් කල මෙම පවුල් අඳ ගොවිතැන පමණක් ප්‍රධාන ජීවිකාව කරගත් ආර්ථිකමය අතින් ශක්තිමත් නොවූ පිරිසක් බව පෙනී යයි.

### 3.3 ඉඩම් හිමියන්ගේ සමාජ හා ආර්ථික තත්ත්වය

ප්‍රදේශය පිටත ජීවත්වීම නිසා ඉඩම් හිමියන් සොයා ගැනීම දුෂ්කර කාර්යයක් වූ අතර මෙම අධ්‍යයනය තුළදී සමීක්ෂණයට ලක් කිරීමට හැකි වූයේ හම්බන්තොට 13ක්, මාතර 7ක් හා අනුරාධපුර 8ක් වශයෙන් මුළු ඉඩම් හිමියන් 28 දෙනෙකු පමණි. මෙම ඉඩම් හිමියන්ගෙන් 61%ක් වයස අවුරුදු 55ට වැඩි අය වූහ. සහභාගී වූ මුළු සංඛ්‍යාවෙන් වයස අවුරුදු 55ට වඩා අඩු පිරිස 39%ක් පමණක් විය.

**වගු අංක 10: අනුරාධපුර, මාතර හා හම්බන්තොට දිස්ත්‍රික්කවල සමීක්ෂණයට ලක් කළ ඉඩම් හිමියන්ගේ වයස් ව්‍යාප්තිය, (2010)**

| වයස අවුරුදු | දිස්ත්‍රික්කය | | | |
|---|---|---|---|---|
| | හම්බන්තොට % | මාතර % | අනුරාධපුර % | මුළු % |
| 55 ට අඩු | 46 | 29 | 37.5 | 39 |
| 55 හෝ ඊට වැඩි | 54 | 71 | 62.5 | 61 |
| එකතුව | 100 | 100 | 100 | 100 |

මූලාශ්‍රය: ක්ෂේත්‍ර සමීක්ෂණ දත්ත, (2010).

මෙම සමීක්ෂණයට ලක් කළ ඉඩම් හිමියන් සියලු දෙනාම ද්විතීයික අධ්‍යාපනය ලබා තිබූ අතර, ඔවුන්ගෙන් බහුතරයක් රැකියාවල නිරතව සිටිති. සමස්තයක් ලෙස ගත් විට දිස්ත්‍රික්ක තුන සඳහාම ඉඩම් හිමියන්ගේ රැකියා නියුක්තිය 75%ක් විය. මීට අමතරව විශ්‍රාමිකයින් 14%ක්ද අබල දුබල තත්ත්වයේ පසු වන 11%ක්ද විය. මෙම ඉඩම් හිමියන්ගෙන් දිස්ත්‍රික්ක තුනම සඳහා ප්‍රධාන රැකියාව ලෙස ගොවිතැනේ නිරත ඉඩම් හිමි ප්‍රතිශතය 39%ක් වූ අතර ප්‍රධාන රැකියාව ලෙස ගොවිතැනේ යෙදී සිටින වැඩිම ඉඩම් හිමියන් ප්‍රමාණයක් වාර්තා වූයේ හම්බන්තොට දිස්ත්‍රික්කයෙනි (54%). සමස්තයක් ලෙස සැලකූ විට 21%ක් වූ ප්‍රතිශතයකගේ ප්‍රධාන ආදායම් මාර්ගය ඉඩම් විය. ද්විතීයික රැකියාවක නිරත වූ පිරිස දිස්ත්‍රික්ක තුන සඳහාම 29%ක ප්‍රතිශතයකි. ඉඩම් හිමියන්ගේ රැකියා මාර්ග අතර ඉඩම් හිමියකු ලෙස කටයුතු කිරීම, වෙළෙඳාම, රජයේ හෝ පෞද්ගලික අංශයේ රැකියාවල නිරත වීම දක්නට ලැබුණි.

**වගු අංක 11: ඉඩම් හිමියන් නිරතවන කාර්යයන් අනුව ව්‍යාප්තිය**

| කාර්යය | % |
|---|---|
| රැකියා නියුක්ත | 75 |
| විශ්‍රාමික | 14 |
| අබල/දුබල/මහළු | 11 |
| එකතුව | 100 |

මූලාශ්‍රය: ක්ෂේත්‍ර සමීක්ෂණ දත්ත, (2010).

වගු අංක 12: ඉඩම් හිමියන්ගේ ප්‍රධාන රැකියාව අනුව ව්‍යාප්තිය

| ප්‍රධාන රැකියාව | හම්බන්තොට % | මාතර % | අනුරාධපුර % | මුළු % |
|---|---|---|---|---|
| ගොවිතැන | 54 | 14 | 37 | 39 |
| රජයේ රැකියා | - | - | - | - |
| පෞද්ගලික රැකියා | - | - | 25 | 7 |
| වෙළෙඳාම | - | 43 | 12 | 14 |
| ඉඩම්හිමි | 31 | 29 | - | 21 |
| විශ්‍රාමික | 15 | 14 | 25 | 18 |
| එකතුව | 100 | 100 | 100 | 100 |

මූලාශ්‍රය: ක්ෂේත්‍ර සමීක්ෂණ දත්ත, (2010).

**ඉඩම් හිමියන් විසින් අඳ ගොවියෙකු ලවා ඉඩම් වගා කරවා ගැනීමට හේතු**

ඉඩම් හිමියන් තම ඉඩම් අඳ ගොවීන්ට දී වගා කරගැනීම සඳහා විවිධ හේතු බලපෑ අතර, ඇතැම් ඉඩම් හිමියන්ට තම ඉඩම වෙනත් අයෙකුගෙන් මිලදී ගන්නා අවස්ථාවේදීම අඳ ගොවියාත් සමඟ ඉඩම මිලදී ගැනීමට සිදුව තිබූ අතර අඳ ගොවි පනත අනුව එම අඳ ගොවීන් ඉවත් කිරීමට අපහසු වී තිබීම නිසා කැමැත්තෙන් හෝ අකමැත්තෙන් වුවද අඳ ගොවීන් ලවා කුඹුරු ඉඩම වගා කරගැනීමට ඔවුන්ට සිදුව තිබේ. අඳ ගොවීන් ලවා ඉඩම වගා කරගැනීමට හේතු ලෙස, වගාව සඳහා යෙදීමට ඉඩම් හිමියන්ට කාලය මද වීම (25%), අඳ ගොවියාත් සමගම ඉඩම මිලදී ගැනීමට ඉඩම් හිමියාට සිදුව තිබීම (21%) ආදිය දක්නට ලැබුණි.

**එක් එක් ඉඩම් හිමියා යටතේ සිටින අඳ ගොවීන් සංඛ්‍යාව අනුව ඉඩම් හිමියන්ගේ ව්‍යාප්තිය**

ඉඩම් හිමියන් සතුව සිටින අඳ ගොවීන් සංඛ්‍යා පිළිබඳ දත්ත සැලකූ විට සමීක්ෂණයට ලක්වූ පිරිස අතුරින් බහුතරයකට (57%) සිටියේ එක් අඳ ගොවියකු පමණි. එක් අඳ ගොවියෙකු සිටින ඉඩම් හිමියන් වැඩිම ප්‍රතිශතය හම්බන්තොට (77%) දිස්ත්‍රික්කය තුළ වාර්තා වූ අතර අනුරාධපුර දිස්ත්‍රික්කයේ ඉඩම් හිමියන් වැඩි ප්‍රතිශතයකට (62%) අඳ ගොවීන් දෙදෙනෙකු බැගින් සිටින බව වාර්තා විය. මාතර දිස්ත්‍රික්කය තුළ එක් අඳ ගොවියෙකු සිටින ඉඩම් හිමියන් ප්‍රතිශතය (57%) සහ අඳ ගොවීන් හතර දෙනෙකු සිටින ඉඩම් හිමියන්ගේ ප්‍රතිශතය 43%ක් විය. මාතර දිස්ත්‍රික්කය තුළ කුඩා ඉඩම් පැවතීම මෙසේ එක් ඉඩම් හිමියකු යටතේ අඳ ගොවීන් කිහිප දෙනෙක් ඉඩම් කිහිපයක වගා කටයුතු කිරීමට හේතුවකි.

වගු අංක 13: එක් එක් ඉඩම් හිමියා යටතේ සිටින අඳ ගොවීන් සංඛ්‍යාව අනුව ඉඩම් හිමියන්ගේ ව්‍යාප්තිය

| අඳ ගොවීන් සංඛ්‍යාව | හම්බන්තොට % | මාතර % | අනුරාධපුර % | මුළු ගණන % |
|---|---|---|---|---|
| 1 | 76.9 | 57.1 | 25.0 | 57.1 |
| 2 | 15.4 | - | 62.5 | 25.0 |
| 4 | 7.7 | 42.9 | 12.5 | 17.9 |
| එකතුව | 100 | 100 | 100 | 100 |

මූලාශ්‍රය: ක්ෂේත්‍ර සමීක්ෂණ දත්ත, (2010).

**ඉඩම් හිමියන් විසින් අඳයට වගා කිරීමට දුන් කුඹුරු ඉඩම්වල ව්‍යාප්තිය**

සමස්තයක් ලෙස ඉඩම් හිමියන් විසින් අඳ ගොවීන්ට වගා කිරීම සඳහා ලබා දුන් කුඹුරු ඉඩම්වලින් වැඩි ප්‍රමාණයක් තිබුණේ අක්කර 1-3 අතර ඉඩම්ය (46%). හම්බන්තොට දිස්ත්‍රික්කයේ ඉඩම් හිමියන් විසින් අඳ ගොවීන් වෙත වගා කිරීමට ලබා දුන් ඉඩම්වලින් 61.5%ක්ම අක්කර 1-3 අතර කුඹුරු වූ අතර, 23%ක් අක්කර 3-5 අතර විය. මාතර දිස්ත්‍රික්කය තුළ ඉඩම් හිමියන් විසින් අඳ ගොවීන්ට ලබා දුන් ඉඩම්වලින් 29%ක් අක්කර 10 අඩු විය. අක්කර 1-3 අතර වගා කිරීමට දුන් ඉඩම් හිමියන්ගේ ප්‍රතිශතය 29%කි. මාතර දිස්ත්‍රික්කය තුළ අඳ ගොවීන් සිය ප්‍රධාන ජීවන මාර්ගය ලෙස ගොවිතැන හැර වෙනත් ජීවන මාර්ග කිහිපයක ද යෙදී සිටී.

වගු අංක 14: ඉඩම් හිමියන් විසින් අඳ ගොවීන්ට වගා කිරීමට ලබාදුන් කුඹුරු ඉඩම් ප්‍රමාණය අනුව ව්‍යාප්තිය

| අක්කර ප්‍රමාණය | ඉඩම් හිමියන්ගේ සංඛ්‍යාව | | |
|---|---|---|---|
| | හම්බන්තොට % | මාතර % | අනුරාධපුර % |
| < 1 ට අඩු | 0 | 28.6 | 12.5 |
| >1 < 3 | 61.5 | 28.6 | 37.5 |
| 3 <5 | 23.1 | 28.6 | 37.5 |
| >5 | 15.4 | 14.3 | 12.5 |
| එකතුව | 100 | 100 | 100 |

මූලාශ්‍රය: ක්ෂේත්‍ර සමීක්ෂණ දත්ත, (2010).

**ප්‍රවේණිය ලැබීම**

අනුරාධපුර දිස්ත්‍රික්කයේ මහා වාරිමාර්ග ප්‍රදේශවල අස්වැන්න අක්කරයට බුසල් 90-120ක් පමණ වන අතර හම්බන්තොට දිස්ත්‍රික්කයේ සාමාන්‍ය අස්වැන්න අක්කරයට බුසල් 100-120ක් පමණ වේ. මාතර දිස්ත්‍රික්කය සඳහා මෙය අක්කරයට බුසල් 40-60 අතර ප්‍රමාණයකි. හම්බන්තොට දිස්ත්‍රික්කයේ සමීක්ෂණයට ලක්වූ සියළුම ඉඩම්

හිමියන්ට ප්‍රවේණිය ලෙස අක්කරයට බුසල් 14ක් ලැබෙන අතර මෙහි ප්‍රවේණිය ගෙවීමේ ක්‍රමය වන්නේ මහා වාරි මාර්ග ප්‍රදේශවල අක්කරයට බුසල් 14ක් හා වර්ෂාපෝෂිත ප්‍රදේශවල අක්කරයට බුසල් 12ක් ලෙසයි. නමුත් මාතර දිස්ත්‍රික්කය තුළ 86%කටම ඉඩම් හිමි ප්‍රවේණිය ලෙස ලැබෙන්නේ මුළු අස්වැන්නෙන් 1/4ක් වූ කොටසකි. අනුරාධපුර දිස්ත්‍රික්කයේ 87%ක් ඉඩම් හිමියන් ප්‍රකාශ කර සිටියේ තමන්ට ප්‍රවේණිය ලෙස අක්කරයට බුසල් 12ක් ලැබෙන බවයි. මීට අමතරව මෙම දිස්ත්‍රික්කය තුළ ඉඩම් හිමියන්ගෙන් 12%කට ප්‍රවේණිය ලෙස මුළු අස්වැන්නෙන් 1/4ක් ලැබෙන අවස්ථාද පවතී.

වර්ෂ 2000 අංක 46 දරණ ගොවිජන සංවර්ධන පනතට අනුව ප්‍රවේණිය නොගෙවීම සම්බන්ධ ප්‍රශ්නවලදී කෘෂි විනිශ්චය සභාව විසින් තීරණයක් ලබා දිය යුතුය. ප්‍රවේණිය ගෙවීම සම්බන්ධයෙන් ආරවුල්වලට තුඩු දී ඇති කරුණු රාශියකි (බොල් සහිත හා තෙත තත්ත්වයෙන් ප්‍රවේණිය ගෙවීම, අඳ ගොවියා විසින් ඉටු කරනු ලැබිය යුතු කාර්යයන් පනතට අනුව සිදු නොවීම. උදා : ගොයම් කැපීම දින දහයකට පෙර දැනුම් දීම).

**වගු අංක 15: ප්‍රවේණිය ලැබීම පිළිබඳ ඉඩම් හිමියන්ගේ ප්‍රතිචාර**

| ප්‍රවේණිය ගෙවන ආකාරය | ඉඩම් හිමියන් සංඛ්‍යාව | | |
|---|---|---|---|
| | හම්බන්තොට % | මාතර % | අනුරාධපුරය % |
| අස්වැන්නෙන් 1/4 | - | 85.7 | 12.5 |
| අක්කරයට බුසල් 12 | - | - | 87.5 |
| අක්කරයට බුසල් 14 | 100 | 14.3 | - |
| එකතුව | 100 | 100 | 100 |

මූලාශ්‍රය: ක්ෂේත්‍ර සමීක්ෂණ දත්ත, (2010).

**ඉඩම් හිමියා හා අඳ ගොවියා අතර සුහදත්වය**

ඉඩම් හිමියා ඉඩම සම්බන්ධව, නියමිත ප්‍රවේණි ගෙවීම් කටයුතුවලදී හා වගා හානි අවස්ථාවලදී අඳ ගොවියා සමග සුහදව කටයුතු කරන අවස්ථාවන් මෙන්ම එසේ කටයුතු නොකර ග්‍රාම නිලධාරී, ගොවිජන සේවා කොමසාරිස්, ගොවිජන සංවර්ධන නිලධාරීන් යන අයට පැමිණිලි කරන ලද අවස්ථාද දක්නට ලැබිණි. සමස්ත වශයෙන් සැලකූ විට සමීක්ෂණය සිදු කරන ලද ප්‍රදේශවල ඉඩම සම්බන්ධ වන ප්‍රශ්නවලදී සුහදව කටයුතු කළ ඉඩම් හිමියන්ගේ ප්‍රතිශතය 71%ක් වන අතර සුහදව කටයුතු නොකළ ඉඩම් හිමියන්ගේ ප්‍රතිශතය 29%කි. සුහදව කටයුතු නොකළ ඉඩම් හිමියන්ගෙන් 62.5%ක් ගොවිජන කොමසාරිස්ට/ගොවිජන සංවර්ධන නිලධාරීන්ට පැමිණිලි ඉදිරිපත් කර තිබූ අතර, එම නිලධාරීන් ලබා දුන් තීරණ පිළිබඳව සෑහීමකට පත් වූයේ පැමිණිලි ඉදිරිපත් කරන ලද ඉඩම් හිමියන්ගෙන් 20%ක් පමණි. 80%ක්ම ඉඩම සම්බන්ධව සිදු කළ පැමිණිලිවලදී තමන්ට ලබා දුන් තීරණ පිළිබඳව සෑහීමකට පත්වී නැත. එහි දී ආරවුල් පිළිබඳ 50% දෙනෙක් පැමිණිලි ඉදිරිපත් කර තිබූ අතර එම පැමිණිලි සම්බන්ධව ලබාදුන් තීරණ පිළිබඳව සෑහීමකට පත් නොවන බව බොහෝ ඉඩම් හිමියෝ ප්‍රකාශ කළහ (75%). වගා හානි අවස්ථාවලදීද ඉඩම් හිමියන් හා අඳ ගොවීන් අතර සුහදත්වය පළුදු වූ අවස්ථා ඇති බව 54%ක් වූ ඉඩම් හිමියන් විසින් ප්‍රකාශ කරන ලද අතර ඒ පිළිබඳව පැමිණිලි ඉදිරිපත් කර තිබුණේ 31%ක් පමණි.

එහිදී මෙම පැමිණිලි ඉදිරිපත් කිරීම අඩුවීමට ප්‍රධාන හේතුව ලෙස ස්වාභාවික ආපදාවලින් (නියඟ වැනි) කුඹුරු වගා පාළුවීම දක්වා තිබුණි.

**ඉඩම් සම්බන්ධ ගැටලු**

ඉඩම් හිමියන් හා අඳ ගොවීන් අතර ඉඩම සම්බන්ධව විවිධ ස්වරූපයේ ගැටලු පැන නැගී ඇති බව සමීක්ෂණයේදී නිරීක්ෂණය කිරීමට හැකි විය. අඳයට ඉඩම ලබා ගත් අඳ ගොවීන් තවත් ගොවීන් හවුල් කරගෙන ඉඩම් වගා කිරීම, එකම අඳ ගොවියා දීර්ඝකාලීනව එම ඉඩමේ අඳ ගොවියකු ලෙස කටයුතු කිරීම, අඳ ගොවියා විසින් ඉඩම් හිමියාට නිසි පරිදි ප්‍රවේණිය නොගෙවනු ලැබීම වැනි විවිධ හේතු මෙම ගැටළුවලට බලපා ඇත.

**වගු අංක 16: ඉඩම් සම්බන්ධ ගැටළු**

| හේතු | % |
|---|---|
| හවුල් අයිතිය | 7 |
| කට්ටිමාරු/ තට්ටුමාරු ඉඩම්වීම | 7 |
| දීර්ඝකාලීන ගොවියකු වීම | 14 |
| අයිතිය පැවරීම | 14 |
| නිසි අයුරින් ගොවිතැන් නොකිරීම | 14 |
| ප්‍රවේණිය නිසි ලෙස නොගෙවීම | 29 |
| වෙනත් | 11 |

මූලාශ්‍රය: ක්ෂේත්‍ර සමීක්ෂණ දත්ත, (2010).

ඉඩම් හිමියා හා අඳ ගොවියා අතර ඉඩම සම්බන්ධව ගැටලු ඇතිවීම සඳහා ප්‍රධාන වශයෙන්ම හේතුවී ඇත්තේ ප්‍රවේණිය නිසි පරිදි නොගෙවීම (29%) වශයෙන් ප්‍රකාශ වේ.

**පසුගිය වගා කන්නවලදී අඳ ගොවියා විසින් ඉඩම් හිමියාගේ ඉඩම් වගා කරනු ලැබීම**

පසුගිය 2009/10 මහ කන්නයේ හා 2009 යල කන්නවල අඳ ගොවීන් විසින් අදාළ ඉඩම් වගා කිරීම ඉහළ මට්ටමක පැවතිණි (96%). සමීක්ෂණයට ලක් කළ දිස්ත්‍රික්ක තුනෙහි ඉඩම් හිමියන්ගෙන් 43%ක් අස්වැන්නෙන් කොටසක් ලෙස එනම් මුළු අස්වැන්නෙන් 1/4ක් ප්‍රවේණිය ලෙස ලබා ගැනීමට කැමැත්ත ප්‍රකාශ කළ අතර 25% ක් වූ ඉඩම් හිමියන් ප්‍රකාශ කලේ ප්‍රවේණිය ලෙස යම් නිශ්චිත වී බුසල් ප්‍රමාණයක් අඳ ගොවීන්ගෙන් ලබා ගැනීමට කැමති බවයි. මීට අමතරව 21%ක් වූ ඉඩම් හිමියන් ප්‍රමාණයක් මුදලින් ප්‍රවේණිය ලබාගැනීමට කැමැත්ත ප්‍රකාශ කළ අතර ඉතිරි (11%) ඉඩම් හිමියන් මුළු අස්වැන්නෙන් 1/4ක් හෝ නිශ්චිත වී බුසල් ප්‍රමාණයක් යන දෙකෙන් වැඩි කොටස ලබා ගැනීමට කැමැත්ත ප්‍රකාශ කළහ.

**ප්‍රස්තාර අංක 5 : ප්‍රවේණිය ලබා ගැනීමට ඇති කැමැත්ත අනුව ඉඩම් හිමියන් වර්ගීකරණය**




මූලාශ්‍රය: ක්ෂේත්‍ර සමීක්ෂණ දත්ත, (2010).

**ඉඩම් හිමියන් විසින් කුඹුරු ඉඩම විකුණනු ලැබීම**

දිස්ත්‍රික්ක තුනෙහිම සමීක්ෂණයට ලක් කළ ඉඩම් හිමියන්ගෙන් 18%ක් පමණ අඳ ගොවියාගෙන් සාධාරණ මුදලක් ලබාගෙන අඳ ගොවියාට කුඹුරු ඉඩම විකිණීමට එකඟ බව පැවසූ අතර බහුතරයක් ඉඩම් හිමියෝ (82%) කුඹුරු ඉඩම විකිණීමට අකමැති බව ප්‍රකාශ කළහ. මෙසේ ඉඩම් විකිණීමට ඉඩම් හිමියන් අකමැති වූයේ ප්‍රධාන වශයෙන්ම කුඹුරු ඉඩම් හිමියන් තමන්ගෙන් පසු තම දරුවන්ට එම කුඹුරුවල උරුමය ලබා දීමට කැමැති නිසාත්, ඒවා තමන්ට පාරම්පරිකව ලැබුණු ඉඩම් නිසා වෙනත් බාහිර පුද්ගලයින්ට විකිණීමට ඇති අකමැත්තත්, ඇතැම් ඉඩම් හිමියන්ගේ මූලික ආදායම් මාර්ගය එම අඳ කුඹුරු ඉඩමෙන් ලැබෙන ප්‍රවේණිය වීමත් හේතුවෙනි. කුඹුර අඳ ගොවීන්ට විකිණීමට සිදු වුව හොත් ඉඩම් හිමියාට තම දරුවන්ට ලබා දීම සඳහා කුඹුරු නොමැති වන අතර, අඳ ගොවියාගෙන් යම්කිසි මුදලක් ලබා ගෙන එම කුඹුර පැවරීමෙන් ඉඩම් හිමියාට මෙතෙක් ලැබුණු ප්‍රවේණිය අහිමි වීමෙන් ඔවුන්ට තම පවුලේ ආදායම් මාර්ගය අහිමි වී යෑමක් සිදු වේ. එසේම පවුලේ ආහාර සුරක්ෂිතතාවය පවත්වා ගෙන යාම අවශ්‍ය වීම නිසාත් උපරිම මිලකට කුඹුරු ඉඩම් විකිණීමට නොහැකි නිසාත් අඳ ගොවීන්ට ලබාදී ඇති කුඹුරු ඉඩම් විකිණීමට ඉඩම් හිමියන් එකඟ නොවන බව සමීක්ෂණය තුළින් හෙළිදරව් විය.

**අස්වනු විෂමතාවය**

ඉඩම් හිමි ගොවීන් තමන් වගා කරන කුඹුරුවල හා අඳ ගොවීන් ලවා වගා කරවන කුඹුරුවල අස්වනු විෂමතාවය පිළිබඳ සමීක්ෂණයට ලක් කළ අතර, මෙහි දී ඉඩම් හිමියන්ගෙන් 46%ක් ප්‍රකාශ කර සිටියේ

ප්‍රදේශයේ අඳ ගොවීන් ලබා ගන්නා අස්වැන්න හා ඉඩම් හිමි ගොවීන් ලබා ගන්නා අස්වැන්න අතර වෙනසක් නොමැති බවයි. ඉඩම් හිමියන්ගෙන් 25% ක් පමණක් මෙයට පරස්පර අදහසක් දක්වන ලද අතර ඔවුන් පැවසුවේ ඉඩම් හිමියන් වගා කරන කුඹුරුවල අස්වැන්න, ප්‍රදේශයේ අඳ ගොවීන් වගා කරන කුඹුරුවල අස්වැන්නට වඩා වැඩි බවයි. කෙසේ නමුත් සමීක්ෂණයට ලක් කරන ලද ඉඩම් හිමියන්ගෙන් 29%ක්ම ප්‍රකාශ කළේ මෙම අස්වනු වෙනස පිළිබඳව දැනුමක් නොමැති බවයි.

වගු අංක 17: අඳ ගොවීන් විසින් ලබා ගන්නා අස්වැන්න පිළිබඳ ඉඩම් හිමියන්ගේ ප්‍රතිචාර

| ප්‍රතිචාරය | හම්බන්තොට % | මාතර % | අනුරාධපුර % | මුළු % |
|---|---|---|---|---|
| වෙනසක් ඇත | 15.3 | 28.6 | 37.5 | 25.0 |
| වෙනසක් නැත | 38.4 | 57.1 | 50.0 | 46.4 |
| නොදනී | 46.1 | 14.2 | 12.5 | 28.6 |
| එකතුව | 100 | 100 | 100 | 100 |

මූලාශ්‍රය: ක්ෂේත්‍ර සමීක්ෂණ දත්ත, (2010).

දැනට අඳයට දී වගා කරන කුඹුරුවලින් වැඩි ආදායමක් ලබා ගත හැක්කේ අඳ ගොවීන්ගෙන් ඒවා ලබා ගෙන තමන් විසින්ම වගා කිරීමෙන් බව බහුතරයක් (64%) ඉඩම් හිමියන් ප්‍රකාශ කළ අතර අඳ ගොවීන් ලවා වගා කිරීමෙන් වැඩි ආදායමක් ලබා ගත හැකි බව ප්‍රකාශ කර සිටියේ ඉඩම් හිමියන් අතරින් 21% ක් පමණි. ඉඩම් හිමියන් විසින් දක්වන ලද ප්‍රතිචාර ප්‍රස්තාර අංක 6 මඟින් දැක්වේ.

ප්‍රස්තාර අංක 6 : කුඹුරුවලින් ආදායම වැඩි කරගැනීම සඳහා ගත යුතු ක්‍රියාමාර්ග




මූලාශ්‍රය: ක්ෂේත්‍ර සමීක්ෂණ දත්ත, (2010).

මෙම සමීක්ෂණයට භාජනය කළ ඉඩම් හිමියන් අතරින් අනුරාධපුර දිස්ත්‍රික්කයේ ඉඩම් හිමියන් ප්‍රකාශ කලේ නාගරික සීමාව තුළ පිහිටි කුඹුරු ඉඩම් අක්කරයක වටිනාකම රු.250,000 – 400,000ත් අතර වන බවයි.

මාතර දිස්ත්‍රික්කය තුළ කුඹුරු අක්කරයක වටිනාකම රු.250,000 – 500,000ත් අතර වන අතර හම්බන්තොට දිස්ත්‍රික්කයේ කුඹුරු ඉඩම් අක්කරයක වටිනාකම රු.500,000 - 600,000ත් අතර වේ.

මේ අතර සමීක්ෂණයට සහභාගී වූ හම්බන්තොට හා මාතර දිස්ත්‍රික්කවල සියලුම ඉඩම් හිමියෝ යල හා මහ කන්න දෙකේදීම වී වගා කිරීම තුළින් ඉඩමේ ආදායම වැඩි කරගත හැකි බව ප්‍රකාශ කළහ. කුඹුරු ඉඩම්වල එළවළු, වාණිජ බෝග හෝ වෙනත් අතිරේක බෝග වගා කිරීම සඳහා ඔවුන් එතරම් කැමැත්තක් නොමැති බව හෙළි විය. මේ සඳහා බොහෝ විට පසුගිය කාලය තුළ ලබා දුන් පොහොර සහනාධාරය මෙන්ම වී සඳහා ඉහළ මිලක් ලැබී තිබීම හේතු වී තිබුණි. සමීක්ෂණය සඳහා සහභාගී වූ අනුරාධපුර දිස්ත්‍රික්කයේ ඉඩම් හිමියන් අතරින් බහුතරයක්ද ප්‍රකාශ කලේ (මහ කන්නය සඳහා - 87.5% යල කන්නය සඳහා 62.5%) වී වගාව කිරීම තුළින් කුඹුරු ඉඩම්වලින් වැඩි ආදායමක් ලබා ගත හැකි බවයි. මීට අමතරව යල කන්නය තුළදී අතිරේක බෝග වගා කිරීමටත් (37.5%) වාණිජ බෝග වගා කිරීමටත් (12.5%) ඉඩම් හිමියන් කැමති බව ප්‍රකාශ කරන ලදී.

**ඉඩම් හිමියන්ගේ දැනුවත්භාවය හා අඳ ආරවුල්**

සමීක්ෂණය භාජනය කළ ඉඩම් හිමියන් අතරින් 89%කට ගොවිජන සේවා දෙපාර්තමේන්තුව මගින් ඔවුන්ගේ ප්‍රදේශ සඳහා නිර්දේශ කළ අඳ ප්‍රවේණිය පිළිබඳ දැනුමක් තිබු අතර, ඒ පිළිබඳව දැනුමක් නොතිබුණේ 11%ක් තරම් වූ සුළු ප්‍රතිශතයකට පමණි.

මෙම දිස්ත්‍රික්ක තුන තුළ ශ්‍රී ලංකාවේ සමස්ත අඳ ගොවීන් අතරින් බහුතරයක් වන අඳ ගොවීන් පිරිසක් ජීවත්ව සිටින අතර, පසුගිය දශකය තුළ එම ප්‍රදේශවල අඳ ආරවුල් වැඩි බව ඉඩම් හිමියන් අතරින් 68%ක් ප්‍රකාශ කරන ලද අතර ඊට කලින් වකවානු සමග සන්සන්දනය කිරීමේදී පසුගිය දශකය තුළ අඳ ආරවුල්වල වෙනසක් නොමැති බව 25%ක් ඉඩම් හිමියෝ ප්‍රකාශ කළහ. මේ අතර පසුගිය දශකය තුළ ප්‍රදේශයේ ඉඩම් ආරවුල් අඩු බව ප්‍රකාශ කලේ 7%ක් තරම් වූ සුළු පිරිසකි.

අතුරු බදු දීම් ඉඩම් හිමියාට නිසි පරිදි ප්‍රවේණිය නොගෙවීම අඳ ගොවියා විසින් නියමිත පරිදි කුඹුරු ඉඩම වගා නොකිරීම මෙන්ම වත්මන් පනත අනුව අඳ ගොවියාගෙන් පසු අනුප්‍රාප්තිකයකු නම් කිරීමට හැකියාවක් නැතත්, අදාළ අඳ ගොවියාගේ දරුවන් තම පියාගෙන් පසු කුඹුර අඛණ්ඩව වගා කිරීම ආදිය හේතුවෙන් අඳ ආරවුල් ප්‍රදේශය පුරා දැඩි ලෙස ව්‍යාප්ත වී ඇත. එසේම ඇතැම් අඳ ගොවීන් දීර්ඝ කාලයක් මුළුල්ලේ එම ඉඩම් අඳයට වගා කිරීම නිසා තමන් අඳ ගොවීන් බව ඔවුන්ට අමතක වී ඇති අතර අදාළ ඉඩම තමා සතු සින්නක්කර ඉඩමක් ලෙස සිතා කටයුතු කිරීම තුළින් ඉඩම් හිමියාට ගෙවිය යුතු ප්‍රවේණිය පනතේ සඳහන් ආකාරයට හා නිසි වේලාවට ගෙවීමට උනන්දුවක් නොදක්වන බව දක්නට ලැබේ. මෙම හේතු නිසා ඉඩම් හිමියාත් අඳ ගොවියාත් අතර දීර්ඝ කාලයක් සිට පැවති සුහදත්වය, අන්‍යෝන්‍ය අවබෝධය දුරස්වීමක් වර්තමානයේ දක්නට ලැබේ.

සමීක්ෂණයට ලක් කළ දිස්ත්‍රික්ක තුනෙහි ඉඩම් හිමියන් අතරින් 64%ක් ප්‍රකාශ කළේ වර්තමාන රාජ්‍ය ප්‍රතිපත්තිය අඳ ගොවියා හා ඉඩම් හිමියා සුරක්ෂිත වන ආකාරයට සකස් වී නොමැති බවයි. තරමක් දුරට අඳ ගොවියා හා ඉඩම් හිමියා සුරක්ෂිත වන ආකාරයට රාජ්‍ය ප්‍රතිපත්ති සකස්· වී ඇති බව 21%ක් පමණක් ප්‍රකාශ කරන ලදී, ඉඩම් හිමියන් හා අඳ ගොවියන් ආරක්ෂා වන ආකාරයට රාජ්‍ය ප්‍රතිපත්තිය සකස් වී ඇති බව ප්‍රකාශ කරන ලද්දේ සමීක්ෂණයට ලක් කළ ඉඩම් හිමියන්ගෙන් 7%ක් පමණි. බහුතරයක් ඉඩම් හිමියන් ප්‍රකාශ කර සිටියේ වර්තමාන ගොවිජන සංවර්ධන පනත මගින් අඳ ගොවියා හා ඉඩම් හිමියා යන දෙපිරිසටම සාධාරණයක් සිදු නොවන බවයි. ඉඩම් හිමියන් අතරින් ඇතැම් පිරිසක් ප්‍රකාශ කර සිටියේ වර්තමාන අඳ ගොවියා මිය ගිය පසු ඉඩම ඔහුගේ අනුප්‍රාප්තිකයෙකුට නොයා යුතු බවත්, ඉඩම් හිමියන්ද අසරණ පිරිසක් බැවින් අදාළ අඳ ගොවියාගෙන් පසු නීත්‍යානුකූලව ඉඩම වගා කිරීමට ඉඩම් හිමියාට බලතල තිබිය යුතු බවත්ය. එසේම තවත් පිරිසකගේ අදහස වූයේ ඉඩම් හිමියාට තම දේපළ වන කුඹුරු ඉඩම තමන්ට අවශ්‍ය අවස්ථාවකදී ඉක්මනින් විකිණීමට හැකියාව තිබිය යුතු බවයි. අසාධ්‍ය අසනීපයක් වැනි අවස්ථාවකදී මුදල් නොමැති විට එසේ විකිණීම සඳහා අයිතියක් ලබා දීම සාධාරණය. කෙසේ නමුත් වර්තමාන රාජ්‍ය ප්‍රතිපත්තිය හමුවේ දෙපාර්ශ්වයම අසාධාරණයට ලක් වී ඇති බැවින් ප්‍රතිලාභ සමානව ලැබෙන අන්දමින් හා ඉහළ නිෂ්පාදනයක් ලබා ගත හැකි අයුරින් අඳ ගොවියාටද සුරක්ෂිතතාවය ලැබෙන පරිදි රාජ්‍ය ප්‍රතිපත්තිය කඩිනමින් වෙනසකට භාජනය විය යුතුය යන්න ඉඩම් හිමියන් බහුතරයකගේ මතය විය. වර්තමාන පොහොර සහනාධාරය හා වී වගාව සඳහා ලබා දෙන ප්‍රතිලාභ සමග වී වගාව වඩාත් ලාභදායි ව්‍යාපාරයක් බව ඉඩම් හිමියන්ගෙන් 82%ක් ප්‍රකාශ කළ අතර මේ නිසා ඉඩම් හිමියා හා අඳ ගොවියා යන දෙපිරිසම වී වගාව සඳහා උනන්දු වී ඇති බව පැහැදිලිව දැක ගත හැකිය.

## සිව් වැනි පරිච්ඡේදය

# 2000 අංක 46 දරණ ගොවිජන සංවර්ධන පනත හේතුවෙන් ගොවිජන ක්ෂේත්‍රයේ උද්ගත වී ඇති ගැටලු

### 4.1 හැඳින්වීම

වර්ෂ 1958 අංක 01 දරණ අඳ ගොවි පනත ඉදිරිපත් කිරීමෙන් නිර්මාණය කරන ලද පසුබිම යටතේ අඳ ගොවිතැන පරපුරෙන් පරපුරට උරුමවෙමින් පැවත එන ලදී. එහෙත් අඳ ගොවීන් ඉඩම් හිමි ගොවීන් බවට පත් කිරීමේ අරමුණෙන් ඉදිරිපත් කරන ලද 2000 අංක 46 දරණ ගොවිජන සංවර්ධන පනත මඟින් දැනට සිටින අඳ ගොවියා මිය ගිය පසු පෙර මෙන් කලත්‍රයාට හෝ දරුවන්ට අඳය උරුම වීමේ ප්‍රතිපාදන පිළිබඳව සඳහනක් නොමැති වීමේ හේතුව මත අඳ ගොවි ක්ෂේත්‍රයේ ගැටලු රාශියක් උද්ගත විය. එලෙස අඳ ගොවීන්ට හා ඉඩම් හිමියන්ට මුහුණ පෑමට සිදු වී ඇති ගැටලු මෙම පරිච්ඡේදය ඔස්සේ විග්‍රහ කෙරේ.

### 4.2 අඳ ගොවීන් මුහුණපාන ගැටලු

01. 2000 වර්ෂයේ පනත සම්මත වූ පසු මියගිය අඳ ගොවීන්ගේ හිමිකම් පැවරීම සඳහා නිසි පරිදි අනුප්‍රාප්තිකයෙක් නම් නොකිරීම නිසා අඳ ගොවියා මිය ගිය කුඹුරු සම්බන්ධයෙන් ඉඩම් හිමියන් සහ අඳ ගොවියාගේ දරුවන් අතර ආරවුල් හට ගැනීම.

02. හවුල් අඳ ගොවියකු මිය යාම නිසා මිය ගිය ගොවියාගේ දූ දරුවන්ට වගා කිරීමට කුඹුරක් නොතිබීම.

03. අඳ ගොවියා මිය ගිය පසු ඉඩම් හිමියා බලහත්කාරයෙන් කුඹුරු ඉඩමට ඇතුළු වීම.

04. අඳ ගොවියාගේ අඳ අයිතිය ඉඩම් හිමියාගේ කැමැත්තකින් තොරව වෙනත් අයට පැවරීමට හැකියාව නැති නිසා අඳ ගොවියාට අසාධාරණයක් සිදු වීම.

05. අඳ ගොවීන් විසින් ඉඩම් හිමියාට ගෙවිය යුතු බද්ද මුළු අස්වැන්නෙන් 1/4ක ප්‍රමාණයක් ලෙස සඳහන් කිරීම තුළින් ඇතැම් අඳ ගොවීන් ඉඩම් හිමියන්ගේ අතවරවලට ලක්වීම.

06. අඳ ගොවියකු අඳ අයිතියෙන් පහ කර වසරක් ඇතුළත පැමිණිලි කිරීමට තිබූ සාධාරණ අයිතිය හා කාලය මෙම පනත යටතේ මාස 06කට සීමා කිරීමෙන් අඳ ගොවියාට අසාධාරණයක් සිදු වීම.

07. අඳ ගොවියා විසින් ඉඩම් හිමියාට ගෙවනු ලැබිය යුතු ප්‍රවේණි බදු අස්වැන්න කමතේදීම හෝ දින 15ක් ඇතුළත ගෙවීමට නියම කිරීමෙන් අඳ ගොවීන්ට නීතිය ඉදිරියේ හිඟ බදු ගෙවීමට හා අපහසුතාවයට මුහුණදීමට සිදුවීම.

08. ගොවිජන විනිශ්චය සහා පිහිටුවීමට කටයුතු කර නොතිබීම.

### 4.3 ඉඩම් හිමියන් මුහුණපාන ගැටලු

01. ඉඩම් හිමියන්ට අඳ ගොවීන්ගෙන් ප්‍රවේණිය නොලැබීම
බොහෝ අඳ ගොවීන් ප්‍රවේණිය ලබා දීමේදී ඇගිටි සහ බොල් වී ද ඇතුළුව අපිරිසිදු වී වලින් ගෙවීම් සිදු කර තිබිණි. ඉඩම් හිමියන් විසින් මුහුණ පා ඇති මෙම ගැටළුව සම්බන්ධයෙන් ඔවුන් විසින් කරනු ලබන පැමිණිලි විභාග කිරීම සඳහා ගොවිජන විනිශ්චය සභා පිහිටුවීමට කටයුතු කර නැත. ඒ සඳහා ප්‍රතිපාදන වෙන් කර අයදුම්පත් කැඳවීවේ නම් පත් කිරීම් සඳහා ඉඩකඩ තිබුණි. පරීක්ෂණ විභාග කිරීම සඳහා පරීක්ෂණ නිලධාරීන් 2000 අංක 46 දරණ ගොවිජන සංවර්ධන පනතෙහි 39 වන වගන්තිය අනුව පත් කළ යුතු වුවත් මෙතෙක් පත්කර නොමැත. පනතෙහි මේ සඳහා විශ්‍රාමලත් විනිසුරුවන්ගෙන්, ජ්‍යෙෂ්ඨ නීතිඥයන්ගෙන්, වසර 7ක කෘෂිකර්ම ක්ෂේත්‍රයේ පළපුරුද්දක් ඇති නිලධාරීන්ගෙන් විනිශ්චය අධිකාරියක් පත් කළ යුතු බව සඳහන් වේ. නමුත් මෙවැනි නිලධාරීහු අධික වැටුපක් නොමැතිව මෙම සේවාවන් සඳහා නොපැමිණෙති. මේ දක්වා මෙම විනිශ්චය අධිකාරිය ආරම්භ වී නොමැති අතර මෙය ගොවිජන සේවා දෙපාර්තමේන්තුව මගින් ඉඩම් හිමියන්ගේ ප්‍රවේණි පරීක්ෂණ දිගින් දිගටම නොපවත්වා සිටීමට හේතු වූ ප්‍රබල කරුණක් වෙයි.

02. අක්කර 1/2ක් සහ අක්කර 1ක් ඇති ඉඩම් හිමියන්ගේ කුඹුරුවල අඳ ගොවීන් සිටීම නිසා ඉඩම් හිමියන් වගා කිරීමට කැමති වුවත් වගා කටයුතු කිරීමට ඔවුන්ට නොහැකි වීම.

03. ගොවි සංවිධාන හා ගොවිජන සේවා කමිටුවට ඉඩම් හිමියන්ගේ නියෝජනයක් නොමැති වීම නිසා ඉඩම් විකිණීමේදී ඉඩම් හිමියන්ට අසාධාරණයක් සිදු වීම.

04. කුඹුරු නාම ලේඛන සංශෝධනය නොවීම නිසා බොහෝ ඉඩම් හිමියන් විසින් තෑගි ඔප්පුවලින් ඉඩම්වල හිමිකම් ඔවුන්ගේ කාලත්‍රයාට හෝ දූ දරුවන්ට පවරා ඇති නමුදු ඔවුන්ගේ අයිතිය ලේඛනගත කරගත නොහැකි වීම. මේ හේතුවෙන් අඳ ගොවීන් විසින් අළුත් ඉඩම් හිමියන්ගේ නම් අදාළ නාම ලේඛනයේ නොමැති නිසා ප්‍රවේණිය නොගෙවා සිටීම.

05. ඉඩම් අයිතිකරුවන් මිය යාම නිසා ඔවුන්ගේ දූ දරුවනට හිමිකම් නාම ලේඛනයට නම් ඇතුළත් කරගත නොහැකි වීම.

06. ඇතැම් ඉඩම් හිමියෝ කුඹුරු මිලට ගන්නා විට කුඹුරු ලේඛන පරීක්ෂා කර අඳ ගොවියන් නොමැති ඉඩම් හිමි ගොවීන් සිටින කුඹුරු වැඩි මිලකට මිලදී ගනිති. එහෙත්, එවැනි ලේඛනයේ නොමැති අඳ ගොවීහු පසුව ඉදිරිපත් වී කුඹුරු බුක්ති විඳිති. 2000 පනතෙහි 90 වගන්තිය අනුව, මෙවැනි අඳ ගොවීන්ට විරුද්ධව පියවර ගත නොහැකි නිසා ඉඩම මිල දී ගත් නව ඉඩම් හිමියාට අසාධාරණයක් සිදු වේ.

07. ආපදා අවස්ථාවකදී කුඹුරු පාළුවීම වෙනුවෙන් ප්‍රවේණිය අඩුකර ගෙවීමට කොමසාරිස් විසින් ලබා දී ඇති සහනය අයුතු ලෙස ප්‍රයෝජනයට ගැනීම හා එවැනි පාළු වූ වගාවක් වෙනුවෙන් තක්සේරුවක් ඉදිරිපත්

කිරීමට ප්‍රාදේශීය නිලධාරීට හෝ කෘෂිකර්ම පර්යේෂණ හා නිෂ්පාදන සහකාර ට බලයක් හෝ පුහුණුවක් නොමැති වුවත් ඔවුන් විසින් එම තක්සේරුව සිදු කරනු ලැබීම.

08. ජලය අඩු කන්නවල කෙටිකාලීන බෝග යෙදීමට වැඩපිළිවෙළක් නොමැති අතර ගොවීන් පුරුද්දක් වශයෙන් මෙවැනි වගාවන් සිදු නොකිරීම නිසා ඉඩම් හිමියාට විශාල පාඩුවක් සිදු වීම.

4.4 පොදු ගැටලු

01. පනතේ රෙගුලාසි යටතේ කෘෂි විනිශ්චය සභා හා ඒ සඳහා පරීක්ෂණ නිලධාරීන් පත් නොකිරීමෙන් පරීක්ෂණ කටයුතු අඩාල වීම.

02. 2000 අංක 46 දරණ පනතට පමණක් ගොවිජන සංවර්ධන සභා සීමා වුවත් ප්‍රායෝගික වශයෙන් ක්‍රියාත්මක වන්නේ 1979 පනත අනුව පිහිටුවන ලැබූ ගොවිජන කාරක සභාව වීම.

03. පරීක්ෂණ නිලධාරීන් පත් නොකිරීම නිසා 2000 සිට අභියාචනා පැමිණිලි ගොඩගැසී තිබීම.

පස් වන පරිච්ඡේදය

# වර්ෂ 2010 යෝජිත අඳ ගොවි පනත් කෙටුම්පතෙහි සංශෝධනය විය යුතු වගන්ති පිළිබඳ අඳ ගොවීන්, ඉඩම් හිමියන් සහ ගොවිජන ක්ෂේත්‍රයේ නිලධාරීන්ගේ අදහස් හා යෝජනා

## 5.1 හැඳින්වීම

වර්ෂ 2000 අංක 46 දරණ ගොවිජන සංවර්ධන පනත හඳුන්වා දීමත් සමගම අඳ ගොවි ක්ෂේත්‍රයේ දැඩි ගැටලුකාරී ස්වභාවයක් උද්ගත විය. මෙම ගැටලු විසඳීම අරමුණු කරගනිමින් 2010 වර්ෂයේ දී ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව විසින් නව ගොවිජන සංවර්ධන පනතක් කෙටුම්පත් කරන ලදී, මෙම පනත් කෙටුම්පත අඳ ගොවීන් හා ඉඩම් හිමි ගොවි කණ්ඩායම් වෙත ඉදිරිපත් කර එහි අඳ ගොවීන්ට අයහපත් ලෙසට බලපාන වගන්ති පිළිබඳව හඳුනා ගැනීමක් කරන ලද අතර එම වගන්ති සඳහා අඳ ගොවීන් හා ඉඩම් හිමියන් විසින් සංශෝධනයන් කිහිපයක්ම ඉදිරිපත් කිරීමට කටයුතු කරන ලදී. මෙම පරිච්ඡේදයේදී ඉදිරිපත් කරනුයේ එලෙස අඳ ගොවීන්ගේ හා ඉඩම් හිමියන්ගේ අදහස් මත සංශෝධිත වගන්තීන්ය. ඊට අමතරව අඳ ගොවීන් හා ගොවිජන ක්ෂේත්‍රයේ නිලධාරීන් සමග සාකච්ඡා කිරීම මඟින් අඳ ගොවි ක්ෂේත්‍රය ශක්තිමත් කිරීම සම්බන්ධව ලබා ගන්නා ලද අදහස් කිහිපයක් අමතර යෝජනා ලෙස ඉදිරිපත් කර ඇත.

උපරිම කුඹුරු ප්‍රමාණය තීරණය කෙරෙන නියමය

4 1 (බී) 1958 සිට අඳ ගොවීන් සතුව පැවති උපරිම ඉඩම් වපසරිය අක්කර 5 කි. 1979, 1990, 2000 යන පනත්වලින් ද මෙම සීමාව එලෙසම පවත්වා තිබේ. මේ නිසා තවදුරටත් සීමාව එලෙසම තැබිය යුතු බවට අඳ ගොවීන් සියළුදෙනාත්, ඉඩම් හිමියන් බොහෝ දෙනෙකුත්, නිලධාරීහු බහුතරයකුත් ප්‍රකාශ කළහ. අක්කර 2 1/2 දක්වා උපරිම සීමාව අඩු කළහොත් මෙතෙක් පවත්වා ගෙන ආ ආර්ථික තත්ත්වය බරපතල ලෙස කඩා වැටීමකට ලක්වන බව අඳ ගොවීහු ප්‍රකාශ කළහ. මේ නිසා සමස්තයක් ලෙස අඳ ගොවියන්ගේ අදහස වූයේ, උපරිම අක්කර 5 සීමාව එලෙසම පැවතිය යුතු බවය. ඉඩම් හිමියන් බොහෝ දෙනෙක් ප්‍රදේශයෙන් පිටත සිටීම නිසා අඳ ගොවියාගේ අයිතිය අක්කර 2 1/2කට සීමා කර, ඉතිරි ප්‍රමාණය කුඹුරු හිමියාට ලබා දී කුඹුරු හිමි ගොවියෙකු ලෙස වගා කිරීමට ලබා දුනහොත් නව අඳ ගොවියෙකු බිහිවන අතර මෙය ඉඩම් කැබලිවීම වැඩි වීමටත්, ජාතික නිෂ්පාදනය අඩුවීමටත් හේතු වේ. මෙහිදී ඉඩම් හිමියෝද මෙම පවතින උපරිමය වන අක්කර 5 තවදුරටත් නොබෙදා තැබිය යුතු බව ප්‍රකාශ කළහ. අක්කර 2 1/2 ට වැඩියෙන් වගා කරන අඳ ගොවීහු 7000කටත් වඩා හම්බන්තොට දිස්ත්‍රික්කය තුළ සිටිති. හම්බන්තොට දිස්ත්‍රික්කයේ නිලධාරීන්ට අනුව, අඳ ගොවීන්ගේ අනුප්‍රාප්තිකයන්ට අඳ ගොවීන් ලෙස කටයුතු කිරීමේදී උපරිම අක්කර 2 1/2ක් පමණක් වගා කිරීමට සිදුවීම ප්‍රබල ගැටළුවකි. එසේ වුවහොත් අඳ ගොවියා ඉවත් කරන්නේ කුමන ඉඩම් කොටසින්ද, කුමන ඉඩම් හිමියාගෙන්ද යන්නද ගැටළුවකි. අක්කර 2 1/2කට සීමා කිරීම තුළින් අඳ ගොවීන් ප්‍රමාණය වැඩිවීමත්, ඉඩම් කැබලිවීමත් සිදු වේ. මේ නිසා වඩා සුදුසු වනුයේ දැනට පවතින උපරිම අක්කර 5 සීමාව එසේම තැබීමය. කෙසේ නමුත් මාතර දිස්ත්‍රික්කයේ පවතින

බොහෝ කුඹුරු අක්කර 2 1/2ට අඩු ඒවාය. ඇතැම් අය ගොවිතැනේ යෙදෙන්නේ ද්විතියික රැකියාවක් ලෙසයි. එම නිසා කුඹුරට පොහොර යෙදීම, වල් නෙළීම, ඇළවේලි ශුද්ධ කිරීම ආදිය නිසි පරිදි සිදු නොවේ. කන්නයට නියමිත පරිදි වගා කිරීමද සිදු නොවේ. එම නිසා වී වගාවෙන් ලබන අස්වැන්න අක්කරයට බුසල් 60ක් පමණ වන අතර එය පවුලේ පරිභෝජනය සඳහා පමණක් සෑහේ. නමුත් සැබෑ ගොවීන්ට එනම්, ගොවිතැන සිය ප්‍රධාන ජීවනෝපාය ලෙස කරගෙන යන ගොවීන් සම්බන්ධයෙන් අක්කර 2 1/2කට උපරිම ඉඩම් ප්‍රමාණය සීමා කිරීම සුදුසු නොවේය යන්න මාතර දිස්ත්‍රික්කයේ නිලධාරින්ගේ අදහස විය. එයට හේතුව මෙම අඳ ගොවීන් සිය ඉඩම් අඳ පවත්නා තත්ත්වයට සංවර්ධනය කර ඔවුන් මෙම ඉඩම්වල පූර්ණකාලීන ගොවීන් වශයෙන් කටයුතු කරන හෙයිනි. වර්තමානයේ අනුරාධපුර දිස්ත්‍රික් ඉඩම් හිමියන් විවිධ ක්‍රම අනුගමනය කර අඳ ගොවීන්ගෙන් කුඹුර ලබාගෙන අක්කර 10 බුසල් 25 වී බද්දට, වෙනත් පුද්ගලයෙකුට බදු දී ලාබ ගැනීමට ක්‍රියා කරයි. අක්කර 2 1/2 සීමාව පැනවුවහොත් මෙම ඉඩම් හිමියන් විසින් අක්කර 2 1/2 ට වඩා වැඩි ඉඩම් අඳ ගොවීන්ගෙන් ලබාගෙන වී බද්දට වෙනත් පුද්ගලයින්ට ලබා දෙනු ඇත. ගොවි සංවිධානවල නායකයන්ගේ අදහස වනුයේ මෙම බදු ගොවීන් ගොවි සංවිධානවල සාමූහික ක්‍රියාමාර්ගවලට අවනත නොවන, යායේ සාම්ප්‍රදායිකව වගා කරන ගොවීන් මෙන් ඇළ ශුද්ධ කිරීම, වනාත් ශුද්ධ කිරීම වැනි ගොවි සමාජයේ පිළිගත් වගා හර පද්ධතියට අනුව කටයුතු නොකරන්නන් බැවින් එය ගොවි සමාජයේ සාමූහික පිළිවෙත්වලට හානිකර තත්ත්වයක් බවත් ය.

අක්කර 5 ක ඉඩම් ඒකකයක් වගා කරමින් සිටි ගොවියකු අනාගතයේදී එයින් කොටසක් වගා කිරීමට එකඟ නොවේ. 1958 කුඹුරු පනතේ එක් අරමුණක් වූයේ ඉඩම් කොටස්වලට කැඩී යාමෙන් වලකා ඒවා ඒකාබද්ධ කිරීමයි. මෙම 2010 යෝජිත පනත එම අරමුණට පටහැනිව ක්‍රියාකිරීමක් වන අතර එය ඉඩම් කොටස්වලට කැඩී යාමට මග පාදන්නක් වන්නේය. එය ප්‍රායෝගිකව ගත් කළ යන්ත්‍රෝපකරණ භාවිතයට බාධාකරන්නක් වන අතර ඵලදායිතාවය අඩුවීමටද හේතු වන්නකි. වර්තමානයේදී ක්ෂේත්‍රයේ ප්‍රායෝගිකව ක්‍රියාත්මක වනුයේ නීත්‍යානුකූල අඳ ගොවියන්ගෙන් පසුව එක් දරුවෙකු හෝ දරුවන් කීපදෙනෙකු විසින් මුළු කුඹුරු ප්‍රමාණය සාමූහිකව වගා කිරීමය.

අඳ ගොවියාගේ අයිතිවාසිකම්වලට අනුප්‍රාප්තිකයකු නම් කිරීම

(5) 1958 අංක 01 දරණ කුඹුරු පනත අනුව අඳ ගොවියා මියගිය පසු ඔහුගේ අයිතිවාසිකම්වලට ලංකාවේ පුරවැසියෙකු නම් කිරීමට අඳ ගොවියා ජීවත්ව සිටියදී හැකියාව තිබිණි. එසේම එම අඳ ගොවියාට එම නම් කිරීම අවශ්‍ය ඕනෑම විටක අවලංගු කර ඒ සඳහා අළුතින් කෙනකු නම් කිරීමටද බලතල තිබිණි.

1979 අංක 58 දරණ ගොවිජන සේවා පනත අනුව, යම් අඳ ගොවියකු සමඟ හවුලේ හෝ තට්ටු මාරුවට වගා කරන අඳ ගොවියකු හැර, සෙසු අඳ ගොවියකු මියගිය පසු ඔහු සතු අයිතිවාසිකම්වලට අනුප්‍රාප්තිකයෙකු ලෙස ඔහුගේ පවුලේ සාමාජිකයෙකු නම් කිරීමට අඳ ගොවියාට හැකියාව තිබිණි.

වර්ෂ 2000 අංක 46 දරණ ගොවිජන සංවර්ධන පනත ඉදිරිපත් කරන ලද්දේ අඳ ගොවියා හෝ ඉඩම් හිමියා යන පාර්ශව දෙකෙන් එක් පාර්ශවයක් විසින් කුඹුරු ඉඩම මිලට ගැනීමේ පසුබිමක් නිර්මාණය කිරීමේ අරමුණෙනි. එම නිසා 2000 පනත අනුව අනුප්‍රාප්තිකයෙකුට උරුමවීමක් පිළිබඳව දක්වා නැත.

2010 පනත් කෙටුම්පත අනුව අඳ ගොවියා මියගිය හෝ පූර්ණ ආබාධිත තත්ත්වයට පත් වුව හොත් ඔහුගේ අඳ අයිතිය ජීවත්ව සිටින බිරිඳ හෝ එවැන්නෙකු නොමැති විට අඳ ගොවියාගේ දරුවකුට (විශේෂයෙන් වැඩිමහල් දරුවාට) උරුම වේ.  දරුවන් කිහිප දෙනෙකු සිටින විට අදාළ අනුප්‍රාප්තිකයා විය යුත්තේ ප්‍රධාන රැකියාව ලෙස ගොවිතැන් කරන වෙනත් ස්ථිර රැකියාවක් නොකරන දරුවාය.

අඳ ගොවියා මිය ගිය හොත් හෝ පූර්ණ බෙලහීන තත්ත්වයට පත් වුව හොත්, කලත්‍රයාටත්, ඉන්පසු දරුවකුටත් අනුප්‍රාප්තිකයා ලෙස කුඹුර වගා කිරීමට අයිතිවාසිකම් තිබිය යුතුය. නමුත් මෙම දෙවන පැවරුම සිදු කිරීමේදී අදාළ අඳ ගොවියා හා ඉඩම් හිමියා අතර වගකීම් සහිත ගිවිසුමක් අත්සන් කළ යුතුය. එහිදී අදාළ අනුප්‍රාප්තිකයා අනිවාර්යයෙන්ම ගොවිතැන් කටයුතුවල යෙදෙන්නකු විය යුතු බවත් වගකීමෙන් වගා කටයුතු සිදු කරන බවට විශ්වාසයක් මෙම ගිවිසුම මගින් දෙපාර්ශ්වය අතර ඇති විය යුතුය යන්නත් අඳ ගොවීන්ගේ හා ඉඩම් හිමියන්ගේ අදහස විය. නිලධාරීහුද මෙයට එකඟත්වය පළ කළහ. නීත්‍යානුකූල අඳ ගොවියා මියයාම හෝ බෙලහීන වුව හොත් බිරිඳටත් එවැන්නෙකු නොමැති නම් වැඩිමහල් දරුවාටත් අඳ අයිතිය උරුම වේ යනුවෙන් පනතේ දක්වා ඇත. එහෙත් ප්‍රායෝගික තත්ත්වය වනුයේ වැඩිමහල් දරුවා ඇතැම් විට රජයේ හෝ පෞද්ගලික අංශයේ රැකියාවක නිරත වීමය. එසේම හම්බන්තොට සහ මාතර දිස්ත්‍රික්කයේ ඉඩම් හිමියන් ප්‍රකාශ කළ පරිදි නීත්‍යානුකූල අඳ ගොවියාගෙන් පසුව දරුවන්ට අඳය උරුම වීමේදී ඉඩම් හිමියන්ගේ කැමැත්තද සලකා බැලීම අවශ්‍ය වේ. ක්ෂේත්‍රයේ ප්‍රායෝගිකව දැකිය හැකි තත්ත්වය වනුයේ ඇතැම් අඳ ගොවි පවුල්වල දරුවන් තමාට අඳ කුඹුර ස්වයංක්‍රීයව උරුමවන බව දන්නා නිසා කෙසේ හෝ බුසල් 14ක් දීමට පමණක් කුඹුර වගා කරන බවයි. කුලිය වැඩිවීම, ට්‍රැක්ටර් යන්ත්‍ර සූත්‍ර ගාස්තු වැඩි වීම, ගොවියා අගය නොකිරීම වැනි විවිධ හේතු මත වගාවට උනන්දු නොවී ඇතැම්විට එම අඳ කුඹුර උරුම වන පුද්ගලයා වෙනත් ව්‍යාපාරික කටයුතු හෝ කෘෂිකාර්මික නොවන වෙනත් ආදායම් උපයන මාර්ගයක නියැළීමට ඉඩ ඇත. ඔහු තමාට උරුම වූ අඳ කුඹුර වෙනත් පුද්ගලයෙකුට අතුරු බදු දී ඉඩම් හිමියාට අක්කරයට වී බුසල් 14ක් ගෙවීම සිදු කරයි. ඇතැම් විට අක්කරයට වී බුසල් 36ක අතුරු බද්දට දී ඉන් 14ක් ඉඩම් හිමියාට ගෙවා අක්කරයට වී බුසල් 22ක ලාභයක් කිසිම කාර්යයක නොයෙදී ලබා ගැනීමට ක්‍රියා කරයි. එය ප්‍රායෝගිකව දැකිය හැකි ප්‍රවණතාවයකි. මේ සම්බන්ධයෙන් ඉඩම් හිමියාගේ කැමැත්තක් නොමැති අතර නීත්‍යානුකූල දෙවැනි අඳ ගොවියා මියගිය අවස්ථාවලදී අඳ ගොවියා ලෙස ඉදිරිපත් වන්නේ මෙම අතුරු බදු ගන්නා ගොවියායි. මෙය ඉඩම් හිමියා මෙන්ම ඔහුගේ දරුවන්ද අපහසුතාවයට ලක්වන තත්ත්වයකි. එසේම මාතර දිස්ත්‍රික්කයේ හක්මන සහ කඹුරුපිටිය ගොවිජන සේවා මධ්‍යස්ථාන බල ප්‍රදේශයන්හි ඉඩම් හිමියන් ප්‍රවේණිය ලෙස ලබා ගන්නේ මුළු අස්වැන්නෙන් 1/4 ක කොටසයි. මෙම ප්‍රවේණි ක්‍රමය යටතේ කුඹුරේ අස්වැන්න වැඩි වීම හා අඩු වීම ඉඩම් හිමියාට බලපායි. දෙවැනි අඳ ගොවියකුට අඳ අයිතිය උරුම වීමේදී ඔහු සැබෑ ගොවියකුද, එසේම උනන්දුවෙන් සහ ලෙන්ගතුකමකින් අඳ කුඹුර වගා කර උපරිම අස්වනු නෙළා ගැනීමට කටයුතු කරන්නෙක්ද යන්න සොයා බලා එවැනි ප්‍රායෝගික ගොවියකු නම් ඔහු සමඟ යළිත් ලිඛිත හෝ වාචික ගිවිසුමක් ඇති කරගැනීමට අවස්ථාව තිබිය යුතුය. ඉතා උනන්දුවෙන් වගා කර කුඹුරෙන් උපරිම ඵලදාව ලබා ගැනීමට එම දෙවැනි අඳ ගොවියා සමඟ ප්‍රායෝගික ගිවිසුමක් ඇති කරගත යුතු බව මාතර දිස්ත්‍රික් රැස්වීමට පැමිණි ඉඩම් හිමියන්ගේ අදහස විය. අනුරාධපුර

දිස්ත්‍රික්කයේ අඳ ගොවීන් ප්‍රකාශ කලේ අඳ ගොවීන් මෙම කුඹුරු සංවර්ධනය කිරීම සඳහා බලවත් පරිශ්‍රමයක් දරා ඇති බවත් ඒ නිසා අඳ ගොවියාගේ දරුවකු වෙනත් රැකියාවක් කළ පමණින් අඳ කුඹුරු අහිමි නොකළ යුතු බවත් ය. අඳ ගොවියන්ගේ දරුවන් සියළු දෙනා රැකියාවල නියැළෙමින් වර්තමානයේ අක්කර 1ක් වැනි කුඩා ප්‍රමාණයක අඳ කුඹුරක් වගා කරන අවස්ථාද දැක ගත හැක. ගොවිතැනින් පමණක් තම පවුලේ ආදායම සපයා ගත නොහැකි නිසා ඔවුන්ට වෙනත් රැකියාවක යෙදීමට සිදු වේ. එබැවින් රැකියාවක නිරත අයෙකුට අඳයට කුඹුරක් වගාකිරීමේ හැකියාව ඇත්නම් ඔවුන් අඳ ගොවීන් සේ සැලකීම සුදුසු බව අඳ ගොවීන්ගේ අදහස විය.

එහෙත් ප්‍රායෝගිකව මෙම තත්ත්වය ක්‍රියාවට නැගීම අපහසු කටයුත්තකි. එයට හේතුව ඉඩම් හිමියන්ගෙන් යම්කිසි ප්‍රතිශතයක් කුඹුරු පිහිටි දිස්ත්‍රික්කයේ හෝ එම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය තුළ හෝ ජීවත්වන්නන් නොවන අතර ඔවුන් ගාල්ල, මාතර, කොළඹ වැනි දුරබැහැර ප්‍රදේශවල හෝ ඇතැම් විදේශ රටවල හෝ ජීවත් වන්නන් වීමය. ඒ නිසා අඳ ගොවියා සහ ඉඩම් හිමියා අතර සම්බන්ධයක් නැති අවස්ථාද දක්නට ඇත. එවැනි අවස්ථාවලදී මෙවැනි අවබෝධතාවයන් ඇති කරගැනීම ප්‍රායෝගිකව දුෂ්කර කාර්යයක් වෙයි.

අනුප්‍රාප්තිකයෙකු නම් නොකළ විට අඳ ගොවියාගේ අයිතිවාසිකම් උරුම වීමට අනුප්‍රාප්තිකයෙකු නොමැති වීම

(6) 1958 අංක 1 දරණ කුඹුරු පනත අනුව අනුප්‍රාප්තිකයකු නොමැතිව අඳ ගොවියා මියගිය පසු ජීවත්ව සිටින කලත්‍රයාටද එවැන්නකු නොමැති විට අදාළ අඳ ගොවියාගේ ලේ ඥාතියෙකුටද (වැඩිමහල් ඥාතිවරයාට) අඳ ගොවිතැන උරුම වේ. එසේම අඳ අයිතිවාසිකම් උරුම වන තැනැත්තා වී ගොවිතැන නුපුරුදු තැනැත්තකු නම්, ප්‍රදේශයේ ගොවිකාරක සභාව විසින් මිය ගිය අයට සම්බන්ධ වී ගොවිතැන පුරුදු ඥාතිවරයෙකු තෝරා එහි අඳ අයිතියට ඔහු උරුමකරු වශයෙන් පත් කරනු ලැබීය. මියගිය අඳ ගොවියාගෙන් පසු ජීවත් වන ඔහුගේ කලත්‍රයාට අඳ අයිතිය උරුම නොවන අවස්ථාවක එසේ පත් කරනු ලබන තැනැත්තා විසින් අඳ ගොවියා මිය ගිය දිනට පෙර අවුරුදු තුනේදී එම කුඹුරු ප්‍රමාණයෙන් බදු ගෙවූ පසු ඉතිරි මුළු ආදායමේ සම්පූර්ණ ප්‍රමාණයෙන් හතරෙන් කොටසක් මුදලින් හෝ අස්වැන්නෙන්, මිය ගිය අඳ ගොවියාගේ කලත්‍රයාට ගෙවිය යුතුය. 1958 අංක 1 දරණ කුඹුරු පනත අනුව අඳ ගොවියා මියගිය පසු අඳ අයිතිය උරුම වීමට බිරිඳක, සැමියෙකු, ඥාතියෙකු හෝ පත්වීමට නම් කරන ලද්දකු නැති විට, ගොවිකාරක සභාව විසින් එය ඉඩම් හිමියා වෙත ලිපියකින් දැන්විය යුතුය. ඉන්පසු ඉඩම් හිමියා විසින් ඉඩම් හිමි ගොවියා වීමට කැමති බව දන්වා සිටිය හොත්, ඔහුට අක්කර 05 කට නොවැඩි ප්‍රමාණයක ඉඩම් හිමි ගොවියකු වීමට කාරක සභාව විසින් අවසර දෙනු ලැබේ. මේ සඳහා දින 30ක කාලයක් ඉඩම් හිමියාට දෙනු ලැබේ. ඉඩම් හිමියා එම නියමිත කාළ සීමාව තුළ දැනුම් දීමක් නොකළ හොත්, කාරක සභාව විසින් එම අයිතිවාසිකම් සඳහා සුදුසු තැනැත්තෙක් නම් කරනු ලැබිය යුතු අතර, එම තැනැත්තා අදාළ ප්‍රදේශයේ වසන්නකු වීම වඩාත් සුදුසුයි.

1979 අංක 58 දරණ ගොවිජන සේවා පනත අනුව අඳ ගොවියා අනුප්‍රාප්තිකයකු නම් නොකර මිය ගිය විට ඔහු සතු අයිතිවාසිකම් ජීවත් වන ඔහුගේ බිරිඳටද එවැන්නකු නැති විට දරුවකුටද එම අඳ ගොවියාට දරුවන් එක් අයෙකුට වඩා සිටින විට ඔවුන් අතරින් වැඩිමලාටද, දරුවන් නොමැති විට එම අඳ ගොවියාගේ දෙමව්පියකු, සහෝදරයෙකු හෝ සහෝදරියක වෙතද උරුම වේ.

වර්ෂ 2000 පනතේ අනුප්‍රාප්තිකයෙකු පිළිබඳව සඳහනක් නැත. 2010 පනත් කෙටුම්පත අනුව අඳ ගොවියා මිය ගිය හෝ පූර්ණ ආබාධිත තත්ත්වයට පත් වූ පසු අඳ අයිතිවාසිකම් උරුම වීම සඳහා කෙනෙකු නැත්නම් ඉඩම් හිමියා ඉඩමේ අයිතිකරුද වේ නම්, ඔහු . ඉඩම් හිමි ගොවියෙකු ලෙස වගා කිරීමට ඇති කැමැත්ත දැනුම් දිය යුතුය. අඳ ගොවියාගෙන් පසු අඳ අයිතිවාසිකම් උරුම වීම සඳහා නීත්‍යානුකූල උරුමකරුවකු පවුලේ නොමැති බවට කොමසාරිස් ජෙනරාල් සෑහීමකට පත් වේ නම් අදාළ ඉඩම් හිමියාට ඉඩම අයිති කරගැනීමටත් ඉඩම් හිමි ගොවියෙකු ලෙස වගා කිරීමටත් අවසර දෙනු ලැබේ.

අඳ ගොවියාට නීත්‍යානුකූල දරුවන් නොසිටිය හොත් හෝ කලත්‍රයා ජීවත්ව නොසිටිය හොත් එම අඳ ගොවියා, අබල දුබල අවස්ථාවේ රැකබලා ගෙන ගොවිතැන් කරන යම් ඥාතියෙකුට හෝ වෙනත් පුද්ගලයෙකුට අඳ ගොවියා මිය ගිය පසු අඳය අයිති වන සේ වගන්තියක් නව පනත තුළ ඇති කළ යුතුයි අඳ ගොවීන් යෝජනා කරයි. එවැනි පුද්ගලයකු අඳ ගොවියා රැක බලා ගන්නේ යයි ඔප්පු කරන ක්‍රමයද පනතෙහි ඇතුළත් කිරීම වඩා සුදුසුය. නීත්‍යානුකූල අඳ ගොවියාට නීත්‍යානුකූල දරුවන් නොමැති තත්ත්වයක් යටතේ ඔහු පූර්ණ ආබාධිත තත්ත්වයට පත් වූ පසු අඳ කුඹුර වගා කිරීම ඥාතියෙකුට හෝ වෙනත් හිතෙෂී පුද්ගලයෙකුට පැවරීම ක්ෂේත්‍රයේ සිදුවන ප්‍රායෝගික තත්ත්වයයි. තම අවසාන කාලයේදී කුඹුර තම ඥාතියෙකුට පැවරීම මගින් අඳ ගොවියා බලාපොරොත්තු වනුයේ අවසාන කාලය සඳහා රක්ෂණාවරණයක් සලසා ගැනීමයි. එවැනි අවස්ථාවකදී අඳ කුඹුරක් බාර ගන්නා තැනැත්තා ද අනාගත අඳ උරුමයක් සඳහා බලාපොරොත්තු තබා ගන්නා අවස්ථා ඇත. එම නිසා කලත්‍රයා හෝ දරුවන් නොමැති විට අඳ ගොවියා මිය ගිය පසු එම කුඹුර අයිති වීමට වෙනත් කෙනෙකු නොමැති අවස්ථාවේ දී ජීවත්ව සිටින අඳ ගොවියාගේ හා ඉඩම් හිමියාගේ කැමැත්ත මත අනුප්‍රාප්තිකයෙකු නම් කිරීමට අඳ ගොවියා ජීවත්ව සිටින කාලයේ දී ඔහුට හැකියාව තිබිය යුතුය.

අඳ ගොවියා විසින් වගා කරන ඉඩම ඉඩම් හිමියා විසින් විකිණීම සඳහා ඉදිරිපත් කිරීම

12) 1958 අංක 01 දරණ කුඹුරු පනතේ ඉඩම විකිණීම පිළිබඳව සඳහන් නොවන නමුත් ඉඩම් හිමියා අදාළ කුඹුරු ප්‍රමාණයේ ඉඩම් හිමි ගොවියකු වීමට අදහස් කරන විට පනත වලංගු වීම ආරම්භ වී 5 වසරක් ඇතුළත ඒ බව අදාළ ප්‍රදේශයේ ගොවිකාරක සභාවට ලියවිල්ලකින් දැනුම් දිය යුතුය. එහිදී අදාළ අඳ ගොවියාට අය විය යුතු යම් වන්දි මුදලක් වෙතොත්, එය ගෙවූ පසු නියමිත කුඹුරු ප්‍රමාණයෙන් ඉවත් වීමට ලිඛිත විධානයක් කළ යුතුය.

ඉඩම් හිමියා විසින් ඉඩම විකිණීමට අදහස් කරනු ලබන විට අනුගමනය කළ යුතු විධිවිධාන පිළිබඳව 1979 පනතේ මෙන්ම 2000 පනතේ ද සඳහන් වේ. ඉඩම් හිමියා විසින් මුලින්ම තම ඉඩම විකිණීමට අදහස් කරන මිල සඳහන් කර ලිඛිතව අඳ ගොවියාට දැනුම් දෙනු ලැබිය යුතුය. එයට හේතුව මෙම පනත නිර්මාණය කරන ලද්දේ එම අඳ කුඹුරු අඳ ගොවියා හෝ ඉඩම් හිමි ගොවියා යන දෙදෙනාගෙන් එක් අයෙකු විසින් මිලදී ගැනීමට අවස්ථාව සලසා දීම සඳහා වීමයි. නමුත් යෝජිත ඉඩම් බැංකු ක්‍රමය ක්‍රියාත්මක නොවීම නිසා මෙම අදහස ක්‍රියාත්මක නොවීය.

2010 පනත් කෙටුම්පත අනුව ඉඩම් හිමියා ඉඩම විකිණීමට අදහස් කරන විට එය මුලින්ම අඳ ගොවියාට, විකිණීමට කැමති මිල සඳහන් කරමින් දැනුම් දිය යුතුය. එවිට එකඟ වන සාධාරණ මිලකට අඳ ගොවියා ඉඩම මිලදී නොගන්නා අවස්ථාවකදී වෙනත් පුද්ගලයෙකුට ඉඩම විකිණීමට ඉඩම් හිමියාට අවස්ථාව ලැබේ. මෙහිදී අඳ ගොවියාගේ අඳ අයිතිවාසිකම්වලට බාධාවක් සිදු නොවේ. අඳ ගොවීන්ගේ අදහස වූයේ ඉඩම් හිමියා විසින් ඉඩම විකුණනු ලැබිය යුත්තේ වෙළෙඳපොළ මිල මත නොව, ප්‍රදේශයේ පවතින ඉඩම්වල තක්සේරු වටිනාකම මත ගොවිජන සේවා කමිටුව විසින් තීරණය කරන ලද මිලකට බවය. කුඹුරු හිමියන්ට තම පෞද්ගලික දේපළ වන කුඹුරු, අවශ්‍ය අවස්ථාවක දී වෙනත් අයෙකුට විකිණීමට නීතිරීති සකස් විය යුතු බව ඉඩම් හිමියන්ගේ අදහසයි. අසනීපයක් වැනි හදිසි අවස්ථාවක දී ඉතා කෙටි ක්‍රමයකින් ඉඩම විකිණීමට ඉඩම් හිමියාට අවස්ථාව තිබිය යුතුය. ඉඩම අඳ ගොවියා විසින් මිලට ගනු ලබන්නේ නම්, ඉඩමේ අඳ අයිතිවාසිකමට අදාළ වටිනාකම අඩු විය යුතුය යන්නත් එම අඩු මිලට මිලදී ගැනීමට අවශ්‍ය පහසුව සලසන නීතියක් ඇතුළත් විය යුතුය යන්නත් අඳ ගොවීන්ගේ අදහස විය. ඉඩම මිලදී ගැනීමට අපහසු පුද්ගලයෙකුට ඉඩම් බැංකුවක් පිහිටුවා (පහසු පොළියක් යටතේ) ණය පහසුකම් ලබා දිය යුතුය. ඉඩම් හිමියා සහ අඳ ගොවියා අතර ඉඩම විකිණීම පිළිබඳ සංවාදය නියමිත පරිදි සිදු විය යුතුය. මෙවැනි ඉඩම් විකිණීම පිළිබඳ පරීක්ෂණ කඩිනම් කිරීමට කමිටුව ක්‍රියා කළ යුතුය. නිලධාරීන්ගේ අදහස වූයේ කුඹුරු හිමියා හෝ අඳ ගොවියා යන දෙදෙනාගෙන් එක් අයකු විසින් කුඹුර සාධාරණ මිලකට (කාරක සභාව තීරණය කරන) මිල දී ගනු ලැබිය යුතු බවයි. එවිට ආරවුල් ඇති නොවේ. එසේ නැතහොත් අයිතිය නිශ්චිත වන සේ කුඹුරු හිමියා හා අඳ ගොවියා විසින් කුඹුර බෙදා ගනු ලැබිය යුතුය.

අඳ ගොවියකු විසින් වගා කරනු ලබන ඉඩමක් අයිතිකරු විසින් විකිණීමට අදහස් කරනු ලබන විට සහන මිලකට අඳ කුඹුර මිල දී ගැනීමට අඳ ගොවීහු කැමත්ත ප්‍රකාශ කළහ. එනම් විවෘත වෙළෙඳපොලේ ඉල්ලුම සැපයුම අනුව තීරණය වන මිලකට නොව රජයේ තක්සේරු වටිනාකම අනුව තීරණය කරන මිලකටය. එහෙත් ඉඩම් හිමියාගේ අදහස වන්නේ තම ඉඩම හැකි ඉහළම මිලකට විකිණීමට ඔහුට ඉඩ තිබිය යුතු බවය.

කෙසේ නමුත් විවෘත වෙළෙඳපොලේ මිලට ඉඩම් අලෙවි කිරීමට ඉඩම් හිමියාට අවස්ථාව තිබිය යුතුය. එනම් තමන්ට අයත් දේපළ තම කැමැත්ත අනුව ඉහළම මිලකට අලෙවි කිරීමට ඉඩම් හිමියාට නිදහස තිබිය යුතුය. ඉඩම් හිමියෙකුට ඉතා හදිසි මුදල් අවශ්‍යතා ඇතිවීමට පුළුවන. එවැනි අවස්ථාවකදී මාස ගණනාවක් බලා සිටීමට ඉඩම් හිමියෙකුට හැකියාවක් නැත. ඔහුගේ මුදල් අවශ්‍යතාවය ඉතා කෙටි කලක් තුළ ඉටු කරගැනීමට ඉඩකඩ තිබිය යුතුය. ගොවිජන සංවර්ධන කමිටුව විසින් ඉඩමේ වටිනාකම තක්සේරු කිරීමට පනතින් බලය පවරා ඇති අතර එම කමිටුව නියෝජනය කරන්නේද අඳ ගොවීන්ය. එම නිසා ඔවුන් විසින් තීරණය කරනු ලබන මිලට ඉඩම් විකිණීමට ඉඩම් හිමියා කැමති නොවීමට ඉඩ ඇත. එසේම 2010 යෝජිත පනත අනුව ඉඩම විකිණීමට සිදු වනුයේ අඳ ගොවියාද සමඟය. අඳ ගොවියකු ද සමඟ ඉඩමක් උපරිම මිලකට විවෘත වෙළෙඳපොලේ විකිණීම අසීරු කටයුත්තකි. එම නිසා මෙම වාතාවරණය තුළ සාධාරණ මිලකට ඉඩම විකිණීමට ඉඩම් හිමියාට පනත තුළින් අවස්ථාව ලබාදීම කාලෝචිතය. එසේම ඉඩම මිලදී ගැනීමට අඳ ගොවීන් කැමති වුවත් එය මිල දී ගැනීමට ඇති බාධකය ඔවුන්ට ප්‍රමාණවත් මුදල් නැතිකමය.

එම නිසා එවැනි ගොවීන්ට ඉඩම් මිලදී ගැනීම සඳහා පහසු පොළී යටතේ ණය සැපයීමේ ආයතනයක් එනම් ඉඩම් බැංකුවක් ස්ථාපිත කළ යුතුය.

ගොයම් කපා පාගා ගැනීමේ සහ ඉවත් කර ගැනීමේ දින අඳ ගොවියා විසින් ඉඩම් හිමියාට දැනුම් දිය යුතු බව

13) 1958 මෙවැන්නක් සඳහන් නොවේ.
1979- අස්වැන්න කපා පාගා ගැනීම ආරම්භ කිරීමට අදහස් කරන දිනය අවම වශයෙන් දින 10ක් ඇතුළත සහ අස්වැන්න කමතෙන් ඉවත් කරගැනීම අවම වශයෙන් දින 7ක් ඇතුළත අඳ ගොවියා විසින් ඉඩම් හිමියාට දැනුම් දෙනු ලැබිය යුතුය.

2000 – 1979 පරිදිම වේ.
2010 අස්වැන්න නෙළීමට අවම වශයෙන් දින 14ක් ඇතුළත ඉඩම් හිමියාට හා ගොවිජන සංවර්ධන කම්ටුවට දැනුම් දිය යුතුය.

වර්ෂ 2010 යෝජිත පනතේ 13 (1) වගන්තිය අනුව අඳ ගොවියා විසින් ගොයම් කැපීම ආරම්භ කිරීමට අදහස් කරගෙන සිටින දවස සහ අස්වැන්න කමතින් ඉවත් කරගැනීමට අදහස් කරන දිනය අස්වැන්න නෙළීමට අවම වශයෙන් දින 14කට කලින් ඉඩම් හිමියාට හා ගොවිජන සංවර්ධන කම්ටුවට දැනුම් දෙනු ලැබිය යුතු යයි දක්වා ඇත.

මේ වගන්තිය සම්බන්ධයෙන් අඳ ගොවීන් එකඟ නැති අතර එයට හේතුව ලෙස ඔවුන් දක්වන එක් කරුණක් වුයේ අස්වනු නෙළීමේ යන්ත්‍ර සහ ශ්‍රමය නියමිත දිනවල සොයා ගැනීමට අපහසු වුව හොත් එම සැලසුම අනුව අස්වනු නෙළීමට නොහැකි වීමයි. අනෙක් කරුණ වනුයේ හම්බන්තොටදී අක්කරයට බුසල් 14ක ප්‍රවේණියක්ද අනුරාධපුරයේදී අක්කරයට වී බුසල් 12ක ප්‍රවේණියක්ද වශයෙන් නිශ්චිත ප්‍රමාණයක් ගෙවීම නිසා එලෙස කල් තබා දැනුම් දීම අවශ්‍ය නොවේය යන්නයි. නිලධාරීන්ගේ හා ඉඩම් හිමියන්ගේ මතය වුයේ එලෙස නිශ්චිත දිනයක් දැනුම් දීම අවශ්‍ය බවයි. හේතුව වන්නේ එසේ නොමැති විට විවිධ අස්වනු වංචා සිදුවීමට ඉඩකඩ එනම් තත්ත්වයෙන් බාල වී ප්‍රවේණිය ලෙස ලබා දීම ආදිය ක්ෂේත්‍රයේ බහුලව සිදුවීමයි.

මාතර දිස්ත්‍රික්කයේ දී මුළු අස්වැන්නෙන් 1/4ක් ඉඩම් හිමියාට ලබා දීමේ ප්‍රවේණි ක්‍රමය අනුගමනය කරන නිසා අස්වනු වංචා කිරීමට අඳ ගොවීන්ට ඉඩ ප්‍රස්ථාව ඇත. එම නිසා සමස්තයක් ලෙස මුළු දිවයිනටම බලපාන පරිදි පනත ක්‍රියාත්මක කිරීමේදී එවැනි වංචාසහගත ක්‍රියා වැළැක්වීමට නව පනතින් අවස්ථාව තැබිය යුතුය.

අඳ ගොවියා විසින් ඉඩම් හිමියාට ගෙවිය යුතු ප්‍රවේණිය තීරණය කිරීම

14) 1958 – එක් කුඹුරු අක්කරයකින් වී බුසල් 15කට නොවැඩි ගණනක් හෝ මුළු අස්වැන්නෙන් 1/4කට නොවැඩි කොටසක් යන දෙකින් අඩු ප්‍රමාණය එක් කන්නයක් සඳහා බද්ද ලෙස ගෙවිය යුතුය. මෙම නිශ්චය කෙරෙන බද්ද විවිධ පරිපාලන දිස්ත්‍රික්ක සම්බන්ධයෙන් හෝ එකම පරිපාලන දිස්ත්‍රික්කයේ විවිධ කොටස් සම්බන්ධයෙන් හෝ වෙනස් විය හැක.

1979 - එක් එක් කුඹුරු අක්කරයකින් වී බුසල් 15කට නොවැඩි ගණනක් හෝ මුළු අස්වැන්නෙන් පනත යටතේ නියමිත අය කිරීමේ ප්‍රමාණය අඩු කළ විට ඉතිරි කොටසින් 1/4කට නොවැඩි කොටසක් යන දෙකෙන් වඩා වැඩි ප්‍රමාණය බද්ද වශයෙන් ගෙවිය යුතුය. මෙය විවිධ පරිපාලන දිස්ත්‍රික්ක සම්බන්ධයෙන් හෝ එකම පරිපාලන දිස්ත්‍රික්කයේ විවිධ කොටස් සම්බන්ධයෙන් වෙනස් විය හැක.

2000 - එක් එක් කුඹුරු අක්කරයකින් වී බුසල් දහයකට නොඅඩු ගණනක් හෝ මුළු අස්වැන්නෙන් පනත යටතේ නියමිත අය කිරීමේ ප්‍රමාණය අඩු කළ විට ඉතිරි කොටසින් 1/4 පංගුවකට නොඅඩු කොටසක් හෝ යන දෙකෙන් වඩා වැඩි ප්‍රමාණය එක් එක් කන්නය සඳහා ගෙවිය යුතු බද්ද වේ. මෙම බද්ද විවිධ පරිපාලන දිස්ත්‍රික්ක සම්න්ධයෙන් හෝ පරිපාලන දිස්ත්‍රික්කයක විවිධ කොටස් සම්බන්ධයෙන් වෙනස් විය හැක.

2010 - එක් කුඹුරු අක්කරයකින් වී බුසල් 10කට නොඅඩු ගණනක් හෝ කුඹුරේ එක් අක්කරයකින් ලබා ගන්නා වී බුසල් ගණන මත ගෙවිය යුතු ප්‍රවේණිය ගණනය කරනු ලැබේ. එක් අක්කරයකින් බුසල් 10ට නොඅඩු ප්‍රමාණය හෝ මුළු අස්වැන්නෙන් 1/4කට නොඅඩු ප්‍රමාණය යන දෙකෙන් වැඩි කොටස ප්‍රවේණිය ලෙස ගෙවිය යුතුය.

ප්‍රවේණිය ගෙවීම අක්කරයකට බුසල් 14ක් (මහා වාරිමාර්ග) සහ සුළු වාරි ක්‍රම යටතේ බුසල් 12ක් වශයෙන් දැනට ක්‍රියාත්මක වන ආකාරයටම පැවතිය යුතුය යන්න, අද ගොවීන් සියළු දෙනාගේම මතයයි. අද ගොවීන්ගේ අදහස වූයේ මුළු අස්වැන්නෙන් 1/4ක් ගෙවීම ගැටලු මතු කරවන්නක් බවයි. මෙම ක්‍රමය හේතුවෙන් අස්වනු වංචා කිරීමට ඉඩකඩ ලැබෙන බව ඔවුහු දක්වති. මෙය ඉඩම් හිමියාත්, අද ගොවියාත් අතර විශ්වාසය පළුදු වීමටත් සුහදතාවය නැති වීමටත් හේතු වේ. එසේම නිෂ්පාදන වියදම් අධික වීම නිසා ද ඉඩම් හිමියාට ප්‍රවේණිය ලෙස 1/4ක් ගෙවීම අවශ්‍ය නොවේය යන්න හම්බන්තොට හා අනුරාධපුර දිස්ත්‍රික්කවල ගොවීන්ගේ අදහස විය. ඉඩම් හිමියන්ගේ අදහස වූයේ වර්තමානයේ අස්වනු වැඩියෙන් ලැබෙන බැවින් එහි ප්‍රතිලාභ ඉඩම් හිමියාටද ලැබිය යුතු බවයි. අද ගොවි ක්‍රමය දිගටම පවත්වා ගෙන යාමට නම් අස්වනු වැඩි වීම සලකා බලා ඉඩම් හිමියාට ගෙවන ප්‍රවේණිය වැඩි කළ යුතු බව ඉඩම් හිමියන්ගේ අදහසයි.

ගෙවන ප්‍රවේණිය එක් එක් දිස්ත්‍රික්කයේ විවිධ ප්‍රදේශ අනුව තීරණය කළ යුතු අතර, මෙය කන්නයෙන් කන්නයට වෙනස් නොවන නිශ්චිත ප්‍රවේණියක් විය යුතුය යන්න නිලධාරීන්ගේ මතය විය.

ඉහත කරුණු සියල්ල සලකා බලා ශ්‍රී ලංකාවේ විවිධ දිස්ත්‍රික්කවල වී වගාවේ අස්වනු ඒකාකාරී ස්වභාවයක් නොගන්නා බැවින් එක් එක් දිස්ත්‍රික්කවල විවිධ ප්‍රදේශවල වර්තමාන සාමාන්‍ය වී අස්වැන්න ගණනය කර ඒ අනුව එක් එක් දිස්ත්‍රික්කයේ ප්‍රවේණිය ගණනය කිරීම වඩා උචිත වේ. ඒ අනුව ගොවිජන කොමසාරිස්වරයා විසින් හම්බන්තොට වැනි ඉහළ අස්වනු ලැබෙන දිස්ත්‍රික්කයක දී ඉහළ ප්‍රවේණියක් ද අඩු අස්වනු ලැබෙන දිස්ත්‍රික්කයකදී අඩු ප්‍රවේණියක් ද ගැසට් මගින් දැනුම් දිය යුතුය.

ප්‍රවේණිය ගෙවීම පැහැර හැරීම බද්ද ගෙවිය යුතු කාල සීමාව සහ බද්ද හිඟ වීමට පටන් ගැනීම. හිඟ බද්ද වෙනුවෙන් පොලිය ගෙවීම

17 1958 – යම් කන්නයකට ගෙවිය යුතු බද්ද අස්වැන්න ලබා ගැනීමෙන් අනතුරුව 30 වන දිනයේ හෝ ඊට පෙර ගෙවිය යුතුය. එසේ නොවුන හොත් 30 වන දිනයට පසු එන පළමු දිනයේ පටන් බද්ද හිඟ වීම ඇරඹේ.

1979- 1958 පරිදිම වේ

2000 - අස්වැන්න ලබා ගැනීමෙන් අනතුරුව 15 දිනයේ හෝ ඊට පෙර කමතේදී බද්ද ගෙවිය යුතු අතර එසේ නොගෙවුව හොත් 15 දිනයට පසු පළමු දිනයේ සිට බද්ද හිඟ වීමට පටන් ගනී.

2010 - අස්වැන්න නෙළා ගැනීමෙන් අනතුරුව 13 දිනයේ හෝ ඊට පෙර කමතේදී බද්ද ගෙවිය යුතු අතර එසේ නොගෙවුව හොත් 13 දිනට පසු පළමු දිනයේ සිට බද්ද හිඟ වීමට පටන් ගනී.

කම්කරුවන් හා යන්ත්‍රෝපකරණ සොයා ගැනීමට අපහසු වීම ආදී හේතු නිසා ප්‍රවේණිය ගෙවීම සඳහා දින 13ක් වෙනුවට දින 30ක සීමාවක් ඇති කළ යුතුය යන්න අඳ ගොවීන්ගේ අදහස විය. අස්වැන්න නෙළා දින 13ක් ඇතුළත ප්‍රවේණිය ගෙවිය යුතුය යන්නත් දින 13 පසු වී පළමුවන දිනයේ සිට එය හිඟයක් සේ සැලකීමත් සාධාරණය. එයට හේතුව නීත්‍යානුකූල අඳ ක්‍රමය යටතේ වගා කරන කුඹුරු ඉඩම් බොහොමයක් අක්කර 5 හෝ ඊට වැඩි විශාල ඒවා නොවීමය. ඇතැම් දිස්ත්‍රික්කවල අක්කර 10 අඩු කුඹුරු ඉඩම්ද නීත්‍යානුකූල අඳ ක්‍රමය යටතේ වගා කරනු ලැබේ. එවැනි කුඹුරු හිමියන්ගේ පවුල්වල ආහාර අවශ්‍යතාවය සඳහා වී ලැබෙන්නේ මෙම එකම අඳ කුඹුරෙන් පමණි. එම නිසා අස්වැන්න නෙළා ගැනීමෙන් අනතුරුව 13 වන දිනයේ හෝ ඊට පෙර කමතේදීම අඳ ප්‍රවේණිය ගෙවීමේ නියමය සාධාරණය. ඉඩම් හිමියන් සියළු දෙනාම උසස් ආර්ථික මට්ටමක සිටින පුද්ගලයන් නොවන අතර ඔවුන් ද තම පවුලේ ආහාර අවශ්‍යතාවයන් සපුරාගන්නා එකම මාර්ගය මෙම අඳ කුඹුරෙන් ලැබෙන ප්‍රවේණිය විය හැකිය.

2010 යෝජිත පනතේ 26 (2) වගන්තියෙන් දැක්වෙන්නේ අඳ ගොවියා විසින් වගා කාල දෙකක් හෝ ඊට වැඩි ප්‍රමාණයක් සිය උවමනාවෙන්ම අතපසු කරනු ලැබීම නිසා වගාවේ අස්වැන්න දිස්ත්‍රික්කයේ සාමාන්‍ය අස්වැන්නට වඩා අඩු වී ඇතැයි ඉඩම් හිමියා කොමසාරිස් වෙත දැනුම් දෙන්නේ නම් ඒ අනුව කොමසාරිස්වරයා විසින් පරීක්ෂණ නිලධාරියෙකු මගින් පරීක්ෂණයක් පැවැත්විය හැකිය යන්නයි. එසේ අකාර්යක්ෂමතාවය අනාවරණය වුව හොත් අඳ ගොවියා අදාළ කුඹුරින් ඉවත් කිරීමට ඉඩකඩ සැලසේ. අඳ ගොවීන් කාර්යක්ෂම ලෙස කුඹුර වගා නොකිරීම නිසා ප්‍රශස්ථ අස්වැන්නක් ලබා ගැනීමට නොහැකි වන අවස්ථා ක්ෂේත්‍රයේදී අනාවරණය විය. මෙය අඳ ගොවියාගේ පාර්ශවයෙන් වන වරදක් බැවින් එවැන්නක් වරදක් සේ දැකීමටත් ඒවා දිගින් දිගටම සිදුවීම ඔවුන් අඳ ගොවිකමින් පහ කිරීමට තරම් වරදක් බව සිතීමටත් අඳ ගොවීන් සූදානම් නැත. එහෙත් අඳ කුඹුරේ අස්වැන්න දිස්ත්‍රික්කයේ සාමාන්‍ය අස්වැන්නට සමානව පැවතිය යුතු අතර එලෙස නොමැති අවස්ථාවලදී ඉඩම් හිමියා විසින් කොමසාරිස් ජනරාල්වරයා වෙත පැමිණිලි කරනු ලැබුව හොත් ඒ පිළිබඳ පරීක්ෂණයක් පැවැත්වීමෙන් පසු අඳ ගොවියා අඳ කුඹුරින් ඉවත් කිරීමට ඉඩකඩ තිබීම සාධාරණ වේ. ප්‍රායෝගික නිරීක්ෂණ අනුව පෙනී යන්නේ ඇතැම් අඳ ගොවීන්

සැලකිල්ලකින් කුඹුරු වගා නොකරන අතර ලැබෙන අස්වනු අනුව ඊට අදාළ ප්‍රවේණිය ඉඩම් හිමියාට ගෙවන බවය. මෙය මුළු අස්වැන්නෙන් 1/4ක ප්‍රවේණිය ලබා ගන්නා ඉඩම් හිමියාට ඉතා අවාසිදායකය. එම නිසා අඳ ගොවියා විසින් ඉතා කාර්යක්ෂම ලෙස අඳ කුඹුර වගා කර ඉහළ අස්වනු නෙළා ඊට සාපේක්ෂ ඉහළ ප්‍රවේණියක් ඉඩම් හිමියාට ගෙවීමේ ක්‍රමයක් පැවතිය යුතුය. එය ඉඩම් හිමියාට, අඳ ගොවියාට මෙන්ම රටේ ජාතික නිෂ්පාදනයටද යහපත් අයුරින් බලපායි. ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුවේ ප්‍රධාන අභිප්‍රාය වනුයේ කෘෂිකාර්මික ඉඩම් ඉහළම කාර්යක්ෂමතාවය යටතේ වගා කිරීමට ගොවීන් පෙළඹවීම හා ඒ මගින් ජාතික නිෂ්පාදනය වර්ධනය කරලීමයි. අඳ ගොවි පනතේ පරමාර්ථය විය යුත්තේද අඳ ගොවියා ආරක්ෂා කරන අතර ඉඩම් හිමියා ද තෘප්තිමත් වන අයුරින් උසස් ප්‍රවේණියක් ලබා දීමයි. ඒ සඳහා වූ යෝජනා අඳ ගොවි පනතට ඇතුළත් වීම කාලීන අවශ්‍යතාවයකි.

## 5.2 වෙනත් යෝජනා

01. 2000 පනත අනුව මෙතෙක් අඳ ගොවිතැනින් නෙරපා හරින ලද ගොවීන්ට කුමක් සිදු වේද යන්න මෙම නව පනත් කෙටුම්පත තුළ සඳහන් නොවන නිසා නව පනත අතීතයට බලපාන පරිදි ක්‍රියාත්මක කළ යුතුය යන්න අඳ ගොවීන්ගේ අදහස විය.

02. 2000 පනත අනුව, මෙතෙක් අඳ ගොවිතැනින් නෙරපා ලූ අයට වන්දියක් ලබා දිය යුතුය.

03. ගොවිජන සංවර්ධන සභාව තුළ ඉඩම් හිමි නිත්‍ය ප්‍රතිශතයක් සිටිය යුතුය. ගොවිජන සංවිධාන තුළ ද ඉඩම් හිමියන්ගේ යම් ප්‍රතිශතයක් සිටිය යුතුය.

04. හම්බන්තොට, අනුරාධපුරය වැනි වී අස්වැන්නේ ඵලදායිතාවය ඉහළ දිස්ත්‍රික්කවල අඳ ගොවීහු එම අඳ කුඹුරු එක් කන්නයකදී අක්කරයට බුසල් 25, 30 වැනි වැඩි බදු යටතේ වෙනත් පුද්ගලයෙකුට වගා කිරීමට පවරා දෙති. මෙය අතුරු බදු දීම නමින් හැඳින්වේ. මෙම අතුරු බදු දීම කුඹුරු පනතට පටහැනිය. අතුරු බදු ගත් පුද්ගලයින් විසින් ඇළ වේළි ශුද්ධ කිරීම ආදී කටයුතු කරනු නොලැබේ. එම නිසා අතුරු බදු ගන්නා පුද්ගලයන් විසින් පොදු දේපල ආරක්ෂා කරනු ලැබීමක් සිදු නොවේ. එම නිසා අතුරු බදු දීම තහනම් කළ යුතුය.

05. ඉඩම් බැංකු පිහිටුවා සාධාරණ ණය ක්‍රමයක් ඇති කර අඳ ගොවීන්ට තමන් වගා කරන ඉඩම මිල දී ගැනීම සඳහා අවස්ථාව ලබාදිය යුතුය.

06. වර්තමානය වන විට රැකියා විරහිත දරුවන් විශාල සංඛ්‍යාවක් සිටින නිසාත් වෙනත් රැකියා සුලභ නොවීම නිසාත්, එම අඳ ගොවීන්ගේ දරුවන්ට අඛණ්ඩව අඳ ගොවිතැන කිරීම සඳහා ඉඩම උරුම විය යුතුය.

07. යම් අඳ ගොවියෙකු විසින් තමන් වගා කරමින් සිටිනු ලබන කුඹුරක් යම්කිසි අසනීප තත්ත්වයක් නිසා වගා කිරීමට නොහැකි නම් හෝ පවුලේ වෙනත් කෙනෙක් ඒ සඳහා යෙදවිය නොහැකි නම්, එම හේතු දක්වා අදාළ කන්නයට පමණක් එම කුඹුර වගා කරන මෙන් ඉඩම් හිමියාට ලිඛිතව දැනුම් දීමක් කරනු ලැබිය යුතුය.

08. වර්ෂ 2000 අංක 46 දරණ පනත මගින් ගොවිජන සංවර්ධන කොමසාරිස් සතු බලතල විමධ්‍යගත කර ඇත. පනතේ 38 වගන්තිය මගින් දිස්ත්‍රික්කයේ කොමසාරිස්, ගොවිජන සංවර්ධන නිලධාරීන් හා කෘෂි පර්යේෂණ නිෂ්පාදන සහකාරවරුන්ට වැඩි බලතල ලබාදිය යුතුය. අඳ කුඹුරු සම්බන්ධයෙන් ක්ෂණික පියවර ගැනීමට ගම් මට්ටමේ නිලධාරීන්ට බලය ලබාදිය යුතුය (උදා. පාවර ඇරෙන විට, ඇළ මාර්ග අවහිර වීම්, වක්කඩ කැඩී තිබීම).

09. අඳ ගොවීන් අකාර්යක්ෂම ලෙස කුඹුරු වගා කිරීමට එරෙහි වීමට 2000 පනත මගින් බලතල ඇති නමුත් එය වර්තමානයේ බලාත්මක නොවේ. මෙවැනි ඉඩම් අසන්තක කර වසර 10ක පමණ කාලයක් සඳහා ගොවි සංවිධානයට හෝ වෙනත් පුද්ගලයෙකුට වගා කිරීමට බලය දිය යුතුය. අංක 4/2009 චක්‍රලේඛය අනුව එය ක්‍රියාත්මක කිරීමට පියවර ගෙන ඇත. නමුත් මෙම නීතිය තදින් ක්‍රියාත්මක කරවීමට වග බලා ගත යුතුය.

10. අඛණ්ඩව අවුරුදු 10-20 වැනි කාලයක් කුඹුරු වගා කළ බොහෝ අඳ ගොවීන්ගේ නම් ලේඛනගත වී නැත. මෙවැනි කුඹුරක අඳ ගොවි අයිතිය අදාළ ගොවියාට පවරා දීමට කටයුතු කළ යුතුය.

11. ආගමික ස්ථානවලට අදාළ අඳ ගොවීන් විසින් ප්‍රවේණිය ලබාදීම නිසි පරිදි සිදු නොවේ. මේ සඳහා අදාළ නීතිරීති දැඩි කළ යුතුය.

12. 2000 පනත නිසා ගොඩගැසී ඇති නඩු විසඳීමට ගොවිජන විනිශ්චය සභා පිහිටුවීමට හැකි ඉක්මනින් ක්‍රියා කළ යුතුය.

13. කට්ටි මාරු සහ තට්ටුමාරු කුඹුරු නිසි පරිදි කාර්යක්ෂමව වගා කිරීමට එහි අයිතිකරුවෝ ක්‍රියා නොකරති. එම නිසා එම කුඹුරුවල අයිතිය නිශ්චිත කළ යුතුය.

14. අයාලේ යන හරකුන් වැනි සතුන් ඇති කරන අය වෙනුවෙන් (කිරි ගොවීන්ට) වෙනමම ඉඩම් කට්ටි රජයෙන් හෝ වෙනත් ක්‍රමයකින් ලබා දිය යුතුය. අයාලේ යන සතුන් වෙනුවෙන් දඩ ගැසීම වෙනුවට අදාළ කිරි ගොවීන්ගෙන්- බද්දක් අය කිරීම, නිශ්චිත කොම්පෝස්ට් පොහොර ප්‍රමාණයක් ගොවි සංවිධානයට ලබා දීම සඳහා එම පුද්ගලයාට නියෝග කිරීම ආදිය අවශ්‍ය වේ.

15. කුඹුරුවල වී වගාවට අහිතකර ලියැද්දක් දෙකක් තිබෙන ගොවීන්ට එම කුඹුරුවල එළවළු, අර්ධ වාර්ෂික බෝග ආදිය වගා කිරීම දිරිගැන්වීම මගින් ජාතික නිෂ්පාදනයට දක්වන දායකත්වය වැඩි කළ යුතුය. අද පවතින නීතිරීති අනුව එවැනි ඉඩම් තීරණය කිරීමට, ඒ සඳහා අවසර ලබා ගැනීමට දීර්ඝ කාලයක් ගත වන බැවින් එම තීරණ ගැනීමේ බලය දිස්ත්‍රික්කයේ ඉඩම් කොමසාරිස්ට ලබා දිය යුතුය.

16. ගොවිජන සංවර්ධන පනතේ වගන්ති පිළිබඳ ගොවීන් දැනුවත් කළ යුතු අතර මෙය පුවත්පත් දැන්වීම් ආදිය මගින් ප්‍රසිද්ධ කළ යුතුය.

17 කන්න රැස්වීම්වලදී ගනු ලබන තීරණ නිසි පරිදි ක්‍රියාත්මක කිරීමට පියවර ගත යුතුය. මෙය ක්‍රියාත්මක කිරීමට හැකියාව ඇත්තේ අදාළ ප්‍රදේශවල ගොවි සංවිධානවලටය. මහා වාරිමාර්ග බල ප්‍රදේශවල වාරිමාර්ග කළමනාකරණ අංශය විසින් ගොවි සංවිධානවලට පවරා ඇති බලතල නිසි පරිදි ක්‍රියාත්මක කළ යුතුය. එමගින් කන්න රැස්වීම්වලදී ගන්නා ලද තීරණ නිසි පරිදි ක්‍රියාත්මක කිරීමට පුළුවන.

18. ගොවිතැනෙහි ඇති සාරධර්ම, අඳ ගොවියා අතර ඇති සුහදත්වය, අන්‍යෝන්‍ය අවබෝධය කාලීනව නැවතත් ඇති කිරීම අවශ්‍ය වේ.

19. ගොවිජන සංවර්ධන මධ්‍යස්ථානවල අඳ ගොවි නාම ලේඛන දීර්ඝ කාලයක් තිස්සේ යාවත්කාලීන කර නැත. අඳ ගොවි නාම ලේඛනවල ඇති අඳ ගොවීන්ගේ නම් සහ අඳ කුඹුරුවල ප්‍රමාණයන් නිවැරදි නැති බව ක්ෂේත්‍රයේදී නිරීක්ෂණය විය. එම නිසා අඳ ගොවීහු විවිධ ගැටළුවලට මුහුණ දී සිටිති. අඳ ගොවි නාම ලේඛන මෙන්ම එම ඉඩම්වල නිවැරදි ප්‍රමාණයන්ද යාවත්කාලීන කළ යුතුය.

20. ගොවි සංවිධානවලට පනතින් ලැබී ඇති බලතල ක්‍රියාත්මක කරන්නේ නැති බව පෙනේ. අසල්වැසිකම, මිත්‍රත්වය, ඥාතිකම, නඩු පැවරීම සඳහා ස්වේච්ඡා නායකයකු වශයෙන් ඇති අකමැත්ත යන කරුණු මේ සඳහා ගොවි සංවිධානවලට බලපා ඇති බව පෙනේ. වර්ෂ 2000 ගොවිජන සංවර්ධන පනතේ ගොවි සංවිධාන විසින් කරනු ලැබිය යුතු යැයි දක්වා ඇති විධිවිධාන ක්‍රියාත්මක කිරීමට ගොවි සංවිධාන පෙළඹවීම සඳහා එම විධිවිධාන පිළිබඳ අවබෝධයක් ලබාදීමේ වැඩසටහන් දියත් කළ යුත්තේය.

## හයවැනි පරිච්ඡේදය

# නිගමන හා නිර්දේශ

### 6.1 හැඳින්වීම

අද ගොවීන් හා ඉඩම් හිමියන් පිළිබඳව සිදුකරන ලද විමර්ශනය මගින් මෙම ක්ෂේත්‍රයේ බොහෝ කරුණු පිළිබඳව අනාවරණය කරගැනීමට හැකි විය. ඒ ආශ්‍රයෙන් බැස ගත හැකි නිගමන හා නිර්දේශ මෙම පරිච්ඡේදය මගින් ඉදිරිපත් කරනු ලැබේ.

### 6.2 නිගමන

සමීක්ෂණය මගින් පැහැදිලි වුයේ අඳ ගොවීන් අතරින් බහුතරයක් තරුණ වයස ඉක්මවා සිටින අය බවය. එසේම ඉඩම් හිමියන් බහුතරයක් ද අවුරුදු 55 ඉක්මවූ අය වෙති. මේ අනුව පෙනී යන කරුණක් වනුයේ ගොවිතැනේ නිරත වීමට තරුණ පරම්පරාවේ ඇති නැඹුරුව අඩු වී ඇති බවකි. අධ්‍යාපන මට්ටම පිළිබඳ සැලකීමේදී අඳ ගොවීන්ගෙන් බහුතරයක් ද්විතියික අධ්‍යාපනය ලබා තිබූ බව හෙළි වු අතර සමීක්ෂණයට ලක් කළ ඉඩම් හිමියන් සියලු දෙනාත් ද්විතියික අධ්‍යාපනය ලබා තිබූ බව පැහැදිලි විය. මේ අනුව පසුගිය අඩ සියවසක කාලයේ දී ලංකාවේ අධ්‍යාපන ක්‍රමය ග්‍රාමීය ජනතාව වෙතද වඩාත් හොඳින් ව්‍යාප්ත වී ඇති බව පැහැදිලි වන අතර අනෙකුත් ආසියාතික රටවල් සමග සන්සන්දනය කිරීමේදී ගොවීන්ගෙන් විශාල සංඛ්‍යාවක් ඉහළ සාක්ෂරතා මට්ටමක් ලබා ඇති බව පෙන්නුම් වේ. එම නිසා නිසි තාක්ෂණික දැනුම හා ගොවිතැනේදී භාවිතා කළ යුතු නූතන ක්‍රම ශිල්ප පිළිබඳව වඩාත් හොඳ අවබෝධයක් ගොවීන් සතු බව සිතිය හැක. මේ අනුව වර්තමාන ගොවීන් වඩාත් අවබෝධයකින් ක්‍රියා කරන පිරිසක් බව හැඟී යයි.

මෙම සමීක්ෂණය මගින් පැහැදිලි වන තවත් කරුණක් වනුයේ, අඳ ගොවීන් අතරින් බහුතරයකගේ ප්‍රධාන ජීවනෝපාය ගොවිතැන වන බවයි. කෙසේ වුවද 23%ක පමණ ප්‍රතිශතයක් ප්‍රධාන ජීවනෝපාය ලෙස රජයේ, පෞද්ගලික අංශයේ හෝ වෙනත් රැකියා මාර්ගවල ද නිරත වෙති. අඳ ගොවීන් අතරින් යම් ප්‍රතිශතයක් ජීවනෝපාය ලෙස වෙනත් රැකියා මාර්ගවල යෙදීම හේතුවෙන් ගොවිතැන සඳහා යෙදවීමට සිදුවන කාලය අඩු වීමක් සිදු වේ. මෙවිට අඳ ගොවියා තම අඳ අයිතිවාසිකම් ආරක්ෂා කිරීම සඳහා කෙසේ හෝ කුඹුර වැපිරීම අවශ්‍ය වන හෙයින් වෙනත් කුළී ගොවියෙකු හෝ අතුරු අඳ ගොවීන් හෝ ඒ සඳහා යොදා ගනියි. මෙවැනි ක්‍රම නිසා කුඹුරෙන් ලබා ගත හැකි ඵලදාව අඩු විය හැකි අතර නිෂ්පාදනය වැඩි කිරීම සඳහා අඳ ගොවියා තම ශ්‍රමය කුඹුර වෙනුවෙන් පූර්ණකාලීනව කැප කිරීම අත්‍යවශ්‍ය වේ. නමුත් ඇතැම් විට අඳ ගොවීන්ට අඳ කුඹුරෙන් ලැබෙන ආදායම ජීවත්වීම සඳහා ප්‍රමාණවත් නොවීම, ප්‍රධාන ජීවනෝපාය ලෙස ගොවිතැනේ නිරත නොවීමට හේතුවක් විය හැක. මේ නිසා රජයක වගකීම විය යුත්තේ මේ පිළිබඳව ගැඹුරින් කරුණු විමසා බලා අඳ ගොවියෙකු ලෙස පූර්ණකාලීනව කටයුතු කරන අයගේ ජීවන තත්ත්වය ඉහළ නංවාලීම සඳහා අවශ්‍ය පරිදි කටයුතු කිරීමයි. ඉඩම් හිමියන් අතරින් බහුතරයකගේ ද ප්‍රධාන ජීවන මාර්ගය වනුයේ ගොවිතැනයි. මේ නිසා

වර්තමානයේ දී ගොවිතැන ලාභදායී රැකියාවක් බැවින් තමන් විසින් අතීතයේ දී අඳයට වගා කිරීම සඳහා අඳ ගොවීන්ට ලබා දී තිබූ ඉඩම් නැවත තමන් විසින්ම වගා කිරීමට ඉඩම් හිමියෝ කැමැත්තක් දක්වති. මේ අනුව පවතින පනත අනුව අඳ ගොවීන් මිය ගිය පසු අඳ උරුමය ඉදිරියට නොයාම ඉඩම් හිමියන්ට විශාල වාසියක් වී තිබේ. අඳ ගොවීන් හා ඉඩම් හිමියන් යන දෙපිරිසෙන් ම ලද තොරතුරු අනුව පැහැදිලි වන්නේ එක් ඉඩම් හිමියෙකු යටතේ වගා කරන අඳ ගොවීන් ප්‍රමාණය සාපේක්ෂව අඩු බවයි. අඳ ගොවීන් කීප දෙනෙකු සිටින ඉඩම් හිමියන් ප්‍රමාණය ඉතා අඩු සංඛ්‍යාවකි. මේ අනුව සමීක්ෂණයට ලක් කළ අඳ ගොවීන් අතරින් බහුතරයක් දුප්පත් අය බව පැහැදිලි වේ. ඔවුන් අතරින් බහුතරයක් අඳ ගොවිතැන උරුමයෙන් ලබා ඇත. තම දෙමව්පියන්ගෙන් පසුව කලින් පැවති අඳ ගොවි පනත් අනුව දූ දරුවන්ට අඳය උරුම වී ඇත. මෙම පසුබිම තුළ එම ගොවි පවුල්වලට අඩසිය වසක කාලය තුළම අඳ ගොවි ක්‍රමයෙන් ඉහළට යාමට අවස්ථාවක් නොලැබී තිබීම ශ්‍රී ලංකාවේ අඳ ගොවීන්ගේ ශෝචනීය තත්ත්වය පෙන්නුම් කරයි. පවතින පනත අනුව අඳ ගොවිතැන ඉදිරි පරම්පරාවට හිමි නොවන තත්ත්වයක් තුළ මෙම අඳ ගොවීන්ගේ අනාගතය අවිනිශ්චිත වී තිබේ. සමීක්ෂණයට ලක් කළ අඳ ගොවීන්ගෙන් හා ඉඩම් හිමියන්ගෙන් ලද තොරතුරු අනුව පැහැදිලි වනුයේ ප්‍රධාන වශයෙන්ම හම්බන්තොට හා අනුරාධපුර යන දිස්ත්‍රික්ක දෙක තුළ අඳ ගොවීන් හා ඉඩම් හිමියන් අතර ඥාති මිත්‍ර සම්බන්ධතාවය අඩු බවයි. කෙසේ වුව ද මාතර දිස්ත්‍රික්කය තුළ බහුතරයක් අඳ ගොවීන් විසින් වගා කරනු ලබන ඉඩම් ඔවුන් ලබා ගෙන ඇත්තේ තමාට සමීප හිතවතෙකුගෙන් හෝ ඥාතියෙකුගෙනි. සමීක්ෂණය මගින් පැහැදිලි වනුයේ ශ්‍රී ලංකාවේ විවිධ ප්‍රදේශවල විවිධ ප්‍රවේණි ගෙවීම් ක්‍රම පැවතුන ද හම්බන්තොට හා අනුරාධපුර දිස්ත්‍රික්කවල අඳ ගොවීන් ප්‍රවේණිය ලෙස ඉඩම් හිමියාට නිශ්චිත බුසල් ප්‍රමාණයක් (එනම් කුඹුරු අක්කරයකට ලැබෙන අස්වැන්නෙන් බුසල් 12ක් හෝ 14ක් වැනි) ගෙවන බවත් සාපේක්ෂව ඉහළ අස්වැන්නක් ලැබීම මේ ක්‍රමයට පදනම් වී ඇති බවත්ය. කෙසේ වුව ද සාපේක්ෂව කුඩා කුඹුරු ඇති මාතර දිස්ත්‍රික්කය තුළ අස්වැන්න ද අඩු නිසා එම අඳ ගොවීන් ප්‍රවේණිය ලෙස ඉඩම් හිමියාට ගෙවනුයේ මුළු අස්වැන්නෙන් හතරෙන් එකක ප්‍රමාණයකි. පවතින පනත අනුව ඉඩම් හිමියාට ගෙවිය යුතු ප්‍රවේණිය ලෙස නියම කර ඇත්තේ අක්කරයට බුසල් 10ක් හෝ මුළු අස්වැන්නෙන් 1/4ක් යන දෙකෙන් වැඩි ප්‍රමාණය වුවද ඒ ඒ ප්‍රදේශයේ අතීතයේ සිටම පැවති සම්මත ප්‍රවේණි ගෙවීමේ ක්‍රම තවදුරටත් ක්‍රියාත්මක වන බව මෙහිදී පැහැදිලි වේ. කෙසේ වුවද ඉඩම් හිමියන් පනතේ නීතිරීති පිළිබඳව දැනුවත් වීමත් සමග අනුරාධපුර හා හම්බන්තොට දිස්ත්‍රික්කවලද මුළු අස්වැන්නෙන් 1/4ක් (එනම් බුසල් 12ක් හෝ 14ක් යන්නට වැඩි ප්‍රමාණයකි) ඉල්ලීම වර්තමානයේ දක්නට ලැබේ.

